# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,513 — 1965 සැප්තැම්බර් 24 වැනි සිකුරාද — 1965.9.24

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II) වැනි ඡේදය--පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1263 | තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... | 1300 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 1271 සහ 1301 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 1286 | රට බිම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | 1300 |
| බඩුබාහිරාදිය විකිණීම ... ... ... | 1299 | විවිධ දැන්වීම් ... ... ... | — |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස්පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩදෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටමත් රාජ්‍ය සේවාවෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, යථා යෝග්‍ය පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවල පත් කරනු ලබන නව ප්‍රවේශකයන්ගේ ආධුනික/පරීක්ෂා කාලය අවුරුදු තුනක් වන්නේ ය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන් ම වර්ෂ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පනවා ඇති ව්‍යවස්ථා වලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථා වලට ද අනුකූලව නව ප්‍රවේශකයන් ක්‍රියා කළ යුතුය.

(iii) (ඒ) ඔවුන් තම ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයයෙන් ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(බී) ආධුනික/පරීක්ෂා කාලය ගතවී අවසන් වූ විට සේවයෙහි ස්ථිර කරන්නේ වෙනත් කරුණු අතර කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වය තෙක් වර්ග කර ඇති සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් ඔවුන් නියමිත කාලසීමා ඇතුළත සමත්වීම උඩය. නියමිත කාලසීමාව ඇතුළත මෙම ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීමට අපොහොසත් වුවහොත් ඒවා සමත්වන තෙක්, ලැබිය යුතු පඩි වැඩිවීම් නොගෙවා හැරීම එහි ප්‍රතිඵලය වන්නේ ය. තම ආධුනික/පරීක්ෂා කාලය කෙළවර වන විට කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වයේ විභාගයෙන් සමත් නොවන යම් නිලධාරියෙක් වේ නම් ඔහුගේ සේවය කෙළවර කළ හැකි වන්නේ ය.

**සංලක්ෂ්‍යය.**—සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා රාජ්‍ය සේවයට බැඳෙන අය සේවයෙහි ස්ථිර කිරීමට පෙර සිංහල ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත්වීමේ නියමයෙන් නිදහස් වෙති.

(iv) මෙම ධුරයෙහි සේවය ස්ථිර කරන දින සිට අවුරුදු දෙකක් ඇතුළත සිංහල භාෂාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වයේ කාර්යක්ෂමතා කඩඉම පරීක්ෂණයකින් සමත් වීමටද ඔවුන්ට නියම වනු ඇත.

**5. අවශ්‍ය සුදුසුකම්.**—(i) තමා ලාංකිකයකු වූ බවට හැඟෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින් ඉදිරිපත් කළ යුතුය. "ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරමින් ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත්ව සිටීම අඩුම අධ්‍යාපනික සුදුසුකම ලෙස නියමකොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන්නකු

සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලත් සිංහලයකු වෙතොත් ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් සිංහල භාෂාව විෂයයෙන් හෝ ඊට සමාන විෂයයකින් හෝ සාමාර්ථය ලබා තිබිය යුතුය. (වර්ෂ 1961 ජනවාරි 1 වෙනිදාට පෙර සිට රාජ්‍ය සේවයේ යෙදී සිටියාවූද රාජ්‍ය සේවයේ වෙනත් තනතුරු ලබනු කැමැත්තා වූද නිලධාරීන් සම්බන්ධයෙන් මෙම නියමය අදාළ නො වන්නේ ය.)

6. යුද්ධ සේවා අනුග්‍රහය.—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙ තම, සුදුසුකම් ලැබ සිටින්නා වූ ද, මහා රාජිනියන් වහන්සේ ගේ යුද්ධ හමුදාවන්හි යෙදී සිටි සේවාමුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහාජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිට (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස්වූවන් හැර) සෑම කෙනෙකුට මද ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩවා සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබාගැනීම සඳහා පමණක් ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර් 31 වැනි දිනත් යන මෙදතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

7. වෙනත් අවශ්‍ය කරුණු.—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ සවකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. තව ද, තමන්ගේ ඉල්ලුම්පත්‍රයේ දෙවන පිටපතක් ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට පෙර ලැබෙන සේ එම නිලධාරියා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්තැන වෙත කෙළින්ම යැවිය යුතුය. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු එම ඉල්ලුම්කරුවන් (තෝරා ගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූලව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම් ව සිටිත් ද, නැද්ද යි සඳහන් කොට එවිය යුතු ය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක දක්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iii) කිසියම් අපෙක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම්කුම වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණිනම් රාජකාර්යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. සුදුසුකම් ලැබීම සඳහා වැටුප් යන්නෙහි විග්‍රහය.—සුදුසුකම් ලැබීම සඳහා වැටුප් යනුවෙන් අදහස් කරනුයේ මූලික ස්ථිර තනතුරේ වැටුප පමණි. වැඩ බැලීම සඳහා ගෙවන වැටුප් දීමනා ආදිය කිසිවක් ඊට ඇතුළත් නොවේ.

## ලංකා යුධ හමුදාවේ දන්ත නිලධාරි තනතුර

අංක 14,486 හා 1965 අගෝස්තු මස 20 වෙනි දින දරන ගැසට් පත්‍රයේ පළකරන ලද යුධ හමුදාවේ දන්ත නිලධාරි තනතුරට අයැදුම් පත් කැඳවීමේ දිනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අයැදුම් පත් 1965 ඔක්තෝබර් මස 15 වෙනි දින දක්වා දැන් බාර ගන්නවා ඇත.

ජේ. ඩී. සොයිසා,
මේජර්,
හමුදා ආඥපති වෙනුවට.

1965 සැප්තැම්බර් මස 17 දින,
කොළඹ දීය.

9-969—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

## ලංකා විදේශ දූත මණ්ඩලවල ඇබෑර්තු

### ලඝු ලේඛක තනතුරු

ලංකා විදේශ දූත මණ්ඩලවල ලඝුලේඛක තනතුරු සඳහා ස්ථාන මාරුව සහිත ලඝුලේඛක සේවයේ සවකීය පත්වීම්වල ස්ථිර කරනු ලැබූ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අවිවාහක නිලධාරීන්ගේ හෝ කුඩා පවුල් ඇති විවාහකූ නිලධාරීන්ගේ අයදුම්පත් විශේෂයෙන් සලකා බලනු ලැබේ.

2. මෙම තනතුරු පිරවීම සඳහා තෝරාගනු ලබන නිලධාරීන්ට ඔවුන් දැනට දරණ තනතුරට අයත් වැටුපම ලැබෙන අතර ලංකාවේදී ගෙවන ගෙවල්කුලී දීමනාව, ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර දීමනා වෙනුවට විදේශ දීමනාවක් ගෙවනු ඇත. අන්‍ය සේවා කොන්දේසි විදේශ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සලසා ඇති අන්දමටය.

3. මෙම තනතුරු සඳහා තෝරාගනු ලබන නිලධාරීන් විදේශ සේවය සඳහා ශාරීරික වශයෙන් සුදුසුදැයි බලාගනු වස් වෛද්‍ය පරීක්ෂණයකට භාජන විය යුතුය. තවද, හතර අවුරුදු කාලපරිච්ඡේදයක් විදේශයේ සේවය කිරීමට ඔවුන්ට නියම වනු ඇත.

4. අයදුම්පත් පහත දැක්වෙන උපලේඛනයේ ඇති ආකෘති පත්‍රයේ ආකාරයට වියයුතු අතර ඒවා සාමාන්‍ය කාර්ය ලිය මාගීයෙන් ඉදිරිපත් කළයුතුය. තවද, විදේශ සේවය සඳහා අයදුම්කරු සුදුසු බවට හා තෝරාගනු ලැබුවහොත්, දැනට දරණ තනතුරෙන් විහාම් මුදා හැරීමට හැකි බව්ටද අයදුම්කරු දැනට සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගෙන් සටහනක් අයදුම්පත මත විය යුතුය.

5. මීට ඉහතදී මෙම අමාත්‍යාංශයට ඉදිරිපත් කොට ඇති අයදුම් පත් සලකා බලනු නොලැබේ.

6. අයදුම්පත් 1965 ඔක්තෝබර් මස 9 වැනි දින හෝ ඊට ප්‍රථම මෙම අමාත්‍යාංශයට ලැබිය යුතුය.

ඇම්. ජී. වී. පී. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965 සැප්තැම්බර් 9 දින,
කොළඹ 1,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
අමාත්‍යාංශයේදී ය.

### උපලේඛනය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :———.
2. ජාතිය :———.
3. විවාහක, අවිවාහක බව :———.
4. අධ්‍යාපන සුදුසුකම් :———.
5. දැනට ලැබෙන වැටුප :———.
6. උපන් දිනය :———.
7. ලඝුලේඛක සේවයට ඇතුළුවූ දිනය :———.
8. (අ) ලඝුලේඛනය හා (ආ) ටයිප් ගැසීමේ වේගය :———.
9. දැනට කරන රාජකාරියේ සවභාවය :———.
10. සිංහල විෂයයෙහි හා සිංහල යතුරුලිවීමේ දැනට ඇති ප්‍රවීණතාව :———.
11. වෙනත් සුදුසුකම් :———.

9-871—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### අළුත්ගම කාන්තා ගුරු විද්‍යාලයයේ අභ්‍යාසාචාරිනී තනතුර

අළුත්ගම කාන්තා ගුරු විද්‍යාලයයේ අභ්‍යාස ආචාරිනී තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍ර 1965.10.13 දින හෝ එම දිනට පෙර කොම්පඤ්ඤවීදියේ, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගුරු විද්‍යාල ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් භාරගනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය.**—මේ තනතුර සඳහා නියමිත වාර්ෂික වැටුප් ක්‍රම පහත සඳහන් වේ :—

(i) රු. 3,420—4 × 120—8 × 180—2 × 240—රු. 5,820 පුහුණු උපාධිධරයන් සඳහා.

(ii) රු. 3,060—7 × 120—8 × 180—2 × 240—රු. 5,820 උපාධිධරයන් සහ ද්විතීයික ගුරු පුහුණුවක් ලැබ සිටින්නන් සඳහා.

(iii) රු. 1,776—7 × 72—9 × 120—රු. 3,360 ස්වභාෂා ගුරු පුහුණුවක් ලැබ I වෙනි පෙළ පුහුණු ගුරු සහතික පත්‍ර දරන්නන් සඳහා.

3. **අවශ්‍ය අධ්‍යාපන හා අනිත් සුදුසුකම්.**—(i) ඉල්ලුම්කරුවන් තෙවසක ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති පුහුණු උපාධිධරයන් හෝ උපාධියෙන් පසු තෙවසක ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති උපාධිධරයන් හෝ ද්විතීයික ගුරු පුහුණුවක් ලැබ සිටින්නන් පුහුණුවීමෙන් පසු යටත් පිරිසෙයින් පස්වසක් ඉගැන්වීමේ පළපුරුද්දක් ලබා සිටි අය හෝ පුහුණු වීමෙන් පසු පස්වසක ඉගැන්වීමේ පළපුරුද්දක් ලබා සිටින ස්වභාෂා පුහුණු ගුරු සහතිකපත්‍ර I පෙළ දරන්නන් හෝ විය යුතුය. ඉල්ලුම්කරුවන් දෙමළ භාෂාවෙන් මනා සුදුසුකම් ලබා අංක ගණිතය හා මූලික ගණිතය ඉගැන්වීමේ ප්‍රවීණ විය යුතුය.

(ii) 1965.10.13 වැනි දිනට ඉල්ලුම්කරුවන් වයසින් අවුරුදු 25ට අඩු හෝ 50ට වැඩි හෝ නොවිය යුතුය. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව නො යෙදේ.

4. (i) තෝරාගනු ලබන ඉල්ලුම්කරුවන් අළුත්ගම කාන්තා ගුරු විද්‍යාලයට පත්කරනු ලැබේ. පසුව දිවයිනේ ඕනෑම ගුරු විද්‍යාලයකට මාරු කළ හැකිය.

(ii) පාඨශාලා ගුරු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ මෙම තනතුර විශ්‍රාම වැටුප් සහිතය. මෙම තනතුර සඳහා තෝරා ගැනීමට පෙර විශ්‍රාම වැටුප් වාර්තා යටතේ ශික්ෂකයන් වශයෙන් විශ්‍රාම වැටුප් හිමි තනතුරු දරන්නන් පත්කරනු ලැබුවහොත් ඔවුන් මෙම තනතුර දරණ තෙක් මෙම තනතුර විශ්‍රාම සහිත යයි ප්‍රකාශ කරනු ලැබේ.

(iii) මෙහි පහත සඳහන් කරනු ලබන ආදර්ශ ආකෘති පත්‍රයට අනුව ඉල්ලුම් පත්‍ර නියමිත පෝර්මයේ ඉදිරිපත් කළ යුතුය. මෙම කාර්යාලය මගින් ඉල්ලුම්පත්‍ර සපයනු නො ලැබේ. දැන්වීමේ සඳහන් කර ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රය අයදුම්කරුවන් විසින් පිටපත් කර ගත යුතුය.

5. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) ඡේදයේ පටන් ගැනීමේ පළකර ඇති රජයේ සේවයේ තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් යෙදෙන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

අධ්‍යාපන අධ්‍යක්ෂ.

අංකය ගුව්එ 4433
1965.9.14 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී ය.

## ආදර්ශ පෝර්මය

### අළුත්ගම කාන්තා ගුරු විද්‍යාලයේ අභ්‍යාස ආචාරිනී තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය

1. **සම්පූර්ණ නම :**————.
2. ලිපිනය :————.
3. 1965.10.13 දිනට නිවැරදි වයස : අවුරුදු :————. මාස :————. දින :————.
4. ජාතිය හා එය ලත් අන්දම :————.
5. උපන් ස්ථානය :—
   (ඒ) ඉල්ලුම්කරු :————.
   (බී) ඇයගේ පියා :————.
   (සී) ඇයගේ පියාගේ පියා :————.
6. ලබාගත් දිනය සමඟ අධ්‍යාපන සුදුසුකම් :————.
   (ලබා තිබෙන උසස්ම අධ්‍යාපන සහතිකවල පිටපත් ඇමිණිය යුතුය)
7. වෘත්තීය සුදුසුකම් :————.
8. ඉගැන්වීමේ පළපුරුද්ද (මෙහි පහත දක්වන පෝර්මයෙහි විස්තර සඳහන් කරන්න) :—

| පාසැලේ හෝ විද්‍යාලයයේ නම | ඇතුළත් වූ දිනය | අස්වූ දිනය | දැරූ තනතුර | සේවා කාලය අ. මා. දි. | අස්වීමට හේතු |
|---|---|---|---|---|---|
| | | | | | |

එකතුව :

9. දෙමළ භාෂාවෙන් ලබා ඇති සුදුසුකම් :————.
10. චරිත සහතික ලබාගත් අයගේ (ඥාතීන් නොවේ) නම් හා නිලතල—සහතික තුනක පිටපත් (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතුය. රජයේ සේවකයන් සම්බන්ධයෙන් මෙය අනවශ්‍යය ————.
11. වෙනත් සුදුසුකම් :————.

මා විසින් ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් සඳහන් කර තිබෙන බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් මා එයින්ම නුසුදුසු බවට පැමිණෙනවා පමණක් නොව තෝරා ගැනීමෙන් පසු ඒ බව දැනගන්නට ලැබුනහොත් කිසිම වන්දි ගෙවීමක් නොමැතිව රාජකාරියෙන් පහකරනු ලැබමට යටත් බව ද මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

අංකය : ශිෂ්‍ය/521.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය—1966 ජපන් රජයේ ශිෂ්‍යත්ව

පහත දැක්වෙන විෂයයන්හි අධ්‍යාපනය සඳහා ජපන් රජය විසින් පිරිනමන පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව 5 ක් හා පූර්ව උපාධි ශිෂ්‍යත්ව 3 ක් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ :—

විද්‍යාව (ශුද්ධ)

ඉංජිනේරු ශිල්පය

කෘෂිකර්මය

වෙළඳ නාවුක ශිල්පය

ධීවර ශිල්පය

වෛද්‍ය විද්‍යාව

දන්ත වෛද්‍ය විද්‍යාව

භිෂග් විද්‍යාව

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට ඇලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

**සංලක්‍ෂය 1.**—පූර්ව උපාධි ශිෂ්‍යත්ව සඳහා පහත සඳහන් අයගෙන් අයදුම්පත් භාරගනු නොලැබේ :—

(අ) ස්ථිර තනතුරු දරන හා තනතුරෙහි ස්ථිර කරනු ලැබ සිටින රජයේ සේවකයින් ;

(ආ) මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල ස්ථිර තනතුරු දරන හා තනතුරෙහි ස්ථිර කරනු ලැබ සිටින සේවකයින් ;

(ඉ) දැනටමත් ලංකාවේ කිසියම් විශ්ව විද්‍යාලයයක පාඨමාලාවක් අනුගමනය කරන ශිෂ්‍යයින්.

**සංලක්‍ෂය 2.**—පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව සඳහා රජයේ සේවකයන්ගෙන් අයදුම්පත් භාරගනු ලබන්නේ, ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ යම්කිසි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අංක 514 හා 1960.5.16 වැනි දින දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛය අනුව සහතික කරන්නේ නම් පමණය. එසේ කිරීමේදී, එම චක්‍ර ලේඛය යටතේ අවශ්‍ය විස්තරද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.

**සංලක්‍ෂය 3.**—මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින්ගේ අයදුම්පත්, ඒ ඒ ආයතනවල ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි. එවැනි අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී, අයදුම්පතේ 27 වැනි කොටුවේ සහතිකය ආයතන ප්‍රධානීන් ලවා යථා පරිදි සම්පූර්ණ කරවා එවිය යුතුය.

**සංලක්‍ෂය 4.**—එක් අයදුම්කරුවකු විසින් එවිය යුත්තේ එක් අයදුම්පතක් පමණය. ඉල්ලුම් කළ යුත්තේද එක් අධ්‍යයන පාඨමාලාවක් සඳහා පමණය.

2. **ශිෂ්‍යත්ව කාලය.**—පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව කාලය සාමාන්‍යයෙන් අවුරුදු එකහමාරක් හෝ දෙකක් වන අතර, පූර්ව උපාධි ශිෂ්‍යත්ව කාලය අවුරුදු පහ හා හත අතර වන්නේ ය.

එහෙත්, අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවසයට නොපැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදැක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකි වීම නිසා හෝ ජපන් බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේ ය.

3. **සුදුසුකම්.**—අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතුයි :—

(i) ලංකාවේ පුරවැසියන් විය යුතුයි ;

(ii) පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව සඳහා වයස 1966.4.1 දිනට අවුරුදු 35 ට නොවැඩි විය යුතු අතර, පූර්ව උපාධි ශිෂ්‍යත්ව සඳහා වයස 1966.4.1 දිනට අවුරුදු 18 හා 22 අතර විය යුතුය ;

(iii) (අ) **පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව සඳහා**—අනුගමනය කිරීමට අදහස් කරන පශ්චාත් උපාධි පාඨමාලාවට ගැලපෙන, (පිළිගත් විශ්ව විද්‍යාලයක) උපාධියක් තිබිය යුතුයි ;

(ආ) **පූර්ව උපාධි ශිෂ්‍යත්ව සඳහා**—පහත සඳහන් සුදුසුකම් 3 ලබා සිටිය යුතුයි :—

(1) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයේදී හෝ අධ්‍යයන පොදු සහතිකපත්‍ර විභාගයේදී හෝ (දෙකින් කවර එකකදී වූවද එකම වතාවකදී) ඉංග්‍රිසි භාෂාව ඇතුළු විෂයයන් 6 කින් සමත්වී සිටීම ;

(2) අ. පො. ස. (උසස් පෙළ)/උසස් පාඨශාලා සහතික පත්‍ර/විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගයකදී ශුද්ධ ගණිතය සහ රසායන විද්‍යාව සමත්වී සිටීම ;

(3) (i) ශුද්ධ විද්‍යාව හෝ ඉංජිනේරු ශිල්පය සඳහා අයදුම්කරුවන්, අ. පො. ස. (උසස් පෙළ)/උසස් පාඨශාලා සහතික පත්‍ර/විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගයකදී, භෞතික විද්‍යාව සමත්වී සිටීම හෝ,

(ii) සෙසු විෂයයන් 6 න් එකක් සඳහා අයදුම්කරුවන්—අ. පො. ස. (උසස් පෙළ)/උසස් පාඨශාලා සහතික පත්‍ර/විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගයකදී ජීව විද්‍යාව (එසේ නැතිනම් ඒ වෙනුවට උද්භිද විද්‍යාව හා සත්ව විද්‍යාව යන දෙකම) සමත්වී සිටීම.

(iv) ජපන් භාෂාව ඉගෙනීමට කැමැති විය යුතුයි. (ඉගැන්වීමේ මාධ්‍යය ජපන් භාෂාව හෙයිනි).

**සංලක්‍ෂය 1.**—රජය යටතේ හෝ මණ්ඩලයක, සංයුක්ත මණ්ඩලයක, විශ්ව විද්‍යාලයක හෝ රජයෙන් ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනයක නියමිත කාලයක් සේවය කිරීමට ඔප්පුවකින් හෝ ගිවිසුමකින් හෝ බැඳී සිටින අපේක්‍ෂකයන්, ඒ කාල සීමාවේ සේවය සම්පූර්ණ කොට, 1966.4.1 වනවිට, ඔප්පුවෙන් හෝ ගිවිසුමෙන් සම්පූර්ණ වශයෙන් නිදහස්වී ඇත්නම් මිස, මේ ශිෂ්‍යත්ව සඳහා අයදුම්කිරීමට සුදුසු නොවන්නේ ය.

**සංලක්‍ෂය 2.**—එසේම, තාවකාලික තනතුරු දරන හෝ ස්ථිර තනතුරු දරන නමුත් තනතුරේ ස්ථිර කරනු නොලැබූ රජයේ සේවකයන්ද, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් ඉල්ලා අස්වීමට කැමැති නම්, මිස, අයදුම්කිරීමට සුදුසු නොවන්නේ ය. එසේ අස්වීමට කැමැති නම්, ඒ බව අයදුම්පතේ 15(ඊ) කොටුවේ නිශ්චිත වශයෙන් සඳහන් කළ යුතුය.

4. **ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන්.**—ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත් ය :—

(අ) ලංකාවේ සිට ජපානයට යාම සහ අධ්‍යයන සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු ලංකාවට පැමිණීම සඳහා සංචාරක පන්තියේ ගුවන් ගමන් පහසුකම් ;

(ආ) මසකට යෙන් 30,000 බැගින් පෞද්ගලික යැපීම් දීමනාවක් ;

(ඉ) ජපානයට ගොඩබැසීමේදී අවශ්‍ය හදිසි වියදම් සඳහා යෙන් 10,000 ක දීමනාවක් ;

(ඊ) ඉගැන්වීමේ ගාස්තු, විභාග ගාස්තු ආදියෙන් නිදහස් කිරීම ;

(උ) වර්ෂයකට යෙන් 15,000 කට නොවැඩි වනසේ, වෛද්‍ය ප්‍රතිකාර සඳහා නියම වශයෙන් වියදම් කළ මුදලින් භාගයක් ;

(ඌ) වර්ෂයකට යෙන් 25,000 ක උපරිමයකට යටත්ව, ඉගෙනීමේ කටයුතු සඳහා ජපානය තුළ අභ්‍යන්තර ගමන් වියදම් ;

(එ) නේවාසික පහසුකම්.
(යෙන් 1ක් දළ වශයෙන් ශත .0132 ට සමාන වේ).

**සංලක්‍ෂය.**—මේ ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන රජයේ සේවකයන්ට නිවාඩු දීම, අවස්ථාවට වලංගුව පවත්නා භාණ්ඩාගාර හා දෙපාර්තමේන්තු නීති රීතීන්ට යටත් වන්නේ ය.

5. **සම්මුඛ පරීක්‍ෂණය.**—සුදුසුකම් ලත් අයදුම්කරුවන්, නියමිත ස්ථානයක හා නියමිත වේලාවක කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්‍ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම සම්මුඛ පරීක්‍ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්‍ෂණය සඳහා පැමිණෙන විට තමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලිවල මුල් පිටපත් රැගෙන ඒමට සූදානම් වී සිටිය යුතුය.

6. **ලිඛිත පරීක්‍ෂණය.**—පූර්ව උපාධි ශිෂ්‍යත්ව සඳහා සම්මුඛ පරීක්‍ෂණයේදී තෝරාගනු ලබන අපේක්‍ෂකයින්, පහත සඳහන් විෂයයන්හි පැවැත්වෙන ලිඛිත පරීක්‍ෂණයකට පෙනී සිටිය යුතුය.

(අ) ඉංග්‍රීසි හෝ ප්‍රංශ

(ආ) ගණිතය

(ඉ) භෞතික විද්‍යාව හෝ රසායන විද්‍යාව හෝ ජීව විද්‍යාව.

ශිෂ්‍යත්ව සඳහා නාමයෝජනා කරනු ලබන්නේ මෙම විභාගයේදී උසස් ප්‍රවීණත්වයක් දක්වන අපේක්‍ෂකයින් පමණය.

7. **ගිවිසුම.**—තෝරාගනු ලබන අපේක්‍ෂකයන් ජපානය බලා පිටත්ව යාමට පෙර—

(අ) අනෙකුත් කරුණු අතර, නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදාරා සතුටුදායක ලෙස එය සම්පූර්ණ කිරීමට හා ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය වුවහොත්, රජය විසින් නියම කරනු ලබන යම්කිසි කාලසීමාවක් තුළ රජය යටතේ සේවය කිරීමටද ;

(ආ) තමාගේ ශිෂ්‍යත්වයේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව ක්‍රිය කිරීමට නොහැකි වන අවස්ථාවකදී, ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම (එනම්, සම්පූර්ණ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ලංකා රජයට හා ප්‍රදාන අධිකාරීන්ට දරන්නට සිදුවූ සියලුම වියදම් හා රජයේ සේවකයෙක් නම්, ඊට අමතරව වේතනය, දීමනා ආදිය ඇතුළු වියදම්) ලංකා රජයට ආපසු ගෙවීමටද,

පොරොන්දු වන ගිවිසුමකට අත්සන් කළ යුතුය.

8. **වෛද්‍ය පරීක්ෂණය.**—තෝරාගනු ලබන අපේක්ෂකයන් ජපානයේ අධ්‍යයන පාඨමාලාවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවක් ඇති බවට, රජය විසින් පත් කරනු ලබන විශෙෂ වෛද්‍ය මණ්ඩලයක් මගින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි.

9. රජයේ සේවකයන් සම්බන්ධයෙන්, බලාපොරොත්තු වන පුහුණුව ඔවුන් විසින් දැනට දරන තනතුරෙහි වැඩි වේතනයක් හෝ උසස්වීමක් ලැබීමට සුදුසුකමක් නොවන්නේය. සෙසු අය සම්බන්ධයෙන්, ශිෂ්‍යත්වය සම්පූර්ණ කොට ආපසු පැමිණීමෙන් පසු රක්ෂා ලබා දීමට රජය පොරොන්දු නොවන්නේය.

10. මෙම ඉල්ලුම්පත්‍රයෙහි යම්කිසි වැරදි ප්‍රකාශයක් කර ඇති බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු එයින් නුසුදුසු බවට පත්වේ. තෝරාගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

11. තෝරාගනු ලැබූ අපේක්ෂකයකු ශිෂ්‍යත්ව ප්‍රදානය ප්‍රතික්ෂෙප කළහොත්, අවුරුදු දෙකක කාලපරිච්ඡේදයක් ගතවන තුරු, අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා හෝ ඔහු සලකා බලනු නොලැබේ.

12. කිසියම් අපේක්ෂකයකු ලංකා අධිකාරීන් විසින් නාමයෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතිය යුතු බව පැහැදිලි අවබෝධ කටයුතුය. ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, සම්පූර්ණයෙන්ම, නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රදාන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදු වන්නක් හෙයිනි.

13. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබා ගැනීමට හෝ බලපෑවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන්ම එම අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේය.

14. මේ නිවේදනයේ අවශ්‍යතාවන් සියල්ල සෑම ආකාරයෙන්ම සම්පූර්ණ නොකෙරෙන හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂෙප කරනු ලබන්නේය.

15. මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශෙෂ ආකෘතියක පිළියෙළ කළ යුතු අයදුම්පත්, 1965.10.11 වැනි දින පස්වරු 4.30 ට පෙර ලැබෙන සේ, කොළඹ 3, " සිරිමතිපාය ", අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත එවිය යුතුය. ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

16. රජයේ සේවකයින් විසින් එවන අයදුම්පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද, මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්වවිද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින් විසින් එවන අයදුම්පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මගින් ද, එවිය යුතුයි. සේවයෙන් ඉල්ලා අස්වීමට සූදානම් අපේක්ෂකයින් සම්බන්ධයෙන් වුවද මේ අවශ්‍යතාව බලපාන්නේය.

17. සියළුම අයදුම්පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම්පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7 ක් ඇතුළත අයදුම්පත් ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිරලේකම් වෙත වහම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම්කරු ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේ ය.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965 සැප්තැම්බර් මස 18 වැනිදා,
කොළඹ 3, " සිරිමතිපාය ",
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේදී ය.

9–1014—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

අංකය : ශික්‍ෂ/524.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### විදේශීය භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශිෂ්‍යත්වය—ඕස්ට්‍රේලියාව, 1966

විදේශීය භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳව ඕස්ට්‍රේලියාවේ පුහුණුව සඳහා කොළඹ ක්‍රමය යටතේ පිරිනැමෙන ශිෂ්‍යත්ව 6 ක් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දක්වෙන ශ්‍රේණිවල නිලධාරීන් මේ සඳහා අයදුම් කිරීමට යෝග්‍යය :—

(i) 1966.2.1 දිනට පරීක්ෂක සේවයේ අවුරුදු පහකට නො අඩු සේවයක් ඇති උපාධිධර පාඨශාලා පරීක්ෂකවරුන්,

(ii) 1966.2.1 දිනට පරීක්ෂක සේවයේ අවුරුදු පහකට නො අඩු සේවයක් ඇති උපාධි රහිත (ඉංග්‍රීසි ද්විතීය පුහුණු) පාඨශාලා පරීක්ෂකවරුන්,

(iii) (අ) යටත් පිරිසෙයින් ඉන්ටර් හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාවෙන් සාමාර්ථයක් ලබා ඇති හා (ආ) අවුරුදු 10ක අඛණ්ඩ සේවයක් ඇති, පුහුණු උපාධිධර ගුරුවරුන් හෝ උපාධිධර ගුරුවරුන් හෝ ඉංග්‍රීසි ද්විතීය පුහුණු ගුරුවරුන්.

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ පාඨශාලාවල ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳව සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

2. **ශිෂ්‍යත්ව කාලය.**—ශිෂ්‍යත්ව කාලය සාමාන්‍යයෙන් 1966 පෙබරවාරි සිට එක් අධ්‍යයන වර්ෂයක් වන්නේය.

එහෙත් අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නො පැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදැක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකිවීම නිසා හෝ ඕස්ට්‍රේලියානු බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අසවන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේය.

3. **සුදුසුකම්.**—අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතුයි :—

(i) ලංකාවේ පුරවැසියන් විය යුතුයි.

(ii) 1966.2.1 වැනි දිනට වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි.

(iii) මෙම නිවේදනයේ පළවෙනි ඡේදයෙහි (i), (ii) හා (iii) යටතේ දැක්වෙන ශ්‍රේණියකට අයත් නිලධරයකු විය යුතුයි.

(iv) පහත දැක්වෙන මට්ටමකින් ඉංග්‍රීසි භාෂාව සමත්වී ඇති බව ඔප්පු කිරීමට ලියකියවිලි ඉදිරිපත් කළහැකි විය යුතුයි :—

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයේදී සම්මාන සාමාර්ථයක්.

(ආ) ලන්ඩන් මැට්‍රික් හෝ කේම්බ්‍රිජ් සීනියර් හෝ වෙන කිසියම් උසස් විභාගයකින් සාමාර්ථයක්.

**සංලක්‍ෂය 1.**—රජය යටතේ නියමිත කාලයක් සේවය කිරීමට ඔප්පුවකින් හෝ ගිවිසුමකින් හෝ බැඳී සිටින අපෙක්‍ෂකයන්, ඒ කාලසීමාවේ සේවය සම්පූර්ණ කොට 1966.2.1 වන විට, ඔප්පුවෙන් හෝ ගිවිසුමෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී ඇත්නම් මිස, මේ ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට සුදුසු නොවන්නේය.

4. **ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන්.**—ශිෂ්‍යත්ව ප්‍රදානයට ඕස්ට්‍රේලියාවේ කොළඹ ක්‍රම ප්‍රදානයන්ට නියමිත ප්‍රතිලාභයන් ඇතුළත්ය.

**සංලක්‍ෂය.**—මේ ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන නිලධාරීන්ට නිවාඩු දීම, අවස්ථාවට වලංගුව පවත්නා භාණ්ඩාගාර හා දෙපාර්තමේන්තු නීති රීතීන්ට යටත්ව වන්නේය.

5. **සම්මුඛ පරීක්‍ෂණය.**—සුදුසුකම් ලත් අයදුම්කරුවන්, නියමිත ස්ථානයක හා නියමිත වේලාවක කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්‍ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම සම්මුඛ පරීක්‍ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්‍ෂණය සඳහා පැමිණෙන විට තමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලිවල මුල් පිටපත් රැගෙන ඒමට සූදානම් වී සිටිය යුතුය.

6. **ගිවිසුම.**—තෝරාගනු ලබන අපෙක්‍ෂකයන් ඕස්ට්‍රේලියාව බලා පිටත්ව යාමට පෙර—

(අ) අනෙකුත් කරුණු අතර, නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදාරා සතුටුදායක ලෙස එය සම්පූර්ණ කිරීමට හා ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු රජය විසින් නියම කරනු ලබන යම්කිසි කාලසීමාවක් තුළ රජය යටතේ සේවය කිරීමට ද ;

(ආ) තමාගේ ගිවිසුමේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවකදී, ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම (එනම්, සම්පූර්ණ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ලංකා රජයට හා ප්‍රදාන අධිකාරීන්ට දරන්නට සිදුවූ සියලුම වියදම් හා වේතනය, දීමනා ආදිය ඇතුළු වියදම්) ලංකා රජයට ආපසු ගෙවීමටද,

පොරොන්දු වන ගිවිසුමකට අත්සන් කළ යුතුය.

5. **ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන් :** ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත් ය :—

(අ) එක්සත් ජාතීන් විසින් සිය විශේෂතා ආයතනයන් සමග සාකච්ඡා කොට එකගවී ඇති දීමනා ප්‍රමාණයන් අනුව, ඉගෙනීම ලබන රටෙහි මුදලින් නියම කැරෙන හා ගෙවනු ලබන මාසික දීමනාවක්.

(ආ) ගමන් වියදම්.

(ඉ) ඉගෙනීම සඳහා අවශ්‍ය පොත්පත් මිලදී ගැනීම පිණිස අමෙරිකානු ඩොලර් 50 ක දීමනාවක්

(ඊ) අධ්‍යයන සැලැස්මට සම්බන්ධ අනියම් වියදම්.

**සංලක්ෂ්‍යය :** මේ ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන රජයේ සේවකයන්ට නිවාඩු දීම, අවස්ථාවට වලංගුව පවත්නා භාණ්ඩාගාර හා දෙපාර්තමේන්තු නීති රීතීන්ට යටත් වන්නේ ය.

6. **සම්මුඛ පරීක්ෂණය :** සුදුසුකම් ලත් අයදුම් කරුවන්, නියමිත ස්ථානයක හා නියමිත වේලාවක කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට තමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලිවල මුල් පිටපත් රැගෙන ඒමට සූදානම් වී සිටිය යුතුය.

7. **ගිවිසුම :** තෝරාගනු ලබන අපේක්ෂකයන් ඉගෙනීමට නියමිත රට බලා පිටත්ව යාමට පෙර—

(අ) අනෙකුත් කරුණු අතර, නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදාරා සතුටුදායක ලෙස එය සම්පූර්ණ කිරීමට හා ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය වුවහොත්, රජය විසින් නියම කරනු ලබන යම්කිසි කාලසීමාවක් තුළ රජය යටතේ සේවය කිරීමට ද,

(ආ) තමාගේ ගිවිසුමේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවකදී, ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම (එනම්, සම්පූර්ණ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ලංකා රජයට හා ප්‍රදාන අධිකාරීන්ට දරන්නට සිදුවූ සියලුම වියදම් හා රජයේ සේවකයෙක් නම්, ඊට අමතරව වේතනය, දීමනා ආදිය ඇතුළු වියදම්) ලංකා රජයට ආපසු ගෙවීමට ද,

පොරොන්දු වන ගිවිසුමකට අත්සන් කළ යුතුය.

8. **වෛද්‍ය පරීක්ෂණය :** තෝරාගනු ලබන අපේක්ෂකයන් ඉගෙනීමට නියමවන රටෙහි අධ්‍යයන පාඨමාලාවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවක් ඇති බවට, රජය විසින් පත් කරනු ලබන විශේෂ වෛද්‍ය මණ්ඩලයක් මඟින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි.

9. රජයේ සේවකයන් සම්බන්ධයෙන්, බලාපොරොත්තු වන පුහුණුව ඔවුන් විසින් දැනට දරන තනතුරෙහි වැඩි වේතනයක් හෝ උසස්වීමක් ලැබීමට සුදුසුකමක් නොවන්නේ ය. සෙසු අය සම්බන්ධයෙන්, ශිෂ්‍යත්වය සම්පූර්ණ කොට ආපසු පැමිණීමෙන් පසු රක්ෂා ලබාදීමට රජය පොරොන්දු නොවන්නේ ය.

10. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි වැරදි ප්‍රකාශයක් කර ඇති බව තෝරාගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු එයින් නුසුදුසු බවට පත්වේ. තෝරාගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

11. තෝරාගනු ලැබූ අපේක්ෂකයකු නාමයෝජනා කරනු ලැබීම හෝ ප්‍රදානය පිළිගැනීම හෝ ප්‍රතික්ෂෙප කළහොත්, අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් ගතවන තුරු, අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා හෝ ඔහු සලකාබලනු නොලැබේ.

12. කිසියම් අපේක්ෂකයකු ලංකා අධිකාරීන් විසින් නාමයෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රදනයක් සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතිය යුතු බව පැහැදිලිව අවබෝධ කටයුතු ය. ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, සම්පූර්ණයෙන්ම, නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රදාන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදු වන්නක් හෙයිනි.

13. යම් අපේක්ෂකයකු තෝරගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබාගැනීමට හෝ බලපෑවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන්ම එම අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

14. මේ නිවේදනයේ අවශ්‍යතාවන් සියල්ල සෑම ආකාරයෙන්ම සම්පූර්ණ නො කෙරන හා අසම්පූර්ණ අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලබන්නේ ය.

15. මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශෙෂ ආකෘතියක පිළියෙළ කළ යුතු අයදුම් පත්, 1965.10.15 වැනි දින පස්වරු 4.30 ට පෙර ලැබෙන සේ, කොළඹ 3, " සිරිමතිපායේ ", අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ.

16. රජයේ සේවකයින් විසින් එවන අයදුම් පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ද, මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්වවිද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින් විසින් එවන අයදුම් පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මඟින් ද එවිය යුතුයි.

17. සියළුම අයදුම් පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම් පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7 ක් ඇතුළත අයදුම් පත් ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන හා සාංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත වහාම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම් කරු ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේ ය.

අධ්‍යාපන හා සාංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්,

1965 සැප්තැම්බර් මස 18 වැනිදා,
කොළඹ 3, " සිරිමතිපායේ "
අධ්‍යාපන හා සාංස්කෘතික අමාත්‍යාංශයේදී ය.

9-1013—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## ලංකා රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථාව

### තනතුරු—ඇබෑර්තු

පහත සඳහන් තනතුරු සඳහා 1965 ඔක්තෝබර් මස 9 වෙනි දින දක්වා ලාංකිකයින්ගෙන් අයදුම් පත් භාරගනු ලැබේ.

**1. විදුලි කාර්මික—**

**සුදුසුකම්.**—රජයේ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් ආයතනයක විදුලි කාර්මිකයෙකු ලෙස යටත් පිරිසයින් අවුරුදු 10 ක පළපුරුද්දක් තිබිය යුතුයි.

**පඩි ක්‍රමය.**—රු. 210—6×15—300 දක්වා සියල්ල අඩංගු මාසික පඩියක්.

**වයස.**—අවුරුදු 25-45.

**2. මෝටර් කාර්මික—**

**සුදුසුකම්.**—ඩීසල් හා පෙට්‍රල් මෝටර් වාහන නඩත්තු කිරීම හා අළුත්වැඩියා කිරීම පිළිබඳව යටත් පිරිසයින් අවුරුදු 5 ක (ආධුනික කාලයට අමතරව) පළපුරුද්දක් තිබිය යුතුයි.

**පඩි ක්‍රමය.**—රු. 180—6×15—270 දක්වා සියල්ල අඩංගු මාසික පඩියක්.

**වයස.**—අවුරුදු 25-45.

**3. යන්ත්‍ර ක්‍රියාකරු—**

**සුදුසුකම්.**—ක්‍රේන් හා පහත නම් සඳහන් යන්ත්‍ර වලින් එකක් මනා ලෙස ක්‍රියා කරවීමේ හැකියාවක් තිබිය යුතුය. ඩෝසර්, ට්‍රැක්ටර්, (ක්‍රෝලර්) පස් කපන යන්ත්‍ර (එක්ස්කැවේටර්) යනාදිය.

බර වාහන පැදවීමට අවශ්‍ය බලපත්‍ර තිබිය යුතුයි. රජයේ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් ආයතනයක යන්ත්‍ර ක්‍රියා කරවීම හා අළුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් යටත් පිරිසයින් අවුරුදු 5 ක පළපුරුද්දක් තිබිය යුතුයි. එය සනාථ කිරීමට සහතික පත් ඉදිරිපත් කළ යුතුය.

ලිවීමට හා කියවීමට හැකියාවක් තිබිය යුතුයි.

**වයස.**—අවුරුදු 25-45

**පඩි ක්‍රමය.**—රු. 210—6×15—300 දක්වා සියල්ල අඩංගු මාසික පඩියක්.

යන්ත්‍ර ක්‍රියා කරවීමේ හැකියාව දැන ගැනීම සඳහා සෑම ඉල්ලුම්කරුවෙක්ම ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනවිය යුතුය.

පළපුරුද්ද හා සුදුසුකම් අනුව තෝරා ගනු ලබන අයදුම්කරුවන් ඉහත සඳහන් කී පඩි ක්‍රමයන්හි සුදුසු පියවරක තැබීම ගැන සලකා බලනු ඇත.

මෙම කාර්යාලයට පැමිණ හෝ තම ලිපිනය ලියූ ශත 10 ක මුද්දරයක් ඇලවූ ලියුම් කවරයක් එවීමෙන් හෝ ලබාගත හැකි ආකෘති පත්‍රවල අයදුම් පත් එවිය යුතුය. චරිතය පිළිබඳ ලබාගත් සහතිකවල පිටපත් දෙකක් අයදුම් පත් සමග එවිය යුතුය.

මොන යම් ක්‍රමයක හෝ බලපෑම් කිරීමට තැත්කිරීම නුසුදුසුකමක් සේ සලකනු ඇත.

සභාපති,
ලංකා රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථාව.

තැ. පෙ. 194,
48, ශ්‍රී ජිනරතන පාර,
කොළඹ 2,
1965 සැප්තැම්බර් මස 18 වන දා.

9-1041—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

## ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාවේ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේ නිලධාරි

ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාවේ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේ නිලධාරි තනතුර සඳහා සුදුසුකම් ඇති ලාංකිකයන්ගෙන් අයදුම් පත්‍ර භාරගනු ලැබේ.

වැටුප් ක්‍රමය : රු. 800—රු. 45×7, රු. 50×4—රු. 1,315 සියල්ල අඩංගු මාසික. රු. 1,115 අවස්ථාවේ කාර්යක්ෂමතා කඩඉමකි.

මෙම වැටුප් ක්‍රමය අමාත්‍යාංශයේ හා භාණ්ඩාගාරයේ අනුමැතියට යටත් බැවින් තාවකාලිකය.

සුදුසුකම් : අයදුම්කරුවන්.—

(අ) වයස අවුරුදු 45 ට අඩු විය යුතුය.

(ආ) පාලන, මිළට ගැණුම්, ආනයන පාලන, අය වැය පාලන, හා යෝජනා ක්‍රම සංවිධාන වැඩ කරන රජයේ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් කාර්මික හෝ වාණිජ ආයතනයක අවුරුදු 2 ක පළපුරුද්දක් ඇති පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරීන් විය යුතුය.

නැතහොත්

පාලන, මිළට ගැණුම්, ආනයන පාලන, අයවැය පාලන හා යෝජනා ක්‍රම සංවිධාන වැඩ කරන රජයේ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් කාර්මික හෝ වාණිජ ආයතනයක අවුරුදු 3 ක පළපුරුද්දක් ඇති පිළිගත් විශ්ව විද්‍යාලයක අන්තර් පරීක්ෂණ සාමාර්ථය ලැබූවන් විය යුතුය.

නැතහොත්

පාලන, මිළට ගැණුම්, ආනයන පාලන, අයවැය පාලන හා යෝජනා ක්‍රම සංවිධාන වැඩ කරන රජයේ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් පිළිගත් කාර්මික හෝ වාණිජ ආයතනයක පරිපාලන හෝ ජ්‍යෙෂ්ඨ ලිපිකරු හෝ කාර්මික කටයුතු පිළිබඳ අවුරුදු 5 ක පළපුරුද්දක් ඇති, ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය දරන්නන් විය යුතුය.

රජයේ අංශයේ නියුක්ත වූවන්ගේ ඉල්ලුම් පත්‍ර ඔවුනොවුන්ගේ දෙපාර්තමේන්තු, සංස්ථා හෝ මණ්ඩල මඟින් ඉදිරිපත් කළ යුතුය.

ඉල්ලුම් පත් පහත සඳහන් ආකෘති පත්‍රය අනුව විය යුතු අතර, 1965 ඔක්තෝබර් මස 14 වැනි බ්‍රහස්පතින්දට හෝ ඊට ප්‍රථම :

" සභාපති,
ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව,
තැ. පෙ. 670,
242, හැව්ලොක් පාර,
කොළඹ 5 ".

යන ලිපිනයට ලැබෙන ලෙස ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

තැපැලේදී නැති වන හෝ ප්‍රමාද වන ඉල්ලුම් පත්‍ර ගැන සංස්ථාව වග කීමකට නො බැඳෙන අතර, ඉල්ලුම් පත්‍ර ලැබුන බව දන්වා නො එවන බැව් සැළකිය යුතුය.

ලේකම්.

ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව,
242, හැව්ලොක් පාර, කොළඹ 5,
1965 සැප්තැම්බර් මස 18 දි.

### ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාවේ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේ නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් කිරීම

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය :————.
   ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස :————.
4. ජාතිය :————.
5. ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් :————.
6. ඉල්ලුම් පත් කැඳවන නිවේදනයේ සඳහන් සුදුසුකම් පිළිබඳ විස්තර :————.
   (සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.)
7. පාසැලින් අස්වූවාට පසු කරන ලද රැකියාවන් පිළිබඳ විස්තර හා එක් එක් ස්ථානයේදී ලැබූ වැටුප් හා එක් එක් තනතුරින් අස්වීමට හේතු :————.
8. චරිත සහතික එවා ඇත්තේ කාගෙන්ද යන වග හා ඔවුන්ගේ ලිපිනයන් :—
   (1) ————.
   (2) ————.
   (3) ————.
   (ලගදී ලබාගත් චරිත සහතික තුනක් ඉදිරිපත් කළ යුතුය. මේවා ආපසු දෙන නො ලැබේ.)
9. ඔබ සඳහන් කිරීමට කැමති වෙනත් කරුණු :————.

මා විසින් මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් කරන ලද කරුණු නිවැරදි හා සත්‍ය බව ප්‍රකාශ කරන අතර කිසියම් වැරදි ප්‍රකාශයක් කර ඇත්නම් හෝ මා විසින් සඳහන් කළ යුතු කිසියම් විස්තරයක් සඳහන් නො කරන ලද නම් තෝරා ගැනීමෙන් පසු වූවද මා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් බව මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

9-1060/2—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## ජාතික පෝෂකර්ම සංස්ථාව

### පුහුණුවීමේ සේවකයින්ගේ තනතුරු

වර්ෂ 1965 ක්වූ සැප්තැම්බර් මස 30 වැනි දින ප. ව. 4.30 දක්වා පහත සඳහන් අඩුම සුදුසුකම් ඇති අයගෙන් පුහුණුවීමේ සේවකයින්ගේ තනතුරු සඳහා ඉල්ලුම්පත් භාරගනු ලැබේ.

අධ්‍යාපනික සුදුසුකම් :—

5 වැනි පන්තියේ සිට අ. පො. ස. පත්‍ර විභාගය (සාමාන්‍ය පෙළ) දක්වා.

වයස :— අවුරුදු 18—26 අතර විය යුතුයි.

අයදුම්කරුවන් රජයේ රැකීරක්ෂා කාර්‍යාලයක ලියාපදිංචි වූ අය විය යුතුය.

දැනටමත් ඉල්ලුම්පත් ඉදිරිපත් කොට ඇති අය නැවත ඉල්ලුම් කිරීම අවශ්‍ය නොවේ.

අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ වයස, අධ්‍යාපනික සුදුසුකම් හා පාසැලෙන් අස්වූ පසු කළ රැකියාවන් සම්බන්ධ සම්පූර්ණ විස්තර ද සඳහන් කළ යුතු අතර අධ්‍යාපනික හා චරිත සහතිකයන්හි පිටපත් ද (මුල් පිටපත් නොවේ) ඉදිරිපත් කළ යුතුය.

ආධාර ලබාගැනීමට හෝ වැරදි තොරතුරු සැපයීමට උත්සාහ කිරීම නුසුදුසුකමක් හැටියට සලකනු ලැබේ.

ජාතික පෝෂකර්ම සංස්ථාව, සභාපති.
56, හෝර්ටන් පෙදෙස, කොළඹ 7.

9-1001—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## ජාතික පෝෂකර්ම සංස්ථාව

### ලිපිකරු තනතුරු

වර්ෂ 1965 ක්වූ ඔක්තෝබර් මස 5 වැනි දින ප. ව. 4.30 දක්වා පහත සඳහන් අඩුම සුදුසුකම් ඇති අයගෙන් ලිපිකරු තනතුරු සඳහා ඉල්ලුම් පත් භාරගනු ලැබේ.

**ලිපිකරු තනතුරු—1 ශ්‍රේණිය.**

සුදුසුකම්.—ජ්‍යෙෂ්ඨය හෝ විෂයයන් 6ක් සහිත අ.පො.ස. පත්‍ර විභාගය. විශාල වෙළඳායතනයක, රජයේ සංස්ථාවක හෝ රජයේ දෙපාර්තමේන්තුවක පහත දැක්වෙන ඒවායින් එකකින් හෝ පළපුරුද්ද ඇති අය ගැන විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

1. සාමාන්‍ය පාලනය හා කාර්‍යාල පරිපාටිය.
2. ගබඩා කටයුතු.
3. ආනයන කටයුතු.
4. බැංකු කටයුතු.
5. මිලදී ගැනීමේ කටයුතු.

වයස.—අවුරුදු 30ට අඩුවිය යුතුයි.

වැටුප් ක්‍රමය.—මසකට රු. 210 රු. 10×14—රු. 350 සියළු දීමනා ඇතුළුව.

**රක්ෂණ ලිපිකරු—2 ශ්‍රේණිය.**

සුදුසුකම්.—ජ්‍යෙෂ්ඨය හෝ විෂයයන් 6ක් සහිත අ.පො.ස. පත්‍ර විභාගය සෑම වර්ගවලම සාමාන්‍ය රක්ෂණය ගැන පළපුරුද්ද හා විශේෂයෙන්ම මුහුදු උවදුරු රක්ෂණය, ප්‍රති රක්ෂණ හා හිමිකම් ගැන පළපුරුද්දක් ද තිබිය යුතුය.

වැටුප් ක්‍රමය.—මසකට රු. 260 රු. 15×13—රු. 455 සියළු දීමනා ඇතුළුව.

ඉහත සඳහන් තනතුරු සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන්ට ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව එම වැටුප් ක්‍රමයේ සුදුසු ස්ථානයන්ට පත්වීම දීම ගැන සලකා බලනු ලැබේ.

අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ වයස, අධ්‍යාපනික සුදුසුකම් හා පාසැලෙන් අස්වූ පසු කළ රැකියාවන් සම්බන්ධ සම්පූර්ණ විස්තර ද සඳහන් කළයුතු අතර අධ්‍යාපනික හා චරිත සහතිකයන්හි පිටපත් ද (මුල් පිටපත් නොවේ) ඉදිරිපත් කළ යුතුය.

ආධාර ලබා ගැනීමට හෝ වැරදි තොරතුරු සැපයීමට උත්සාහ කිරීම නුසුදුසු කමක් හැටියට සලකනු ලැබේ.

සභාපති.

ජාතික පෝෂකර්ම සංස්ථාව,
56, හෝර්ටන් පෙදෙස,
කොළඹ 7.

9-1000—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

භාණ්ඩාගාර අංකය: 1/60/12 (ජී).

## යතුරුලේඛක සේවයට බඳවා ගැනීමේ (සිංහල) විභාගය—1964 මැයි

අංක 14,452 හා 1965.7.16, අංක 14,472 හා 1965.8.6 හා අංක 14,490 හා 1965.8.27 දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රවල පළවූ නිවේදනවලට අමතරව යි.

1964 මැයි මස පවත්වන ලද යතුරුලේඛක සේවයට බඳවා ගැනීමේ (සිංහල) විභාගයේ ප්‍රතිඵල අනුව පහත සඳහන් අපේක්ෂක/අපේක්ෂිකාවන් යතුරුලේඛක සේවයට පත් කිරීමට තෝරාගෙන තිබෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ:—

| නම | ලිපිනය |
|---|---|
| අනුලාවතී, ජ. අ. (මෙනෙවිය) ... | කොළඹ—2, පාසන්ස් පාර, ජාතික නිවාස දෙපාර්තමේන්තුව. |
| අප්පුහාමි, හි. අ. ස. ... | දූනාගහ, පල්ලියපිටිය. |
| අමරදාස, ම. ක. ... | බිබිල, සමූපකාර සංවර්ධන—උප කොමසාරිස් කාර්යාලය. |
| අර්ශකුලරත්න, කු. ප. ඇ. කි. ද. සි. ... | කළුතර, සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලය. |
| ආරියදාස, මා. ... | මීරිගම, කත්ඩලම, උඩුගහ ගම්සභා කාර්යාලය. |
| ඇන්සලින්හාමි, ක. බ. (මෙනෙවිය) | මීගමුව, බසියාවත්ත, "ශාන්ති" |
| ඉසිලින්නෝනා, සෝ. අ. දෝ. (මෙනෙවිය) ... | අඟුරුවාතොට, ඉවුඩුගොඩ. |
| කමලාවතී, ක. ආ. දෝ. එ. (මෙනෙවිය) ... | පානදුර, වලාන, වත්තල්පොල පාර, නො. 17. |
| කුසුමාවතී, ව. ආ. (මෙනෙවිය) | අම්ලන්ගොඩ, අළුත්පාර, "සුලලිත" විදුහල. |
| ගමගේ, ර. නි. කා. (මෙනෙවිය) | මීපියාගොඩ, රොන්නදූව, "ශ්‍රී විජය" |
| ජයවීර, ඉ. ග. වි. (මෙනෙවිය) | අම්බලන්ගොඩ, මහ වීදිය "සුල ලිත" විදුහල. |
| ජිනසේන, ප. දො. ... | ධර්මාගාරය, පොල්දූව. |
| ද සිල්වා, අ. ස. ... | අම්බලන්ගොඩ, අළුත් පාර, "සුලලිත" වාණිජ විදුහල. |
| ද සිල්වා, කො. සො. ක. (මෙනෙවිය) ... | කටුනායක, කුරන, නො. 680. |
| ද සිල්වා, ප. හා. ගේ. ගු. (මෙනෙවිය) ... | කළුතර උතුර, මංගලමාවත 14/5. |
| ද සිල්වා, වී. ජී. (මෙනෙවිය) ... | වාද්දූව, සොහොන්දරමුල්ල. |
| නන්දාවතී, ක. ආ. (මෙනෙවිය) | වාද්දූව, මැස්ටිය. |
| පුෂ්පලතා, කු. ආ. න. (මෙනෙවිය) | අංගොඩ, හිඹුටාන, අංක, 336. |
| ප්‍රේමවතී, පෙරේරා, ද ලී. (මෙනෙවිය) ... ... | පූගොඩ, "නන්දන" |
| පෙරේරා, ප. වි. ... | බණ්ඩාරගම, තලගහවත්ත, රඹුක්කන. |
| ප්‍රේමදාස, වී. දො. ... | මතුගම, අළුත්ගමපාර, "සිල්වා" විදුහල. |
| ප්‍රනාන්දු, උ. හු. ඇ. ... | පානදුර, පැරකුම් මාවත, මීනුවන්පිටිය. |
| ප්‍රනාන්දු, මී. පී. එ. ප්‍රි. ... | වවුනියාව, කෘෂිකර්ම කාර්යාලය—(ගොවිපාලන හා නිෂ්පාදන) |
| බෙලින්නෝනා, ර. දේ. (මෙනෙවිය) ... ... | මිණුවන්ගොඩ, උග්ගල්බොඩ, "නිමල්පාය" |
| රණසිංහ, අ. එ. (මෙනෙවිය) ... | කොළඹ—1, විදුලි සන්දේශ—පාලන කාර්යාලය. |
| රූපසිරි, දො. පා. ආ. ලා. ... | බණ්ඩාරගම, නොතාරිස් කාර්යාලය. |
| විජේසිංහ, ලී. දො. ... | කොළඹ—1, සියුක්වීදිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව. |
| සමරපාල, කු. ග. ... | බන්ධනාගාර මූලස්ථානය, කොළඹ—9. |
| සිල්වා, ව. ලී. (මෙනෙවිය) ... | කොළඹ—2, පාර්සන්ස් පාර, ජාතික නිවාස දෙපාර්තමේන්තුව. |
| සුමනාවතී, දෙ. ආ. (මෙනෙවිය) | වැබඩ, පන්සල පාර. |
| හැරියට්, දි. මු. සේ. (මෙනෙවිය) | යක්විල, "පද්මසිරිය" |
| හේරත්, සෝ. කු. (මෙනෙවිය) | පේරාදෙණිය, රාජකීය උද්‍යානය, නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) කාර්යාලය. |
| හේවාපතිරණ, පී. මී. ... | (මාතර හරහා), කඹුරුපිටිය,—විලපිටියඳ්දගොඩ. |

ච. රී. කුරේ,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1965 සැප්තැම්බර් මස 18 වැනිදා,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

9-1018—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය: 1/23/28/1 (ජී).

## රජයේ කණිෂ්ඨ සේවකයින් උසස් කිරීම සඳහා පැවැත්වූ (විශේෂ) විභාගය—1964 මාර්තු

1965 මාර්තු මස 5 වන දින අංක 14,335 හා 1965 මැයි මස 28 වන දින අංක 14,407 දරණ ගැසට් පත්‍රවල පළවූ නිවේදනවලට අමතරව පහත දැක්වෙන අපේක්ෂකයින් ද, 1964 මාර්තු මස රජයේ කණිෂ්ඨ සේවකයින් උසස් කිරීම සඳහා පැවැත්වූ (විශේෂ) විභාගයේ ප්‍රතිඵල අනුව සාමාන්‍ය ලිපිකාර සෙවයෙ සාමාන්‍ය ලිපිකරු පන්තියට පත් කිරීමට තෝරා ගෙන තිබෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ:—

| නම | ලිපිනය |
|---|---|
| උඩුගොඩ, රූ. සු. ... | කාර්යාල කාර්ය සහායක තැපැල්හල, උඩුගොඩ. |
| එඩ්වින්, දො. ... | කාර්යාල කාර්ය සහායක, තැපැල් කාර්යාලය, කුරුළුවත්ත, කොළඹ 7. |
| කරුණාදාස, දූ. මු. ... | රෙදි එකතුකරන්නා, මහ රෝහල, කොළඹ. |
| ගුණතිලක, පැ. ආ. ... | තැපැල්කරු, උප තැපැල්පල, මුදුන්ගොඩ. |
| ගුණරත්න බණ්ඩා ලේ. රා. | ඩීසල් ෆිට්ටර් 61407, ප්‍ර. යා. ඉ. දෙපාර්තමේන්තුව, ල. දු. දෙ., රත්මලාන. |
| ඩග්ලස්, ග. ඇ. ... | තැපැල් ධාවක, තැපැල් කාර්යාලය, වැලිගම. |
| ධම්මදාස, ක. කං. ... | පොත් බඳින්නා, වෛද්‍ය ලේඛන කාර්යාලය, මහ රෝහල, කොළඹ. |
| නන්දදාස, ම. ... | කාර්යාල කාර්ය සහායක, පොලිස් මූලස්ථානය, කොළඹ 1. |
| පීටර්, වී. ජේ. ... | ඖෂධ සංයෝජක, මාතෘ නිවාසය, බියගම. |
| බාලසිංහම්, අ. ... | තැපැල්කරු, තැපැල් කාර්යාලය, වෙන්නප්පුව. |
| බෝතේජු, ප. පී. එ. ... | බන්ධනාගාර නියාමක, රිමාන්ඩ් බන්ධනාගාරය, කොළඹ 9. |
| සුබ්‍රමනියම්, ක. ... | ආහාර නිෂ්පාදන ඕවර්සියර්, දිස්ත්‍රික් කෘෂිකර්ම කාර්යාලය, යාපනය. |

ච. රී. කුරේ,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1965 සැප්තැම්බර් මස 18 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දීය.

9-1017-65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

භාණ්ඩාගාරයේ අංකය : 1/83/12/1(ඊ)

## ස්ථාන මාරුව සහිත ලසු ලේඛක සේවයේ පහළ ශ්‍රෙණියේ ලසු ලේඛකයන් සඳහා 1965 ජූලි මස පවත්වනු ලද සේවයෙහි ස්ථිරකිරීමේ (සිංහල) විභාගය

1965 ජූලි 17 වැනි දින පවත්වන ලද ස්ථාන මාරුව සහිත ලසු ලේඛක සේවයේ පහළ ශ්‍රෙණියට අයත් ලසු ලේඛකයන්ගේ පත්වීම් ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයේදී, ප්‍රවාසන/පරීක්ෂණ කාලවලට යටත් ව පත්වීම් ලබා සිටින පහත සඳහන් ලසු ලේඛක-ලේඛිකාවන් ද, ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන් විෂයයෙන්/විෂයයන්ගෙන් සමත් වී ඇති බැව් මෙයින් දනුම් දෙමි :—

| නම | දෙපාර්තමේන්තුව | විෂයය/විෂයයන් |
|---|---|---|
| අල්ගම, දෝ. ද. (මෙනෙවිය) | කොළඹ, රික්වැස්ට් උසාවිය | සිංහල |
| ඇන්සිනෝනා, හු. ආ. (මෙනෙවිය) | කොළඹ, ඒකාබද්ධ මහෙස්ත්‍රාත් උසාවිය | සිංහල |
| කරුණාරත්න, වි. ප. ම. | දේශීය ආදයම් | ලසු ලේඛනය හා සිංහල |
| කුරුකුලනාථ, වී. මී. (මහත්මිය) | වන සංරක්ෂණ | සිංහල |
| කුරේ, බු. ලි. (මෙනෙවිය) | ගුවන් විදුලි හා ප්‍රවෘත්ති | සිංහල |
| ජයකොඩි, දෙ. ස. ලෝ | මහා භාණ්ඩාගාරය | ලසු ලේඛනය හා සිංහල |
| ජයසේකර, ඩො. සි. | ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත | සිංහල |
| ද සිල්වා, කු. ලෝ. වි. පැ. (මහත්මිය) | රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | සිංහල |
| ද සිල්වා, ව. සෝ. (මෙනෙවිය) | ජනලේඛන හා සංඛ්‍යා ලේඛන | සිංහල |
| ද සිල්වා, සි. ම. ප. (මෙනෙවිය) | දේශීය ආදයම් | සිංහල |
| දබරේ, පා. ච. ප. (මෙනෙවිය) | සමාගම් රෙජිස්ට්‍රාර්ගේ | සිංහල |
| පියදස, ග. දෝ. න. (මහත්මිය) | ආහාර | සිංහල |
| පුංචිහේවා, සු. ඉ. ගා. (මෙනෙවිය) | කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය | සිංහල |
| පෙරේරා, ච. ර. (මහත්මිය) | අධ්‍යාපන | සිංහල |
| බොතේජු, මේ. (මහත්මිය) | දුම්රිය | ලසු ලේඛනය හා සිංහල |
| මෙත්තානන්ද, ප්‍රෙ. (මහත්මිය) | ගුවන් විදුලි හා ප්‍රවෘත්ති | සිංහල |
| රණතුංග ආරච්චි, වී. | රථවාහන මහෙස්ත්‍රාත් උසාවිය | සිංහල |
| රොස්ලින්, ග. දෝ. (මෙනෙවිය) | අලෙවි කිරීමේ | ලසු ලේඛනය හා සිංහල |
| වීරරත්න, දෝ. ච. උ. (මෙනෙවිය) | ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත | ලසු ලේඛනය හා සිංහල |
| සුගතදස, හෙ. හ. කං. සෝ. (මහත්මිය) | මහා භාණ්ඩාගාරය | ලසු ලේඛනය හා සිංහල |
| හෙට්ටිගොඩ, සු. (මහත්මිය) | කම්කරු | ලසු ලේඛනය |
| හේමචන්ද්‍ර, හ. දෝ. න. (මහත්මිය) | තක්සේරු | සිංහල |

2. පහත සඳහන් නිලධාරිහු පත්වීම් ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයෙන් සම්පූර්ණ වශයෙන් දැන් සමත් වී ඇත්තා හ.

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| ඇන්සිනෝනා, හු. ආ. (මෙනෙවිය) | කොළඹ, ඒකාබද්ධ මහෙස්ත්‍රාත් උසාවිය |
| කරුණාරත්න, වි. ප. ම. | දේශීය ආදයම් |
| ජයකොඩි, දෙ. ස. ලෝ. | මහා භාණ්ඩාගාරය |
| බොතේජු, මේ. (මහත්මිය) | දුම්රිය |
| රොස්ලින්, ග. දෝ. (මෙනෙවිය) | අලෙවි කිරීමේ |
| වීරරත්න, දෝ. ච. උ. (මෙනෙවිය) | ග්‍රාම සංවර්ධන හා කුඩාකර්මාන්ත |
| සුගතදස, හෙ. හ. කං. සෝ. (මහත්මිය) | මහා භාණ්ඩාගරය |
| හෙට්ටිගොඩ, සු. (මහත්මිය) | කම්කරු |

ඩ. ඊ. කුරේ,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1965 සැප්තැම්බර් 20 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

9-1066/1—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

භාණ්ඩාගාර අංකය : 1/83/12/1 (ඊ)

## ස්ථාන මාරුව සහිත ලසු ලේඛක සේවයේ පහළ ශ්‍රෙණියේ ලසු ලේඛකයින් සඳහා 1965 ජූලි මස පවත්වන ලද සේවයෙහි ස්ථිර කිරීමේ (ඉංග්‍රීසි) විභාගය

1965 ජූලි මස 10 වැනි දින පවත්වන ලද ස්ථාන මාරුව සහිත ලසු ලේඛක සේවයේ පහළ ශ්‍රෙණියට අයත් ලසු ලේඛකයන් ගේ පත්වීම් ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයේ දී, ප්‍රවාසන/පරීක්ෂණ කාලවලට යටත්ව පත්වීම ලබා සිටින පහත සඳහන් ලසු ලේඛකයන්, ලසු ලේඛිකාවන් ඔවුන් ගේ නම් ඉදිරියෙන් සඳහන් විෂයයෙන්/විෂයයන්ගෙන් සමර්ථවී ඇති බැව් මෙයින් දනුම් දෙමි.

| නම | දෙපාර්තමේන්තුව | විෂයයන් |
|---|---|---|
| කරුණාදස, හෙ. | තැපැල් | ඉංග්‍රීසි |
| නානායක්කාර, බ. | සෞඛ්‍ය | ලසු ලේඛනය |
| ප්‍රනාන්දු, මෙ. කො. (මහත්මිය) | ආනයන හා අපනයන | ලසු ලේඛනය හා ඉංග්‍රීසි |
| සිල්වා, කු. හා. ජ. | ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | ඉංග්‍රීසි |

(2) පහත සඳහන් නිලධාරිහු පත්වීම් ස්ථිරකිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයෙන් සම්පූර්ණයෙන් දැන් සමර්ථ වී ඇත්තාහ.

| නම | | දෙපාර්තමේන්තුව |
|---|---|---|
| නානායක්කාර, බ. | ... | ... සෞඛ්‍ය |
| ප්‍රනාන්දු, මෙ. කො. (මහත්මිය) | ... | ... ආනයන හා අපනයන |
| සිල්වා, කු.හා.ජ. ... | ... | ... ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය |

එ. ඊ. කුරේ,
භාණ්ඩාගාරයේ, අතිරේක නියෝජ්‍ය ලේකම්.

1965 සැප්තැම්බර් මස 20 වැනි ද,
මහා භාණ්ඩාගාරයේ දී ය,
කොළඹ.

9-1066/2—65.9.24 දින අංක 14,513 දර න ගැසට් පත්‍රය

---

මගේ අංකය : 1/83/12/1 (ඊ)

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රෙණියේ ලඝු ලේඛකයන් සඳහා 1965 ජූලි මස පවත්වන ලද සේවයේ ස්ථිර කිරීමේ විශෙෂ (ඉංග්‍රීසි) විභාගය

1965 ජූලි මස 10වැනි දින පවත්වන ලද, ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රෙණියට අයත් ලඝු ලේඛකයන් ගේ පත්වීම් ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයේ දී ප්‍රවාසන/පරීක්ෂණ කාලවලට යටත්ව පත්වීම් ලබා සිටින පහත සඳහන් ලඝු ලේඛකයා ද ඔහු ගේ නම ඉදිරියෙන් සඳහන් විෂයෙන් සමර්ථ වී ඇති බැව් මෙයින් දනුම් දෙමි.

| නම | දෙපාර්තමේන්තුව | විෂයයන් |
|---|---|---|
| සිරිතුංග, අ. දෙ. ධ. ... ... | ... කම්කරු ... | ... ඉංග්‍රීසි |

එ. ඊ. කුරේ,
අතිරේක භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

1965 සැප්තැම්බර් මස 20 වැනි ද,
මහා භාණ්ඩාගාරයේ දී ය,
කොළඹ.

9-1066/3—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

භාණ්ඩාගාරයේ අංකය : 1/83/13/1 (ඊ)

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රෙණියට අයත් ලඝු ලේඛයන් සඳහා වූ කාර්යක්ෂමතා කඩ–ඉම් (සිංහල) විභාගය—1965 ජූලි මස

1965 ජූලි 17 වැනි දින පවත්වන ලද, ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රෙණියට අයත් ලඝු ලේඛකයන්ගේ වාර්ෂික වේතනය රු. 2,940 ක් වීමට පෙර ඇති කාර්යක්ෂමතා කඩ-ඉමෙන් උසස් කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයේ දී, පහත සඳහන් ලඝු ලේඛකයන් හා ලඝු ලේඛිකාව ද ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන් විෂයයෙන්/විෂයයන්ගෙන් සමත් වී ඇති බව මෙයින් දනුම් දෙමි :—

| නම | දෙපාර්තමේන්තුව | විෂයය/විෂයයන් |
|---|---|---|
| අල්විස්, සිං. ජේ. ... ... ... | ... කෘෂිකර්ම ... | ... ලඝු ලේඛනය හා සිංහල |
| කරුණාරත්න, ප. ... ... ... | ... ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | සිංහල |
| ජයසිංහ, එ. ප. ... ... ... | ... ආයුර්වේද ... | ... සිංහල |
| ජිනදස, පා. වි. ... ... ... | ... පොලිස් ... | ... ලඝු ලේඛනය |
| පියසේන, ග. ... ... ... | ... මුදල් අමාත්‍යාංශය ... | ... ලඝු ලේඛනය |
| පියසේන, දී. ග. ... ... ... | ... ප්‍රවාහන අමාත්‍යාංශය | ... ලඝු ලේඛනය |
| පීරිස්, හ. මී. (මෙනෙවිය) ... ... ... | ... පරිවාස හා ළමාරක්ෂක සේවා | ... ලඝු ලේඛනය |
| පෙරේරා, වේ. ලි. සි. ... ... ... | ... කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය | ... ලඝු ලේඛනය හා සිංහල |
| වරාවිට, කා. රං. ... ... ... | ... කොළඹ, කච්චේරිය | ... ලඝු ලේඛනය |

2. පහත සඳහන් අපේක්ෂකයන් හා අපේක්ෂිකාව ද සම්මේලන වාර්තාකිරීමේ පරීක්ෂණයට ඇතුළත් කර ගැනීම සඳහා දැන් සුදුසුකම් ලබා ඇත :—

| නම | | දෙපාර්තමේන්තුව |
|---|---|---|
| අල්විස්, සිං. ජේ. ... | ... | ... කෘෂිකර්ම |
| ජිනදස, පා. වි. ... | ... | ... පොලිස් |
| පියසේන, ග. ... | ... | ... මුදල් අමාත්‍යාංශය |
| පීරිස්, හ. මී. (මෙනෙවිය) | ... | ... පරිවාස හා ළමාරක්ෂක සේවා |
| පෙරේරා, වේ. ලි. සි. | ... | ... කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය |

3. සම්මේලන වාර්තාකිරීමේ පරීක්ෂණයට ඇතුළු වීම පිණිස ඉහත සඳහන් කාර්යක්ෂමතා කඩ-ඉම් පරීක්ෂණයේ දී සුදුසුකම් ලබා ඇති නිලධාරීන් ද, එම පරීක්ෂණයට ඇතුළු වීම පිණිස මීට කලින් සුදුසුකම් ලබා ඇති අය ද, මීළඟ සම්මේලන වාර්තාකිරීමේ පරීක්ෂණයට ඇතුළු වීම සඳහා තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා මාර්ගයෙන් විභාග කොමසාරිස් වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් යැවෙන ලිපියකින් වහා ම ඉල්ලා සිටිය යුතු යි.

එ. ඊ. කුරේ,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්

1965 සැප්තැම්බර් මස 20 වැනි දින,
මහා භාණ්ඩාගාරයේ දී ය,
කොළඹ.

9—1066/4—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

භාණ්ඩාගාරයේ අංකය : 1/83/13/1 (ජී)

## ස්ථාන මාරුව සහිත ලසු ලේඛක සේවයේ පහළ ශ්‍රෙණියට අයත් ලසු ලේඛකයන් සඳහා වූ කාර්යක්ෂමතා කඩ-ඉම් (ඉංග්‍රීසි) පරීක්ෂණය—1965 ජූලි

1965.7.10 වැනි දින පවත්වන ලද, ස්ථාන මාරුව සහිත ලසු ලේඛක සේවයේ පහළ ශ්‍රෙණියට අයත් ලසු ලේඛකයන් ගේ වාර්ෂික වේතනය රු. 2,940ක් වීමට පෙර ඇති කාර්යක්ෂමතා කඩ-ඉමෙන් උසස්කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයෙන් පහත සඳහන් ලසු ලේඛක/ලේඛිකාවන් ඔවුන් ගේ නම් ඉදිරියෙන් සඳහන් විෂයයෙන්/විෂයයන්ගෙන් සමත් වී ඇති බව මෙයින් දනුම් දෙමි :—

| නම | දෙපාර්තමේන්තුව | විෂයයන් |
|---|---|---|
| ආරියරත්න, ක. මු. ... ... ... ... | සෞඛ්‍ය ... | ... ඉංග්‍රීසි |
| ඩේවිඩ්, රෙ. ෆේලා. එ. අ. (මෙනවිය) ... ... ... | කෘෂිකර්ම ... | ... ලසු ලේඛනය, දෙමළ හා ඉංග්‍රීසි |
| ජයසිංහ, වා. ය. ර. ... ... ... ... | පළාත්පාලන අමාත්‍යාංශය | ... ලසු ලේඛනය |
| පතිරත්න, සු. ... ... ... ... | පොලිස් ... | ... සිංහල |
| සෙනවිරත්න, වා. ජ. මු. රො. ක්ලෝ. ර. ... ... ... | ප්‍රවෘත්ති හා ගුවන් විදුලි | ... ලසු ලේඛනය |

(2) පහත සඳහන් අපේක්ෂකයින් ද සම්මේලන වාර්තාකිරීමේ පරීක්ෂණයට ඇතුළත් කර ගැනීම සඳහා දන් සුදුසුකම් ලබා ඇත :—

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| ඩේවිඩ්, රෙ. ෆ්ලො. එ. අ. (මෙනවිය) ... | කෘෂිකර්ම |
| ජයසිංහ, වා. ය. ර. ... ... | පළාත්පාලන අමාත්‍යාංශය |
| සෙනවිරත්න, වා. ජ. මු. රො. ක්ලෝ. ර. ... | ප්‍රවෘත්ති හා ගුවන් විදුලි |

(3) සම්මේලන වාර්තාකිරීමේ පරීක්ෂණයට ඇතුළුවීම පිණිස ඉහත සඳහන් කාර්යක්ෂමතා කඩ ඉම් පරීක්ෂණයේ දී සුදුසුකම් ලබා ඇති නිලධාරීන්ද, එම පරීක්ෂණයට ඇතුළුවීම පිණිස මීට කලින් සුදුසුකම් ලබා ඇති අය ද, මීළඟ සම්මේලන වාර්තාකිරීමේ පරීක්ෂණයට ඇතුළුවීම සඳහා තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාගේ මාර්ගයෙන්, විභාග කොමසාරිස් වෙත ලියා පදිංචි කළ තැපෑලෙන් යැවෙන ලිපියකින් වහාම ඉල්ලා සිටිය යුතුයි.

එ. රී. කුරේ,
අතිරේක භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්.

1965 සැප්තැම්බර් මස 20 වැනි ද,
කොළඹ,
මහා භාණ්ඩාගාරයේ දී ය.

9–1066/5—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

භාණ්ඩාගාර අංකය : 1/83/13/1 (ජී)

## ස්ථාන මාරුව සහිත ලසු ලේඛක සේවයේ පහළ ශ්‍රෙණියට අයත් ලසු ලේඛකයන් සඳහා වූ කාර්යක්ෂමතා කඩ-ඉම් (විශෙෂ) ඉංග්‍රීසි විභාගය—1965 ජූලි

1965.7.10 වැනි දින පවත්වන ලද ස්ථාන මාරුව සහිත ලසු ලේඛක සේවයේ පහළ ශ්‍රෙණියට අයත් ලසු ලේඛකයන්ගේ වාර්ෂික වේතනය රු. 2,940ක් වීමට පෙර ඇති කාර්යක්ෂමතා කඩ-ඉමෙන් උසස් කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ (විශෙෂ) පරීක්ෂණයේ දී පහත සඳහන් ලසු ලේඛකයා ද ඔහු ගේ නම ඉදිරියෙන් සඳහන් විෂයයන් ගෙන් සමත්වී ඇති බව මෙයින් දනුම් දෙමි :—

| නම | දෙපාර්තමේන්තුව | විෂයයන් |
|---|---|---|
| ප්‍රනාන්දු, ජා. ම. ... ... ... ... | නාවික ... | ... ලසු ලේඛනය හා ඉංග්‍රීසි |

(2) පහත සඳහන් අපේක්ෂකයා ද සම්මේලන වාර්තාකිරීමේ පරීක්ෂණයට ඇතුළත් කරගැනීම සඳහා දන් සුදුසුකම් ලබා ඇත :—

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| ප්‍රනාන්දු, ජා. ම. ... ... ... | නාවික |

(3) සම්මේලන වාර්තාකිරීමේ පරීක්ෂණයට ඇතුළුවීම පිණිස ඉහත සඳහන් කාර්යක්ෂමතා කඩ-ඉම් පරීක්ෂණයේ දී සුදුසුකම් ලබා ඇති නිලධාරියා ද, එම පරීක්ෂණයට ඇතුළුවීම පිණිස මීට කලින් සුදුසුකම් ලබා ඇති අය ද, මීළඟ සම්මේලන වාර්තාකිරීමේ පරීක්ෂණයට ඇතුළුවීම සඳහා තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාගේ මාර්ගයෙන්, විභාග කොමසාරිස් වෙත ලියා පදිංචි කළ තැපෑලෙන් යැවෙන ලිපියකින් වහාම ඉල්ලා සිටිය යුතුයි.

එ. රී. කුරේ,
අතිරේක භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්.

1965 සැප්තැම්බර් මස 20 වැනිද,
කොළඹ,
මහා භාණ්ඩාගාරයේ දී ය.

9—1066/6—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

භාණ්ඩාගාර අංකය : 1/23/7/12 (ජී).

## යතුරු ලේඛක සේවයට බඳවා ගැනීමේ (දෙමළ) විභාගය—1965 නොවැම්බර්

**විභාගය පවත්වන දින :**

යතුරු ලේඛක සේවයට බඳවා ගැනීමේ තරඟ විභාගයක්, දෙමළෙන් ටයිප් ගැසීම මැනවින් දත් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේ ම අපේක්ෂකයන් සඳහා 1965 නොවැම්බර් මස 13 වැනි දින සිට විභාග කොමසාරිස් විසින් පහත සඳහන් මධ්‍යස්ථානයන්හි දී පවත්වනු ලැබේ :—

කොළඹ, යාපනය, වව්නියාව, ත්‍රිකුණාමලය, මඩකලපුව.

අපේක්ෂකයන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති කිසියම් මධ්‍යස්ථානයක් වේනොත් එම මධ්‍යස්ථානය අවලංගු කෙරෙනු ඇත.

2. **සේවා කොන්දේසි :**

(i) සාමාර්ථය ලද පිරිමි අපේක්ෂකයින්, පත්වීමේ දින සිට තුන් අවුරුදු කාලයක ආධුනිකත්වය මත මෙම සේවයට පත් කරනු ලැබේ. ඔවුන්ගේ තනතුරු විශ්‍රාම වැටුප් සහිතය.

(ii) සාමාර්ථය ලද අපේක්ෂිකාවන් මුල් අවස්ථාවේ දී පත් කරනු ලබන්නේ පත්වීමේ දින සිට තුන් අවුරුදු කාලයක පරික්ෂාවකට යටත් කොට ය. මේ කාලය තුළ ඔවුන් විසින් අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය. දශ වර්ෂයක සේවය සම්පූර්ණ කිරීමට පෙර, ඕනෑම විටක දී මොවුන්ට විශ්‍රාම වැටුප් හිමි කාර්‍ය මණ්ඩලයට ඇතුළු වීමට කැමැත්ත ප්‍රකාශ කිරීමට හිමිකම ඇත්තේ ය. මෙසේ කැමැත්ත ප්‍රකාශ කළ පසු එය පසුව අස්කර ගත නොහැකිය. පරීක්ෂණ කාලය තුළ දී මෙසේ කැමැත්ත ප්‍රකාශ කරන අපේක්ෂිකාවෝ ඉන්පසු ආධුනිකත්වයෙහි තබනු ලැබෙත්. මේ ආධුනික කාලය ඔවුන්ගේ පරීක්ෂණ කාලය වන තුන් අවුරුද්දෙන් ඉතිරි වී තිබෙන කොටස ය.

(iii) මේ විභාගයේ ප්‍රතිඵල අනුව යතුරු ලේඛක සේවයට පත් කරනු ලබන අය ස්ථාන මාරු කිරීම්වලට යටත් ය. එසේ ම ලංකාවේ ඕනෑ ම ස්ථානයකට පත් කොට යවනු ලැබීමට ද යටත් වෙති.

(iv) මේ විභාගයෙන් සාමාර්ථය ලබන රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා "නව ප්‍රවේශක" සංඛ්‍යාවෙහි ලා සලකනු ලබන අය, 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලට ද, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවතින හෝ මතුවට පැණවෙන නීතිරීති සහ ව්‍යවස්ථාවලට ද අනුකූලව ක්‍රියා කළ යුතුය. තව ද, ඔවුන් සිය ආධුනික/පරීක්ෂණ කාලය තුළ දී රාජ්‍ය භාෂාව වූ සිංහලෙන් වැඩ කිරීමේ දැනුමක් ලබා ගත යුතු ය. ආධුනික/පරීක්ෂණ කාල සීමාව අවසානයේ දී පත්වීම් ස්ථිර කරනු ලබන්නේ ඔවුන්ගේ වැඩ සහ හැසිරීම් සතුටුදායක වී පත්වීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් සමත් වූ විට ය.

(v) තව ද, සාමාර්ථය ලද "නව ප්‍රවේශක" නිලධාරීන් ඔවුන්ගේ වාර්ෂික වැටුප රු. 1,320 පියවර ඉක්මවීමට පෙර, පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගය ප්‍රමාණයේ සිංහල භාෂාව පිළිබඳ කාර්‍යක්ෂමතා කඩඉම් පරීක්ෂණයකින් සමත් විය යුතු ය. නියමිත කාලය තුළදී එකී පරීක්ෂණයකින් අසමත් වුවහොත්, ඊළඟට යෙදෙන වාර්ෂික වැටුප් වැඩිවීම පමා කරනු ලැබේ.

(vi) අතිරේක දීමනා සහ සේවාවේ වෙනත් කොන්දේසි දැන ගැනීම සඳහා මේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡෙදයේ මුල පළවන රජයේ සේවයේ තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් යෙදෙන සාමාන්‍ය කොන්දේසි බැලිය යුතු ය.

(vii) යතුරු ලේඛක සේවය සාමාන්‍ය ලිපිකාර සේවයේ කොටසක් නොවේ. එහෙයින් එම සේවයේ නිලධාරීන්ට සාමාන්‍ය ලිපිකාර සේවයේ ප්‍රධායක ලිපිකාර පන්තියට උසස්වීම සඳහා පවත්වනු ලබන විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නො ලැබේ.

(viii) මේ විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීම් ලබන අය, තමන් පත් කරනු ලබන රජයේ කාර්‍යාලයක තිබෙන ඕනෑම දෙමළ යතුරු පුවරුවකින් සමන්විත යතුරු ලියනයක විනාඩියකට වචන 20ක වේගයෙන් යතුරු ලිවීම කළ යුත්තා හ.

3. **වැටුප් ක්‍රමය :**

මේ විභාගයෙන් සමත්වන අය, වර්ෂයකට රු. 960න් පටන්ගෙන වර්ෂයකට රු. 72 බැගින් වූ වැටුප් වැඩිවීම්වලින් රු. 2,688 තෙක් නගින්නා වූ වැටුප් ක්‍රමයක් සහිත යතුරු ලේඛක සේවයට පත් කරනු ලබන්නාහ. මෙම වැටුප් ක්‍රමයෙහි රු. 1,320, රු. 1,608 සහ රු. 2,184 යන වාර්ෂික වැටුපට පෙර කාර්‍යක්ෂමතා කඩඉම් පැවැත්වේ.

4. **සුදුසුකම් සාමාන්‍ය කොන්දේසි :**

(i) අපේක්ෂකයෝ යහපත් චරිතයෙන් යුක්ත විය යුත්තා හ.

(ii) අපේක්ෂකයෝ ලාංකිකයෝ විය යුත්තාහ *

(iii) අපේක්ෂකයන්ට පහත දැක්වෙන සහතිකවලින් යටත් පිරිසෙයින් එකක්වත් තිබිය යුතුය :—

(අ) ලංකා පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය ;
(ආ) ලන්ඩන් මැට්‍රිකියුලේෂන් සහතිකය හෝ කේම්බ්‍රිජ් සීනියර් සහතිකය ;
(ඇ) ලංකා ජ්‍යෙෂ්ඨ ගෘහ විද්‍යා සහතිකය ;
(ඈ) විභාග දෙපාර්තමේන්තුවේ සිංහල වාණිජ සහතිකය ;
(ඉ) සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව, අංක ගණිතය හෝ ශුද්ධ ගණිතය හෝ මූලික ගණිතය හෝ වාණිජ අංක ගණිතය සහ තවත් විෂයයන් සතරකින් එක අවස්ථාවක දී විෂයයන් පහකට නො අඩුවෙන් සාමාර්ථය ලබා ඇති අධ්‍යයන පොදු සහතිකය (සාමාන්‍ය පෙළ) ;
(ඊ) ලංකාවේ අපේක්ෂකයන්ට නියමිත පරිපාටිය යටතේ ලන්ඩන් වාණිජ මණ්ඩලයේ (London Chamber of Commerce) වාණිජ අධ්‍යයන සහතිකය (විදේශ) (සාමාන්‍ය වාණිජ කොට්ඨාශය හෝ ලඝු ලේඛක යතුරු ලේඛකයන්ගේ කොට්ඨාශය) හෝ උසස් වාණිජ අධ්‍යයන සහතිකය (විදේශ) (සාමාන්‍ය වාණිජ කොට්ඨාශය හෝ ලඝු-ලේඛක යතුරු ලේඛකයන්ගේ කොට්ඨාශය);
(උ) ලංකා වාණිජ මණ්ඩලය (Ceylon Chamber of Commerce) සහ ලංකා අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් ප්‍රදානය කරන ලද, වාණිජ අධ්‍යයන සහතිකය (සාමාන්‍ය වාණිජ කොට්ඨාශය හෝ ලඝු ලේඛක යතුරු ලේඛකයන්ගේ කොට්ඨාශය) හෝ උසස් වාණිජ අධ්‍යයන සහතිකය (සාමාන්‍ය වාණිජ කොට්ඨාශය හෝ ලඝු ලේඛක යතුරු ලේඛකයන්ගේ කොට්ඨාශය) ;
(ඌ) ලංකා කාර්මික විද්‍යාලයේ (ගණන් තබන්නන් සඳහා වූ හෝ ලඝු ලේඛන යතුරු ලේඛකයන් සඳහා වූ) වාණිජ සහතිකය හෝ උසස් වාණිජ සහතිකය.

**සැළකිය යුතුයි.**—මෙම විභාගයට අයදුම් පත් භාර ගැනීමේ අවසාන දිනයට පළමු ව ප්‍රතිඵල පිට නොවී ඇති ඉහත කී කවර විභාගයකට හෝ පෙනී සිටි අපේක්ෂකයන්ගේ අයදුම් පත් භාර ගනු නොලැබේ.

(iv) 1965 නොවැම්බර් මස 1 වැනි දිනට අපේක්ෂකයන්ගේ වයස අවුරුදු 17ට නො අඩුවත් අවුරුදු 26 ට නො වැඩිවත් පැවතිය යුතු ය.

* ආණ්ඩුවේ සේවයට බඳවා ගැනීමේ සියළු අවස්ථාවන් සඳහා "ලාංකික" යන වචනය විග්‍රහ කරනුයේ උත්පත්තියෙන් හෝ ලියා පදිංචි වීමෙන් හෝ ලංකාවේ පුරවැසියන් වූවන් වශයෙනි.

5. **සුදුසුකම් :**

ලංකාවේ පිහිටි එක්සත් රාජධානියට අයත් සේවාවන්හි නියුක්ත වූ එහෙත් හේවා වසමට අයත් නොවන සේවකයන්ට හා යුද හමුදාවන් හි යෙදී සිටි සේවා මුක්ත වූවන් ට ද දෙනු ලබන විශේෂ අනුග්‍රහ :—

(i) එක්සත් රාජධානියට අයත් සේවාවන්හි යෙදී සිට 1956 ජූලි මස 6 වැනි දින හෝ ඉන් පසු ව හෝ සේවයෙන් ඉවත් කරනු ලැබූ හේවා වසමට අයත් නොවන ලාංකික සේවකයන් හෝ යුද කඳවුරු ආපසු ගැනීමට ආණ්ඩුව විසින් කරන ලද තීරණය නිසා සේවයෙන් ඉවත් කරනු ලැබීමට භාජනව සිටින අය ද ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පිහිටි පෙරියකරච්චියට, නාරාහේන්පිට පිහිටි රාජකීය නාවික ගුවන් විදුලි මධ්‍යස්ථානය (ඇන්ඩර්සන් ගුවන් විදුලි මධ්‍යස්ථානය) ගෙන යාමට ආණ්ඩුව මගින් කරන ලද තීරණය හේතු කොට ගෙන 1954 සැප්තැම්බර් මස 27 වැනි දිනට පසු ව සේවයෙන් ඉවත් කරන ලද අය ද, පහත දැක්වෙන අනුග්‍රහ ලැබීමට සුදුස්සෝ වෙති :—

(අ) මෙම ගණයට අයත් අපේක්ෂකයන්ට මෙහි 4 වැනි ඡෙදයෙහි (iv) කොටසෙහි නියමිත ව ඇති වයස් සීමාව ගණන් ගැනීමේ දී තමන් එක්සත් රාජධානියට අයත් සේවාවන්හි සේවය කළ කාල සීමාව තම වයසින් අඩු කිරීමට ඉඩ දෙනු ලැබේ. එහෙත් එසේ කිරීමට ඉඩ දෙනු ලබන්නේ ඔවුන්ගේ සේවා කාලය අඛණ්ඩව ද, සතුටුදායක ව ද පැවැතියේ නම් පමණකි.

(ආ) 1965 ඔක්තෝබර් මස 1 වැනි දිනට හෝ ඉන් පෙර හෝ එක්සත් රාජධානියේ සේවාවන් යටතේ යටත් පිරිසෙයින් සිව් අවුරුද්දක සතුටු දයක අඛණ්ඩ සේවයක් සපුරා සිටි, එහෙත් 4 වැනි ඡෙදයෙහි (iii) වැනි කොටසේ දක්වන ලද අධ්‍යාපන සුදුසුකම් නොමැති අයට ඉදින් තමන් 7 (iii) වැනි ඡෙදයෙහි (ආ) (i) කොටස යටතේ සඳහන් වුණු විභාගවලින් යටත් පිරිසෙයින් එකකින්වත් සාමාර්ථ්‍යය ලැබ ඇතොත් මෙම විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

(ii) යුද හමුදාවන්හි යෙදී සිටි සේවා මුක්ත වූ අය පහත දක්වෙන අනුග්‍රහ ලැබීමට සුදුස්සෝ වෙති :—

(අ) මෙහි 4 වැනි ඡෙදයෙහි (iv) වැනි කොටසෙහි දක්වන ලද වයස් සීමාව ගණන් ගැනීමේ දී අවඥ සහගත ලෙස සේවයෙන් නෙරපන ලද හෝ සේවයෙන් පහකරන ලද හෝ අවඥ සහගත ලෙස සේවයෙන් නිදහස් කරන ලද හෝ කිසියම් දුරාචාරී බවක් නිසා සේවයෙන් අස් වීමට සිදු වූ හෝ තැනැත්තන් හැර, සේවා මුක්ත වූ අනායයන්ට හෙවත් උප සේවකයන්ට හෝ නිලධරයන්ට හෝ හේවායන්ට හෝ තමන් ස්ථිර හමුදාවේ සේවය කළ කාලසීමාව තම වයසින් අඩු කිරීමට ඉඩ දෙනු ලැබේ.

(ආ) අවුරුදු 4කට නො අඩු කාලයක් නිත්‍ය භට හමුදාවේ යෙදී සිටි, එහෙත් මෙහි 4 වැනි ඡෙදයෙහි (iii) වැනි කොටසෙහි දක්වන ලද අධ්‍යාපන සුදුසුකම් නොමැති අයට ඉදින්, තමන් 7 (iii) ඡෙදයෙහි (ආ) (i) කොටස යටතේ සඳහන් කරන ලද විභාගයන් අතුරෙන් යටත් පිරිසෙයින් එකකින් වත් සාමාර්ථය ලබා ඇතොත් මෙම විභාගයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

**6. සුදුසුකම්—සේවක සංඛ්‍යාව අඩු කිරීම සඳහා අස් කරනු ලැබූ ආණ්ඩුවේ සේවකයන්ට දෙන ලද විශේෂ අනුග්‍රහ:**

ස්ථිර වූ හෝ තාවකාලිකවූ හෝ නිලයක යෙදී ආණ්ඩුවේ සේවය කළ එහෙත්, ස්වකීය වැඩ හෝ හැසිරීම අසතුටුදායක වීම නිසා නොව, අන්‍ය වූ හේතුන් නිසා සේවයෙන් නවතාලීමට භාජන වූ අය පහත දක්වෙන අනුග්‍රහ ලැබීමට සුදුස්සෝ වෙති :—

4 වැනි ඡෙදයෙහි (iv) වැනි කොටසෙහි දක්වුණු වයස් සීමාව ගණන් බැලීමේ දී සේවයෙන් පහකරනු ලැබීමෙන් හෝ වැඩ අසතුටුදායක වීමේ හේතුවෙන් හෝ ඉල්ලා අස්වීම නිසා හෝ ආණ්ඩුවේ සේවයෙන් අස්වුණු අය හැර අන්‍යයන්ට තමන් ආණ්ඩුව යටතේ සේවයෙහි යෙදී සිටි කාලසීමාව තම වයසින් අඩුකර ගැනීමට අවසර දෙනු ලැබේ.

**7. සුදුසුකම්—රජයේ සේවකයන්ට විශේෂ අනුග්‍රහ :**

(i) **පිටපත් කරන්නෝ සහ යතුරු ලිවීමේ ලිපිකරුවෝ.**—1965 ඔක්තෝබර් මස 1 වැනි දිනට දෑවුරුද්දකට නො අඩු ස්ථිර සේවයක් ඇති, පිටපත් කරන්නන්ට හා යතුරු ලිවීමේ ලිපිකරුවන්ට ද, 1965 නොවැම්බර් මස 1 වැනි දිනට ඔවුන්ගේ වයස අවුරුදු 45ට නොවැඩි නම්, අධ්‍යාපන සුදුසුකම් ගැන නො සලකා මෙම විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

(ii) **ස්ථිර සේවකයෝ.**—රජයේ සේවයෙහි ස්ථිර තනතුරු දරන, එහෙත් 7 වැනි ඡෙදයේ (i) වැනි කොටස යටතේ දෙනු ලබන අනුග්‍රහයන්ට සුදුසුකම් ලබා නොමැති පහත සඳහන් (අ) සහ (ආ) වර්ගවලට අයත් නිලධාරීන්ට මෙම විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ :

(අ) 1965 ඔක්තෝබර් මස 1 වැනි දිනට සේවයෙහි යෙදී සිටින පහත සඳහන් සුදුසුකම්වලින් යුක්ත අය :—

(1) ඔවුන් විසින් 4 වැනි ඡෙදයේ (iii) වැනි කොටසෙහි දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් ලබා තිබිය යුතු ය.
(2) 1965 නොවැම්බර් මස 1 වැනි දිනට අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
(3) යතුරු ලේඛක සේවයට පත් කිරීමට තෝරා ගනු ලැබුවහොත්, එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් ස්වකීය දෙපාර්තමේන්තුවලින් ඔවුන් මුදා හැරීමට කැමති විය යුතු ය.

(ආ) 1965 ඔක්තෝබර් මස 1 වැනි දිනට අනන්ත පූර්වයෙන් ආණ්ඩුව යටතේ යටත් පිරිසෙයින් අවුරුදු 4ක අඛණ්ඩ සේවයක් සපුරා සිටින පහත සඳහන් සුදුසුකම්වලින් යුක්ත වූ අය :

(1) ඔවුන් පහත දක්වා ඇති, විභාගවලින් යටත් පිරිසෙයින් එකකින්වත් සාමාර්ථය ලබා සිටිය යුතු ය :—

(අ) කේම්බ්‍රිජ් ජූනියර් සහතිකය ;
(ආ) අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාඨශාලා කණිෂ්ඨ සහතිකය ;
(ඇ) අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද පාඨශාලාවක කණිෂ්ඨ සහතිකය ;

(2) 1965 නොවැම්බර් මස 1 වැනි දිනට වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය.

(3) යතුරු ලේඛක සේවයට පත් කිරීමට තෝරා ගනු ලැබුවහොත්, එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් ස්වකීය දෙපාර්තමේන්තුවලින් ඔවුන් මුදා හැරීමට කැමති විය යුතුය.

**සංලක්ෂ්‍යය**—(අ) මෙම විභාගයෙන් සාමාර්ථය ලබන ඉහත දක්වෙන (i) සහ (ii) වර්ගවලට අයත් වන 1956 සැප්තැම්බර් මස 24 වැනි දිනට පළමු ව පත් කරන ලද, නිලධාරීන් රජයේ භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා ''ආදි ප්‍රවේශකයන්'' වශයෙන් සලකනු ලැබේ.

(ආ) 7 වැනි ඡෙදයේ (ii) (අ) සහ (ආ) කොටස් යටතේ දුම්රිය, තැපැල්, මිනින්දෝරු, ආරෝග්‍යශාලා හා රේගු වැනි දෙපාර්තමේන්තු ගත ලිපිකාර සේවාවන්ට අයත් නිලධාරීන්ට මෙම විභාගයට පෙනී සිටීමට නොහැකි වේ. එසේ වුව ද, දනට නිලධාරීන් බඳවා ගැනීම නවතා ඇති දෙපාර්තමේන්තු ගත ලිපිකාර සේවාවන්හි නියුක්තව සිටින ලිපිකරුවන්ට මෙම විභාගයට පෙනී සිටීමට අවසර තිබේ.

(iii) **තාවකාලික සේවකයෝ.**—රජයේ සේවයෙහි තාවකාලික තනතුරු දරන පහත සඳහන් (අ) සහ (ආ) වර්ගවලට අයත් නිලධාරීන්ට මෙම විභාගයට පෙනීසිටීමට ඉඩ දෙනු ලැබේ :

(අ) 1965 ඔක්තෝබර් මස 1 වැනි දිනට අනන්ත පූර්වයෙන් ආණ්ඩුව යටතේ යටත්පිරිසෙයින් අවුරුද්දක අඛණ්ඩ සේවයක් සපුරා සිටින පහත සඳහන් සුදුසුකම්වලින් යුක්ත අය :—

(i) ඔවුන් විසින් 4 වැනි ඡෙදයේ (iii) වැනි කොටසෙහි දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් ලබා තිබිය යුතු ය.
(ii) 1965 නොවැම්බර් මස 1 වැනි දිනට වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය.

(ආ) 1965 ඔක්තෝබර් මස 1 වැනි දිනට අනන්ත පූර්වයෙන් ආණ්ඩුව යටතේ යටත් පිරිසෙයින් අවුරුදු 4ක අඛණ්ඩ සේවයක් සපුරා සිටින පහත සඳහන් සුදුසුකම්වලින් යුක්ත අය :—

(i) ඔවුන් විසින් 7(ii) වැනි ඡෙදයේ (ආ) (i) කොටසෙහි දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් ලබා තිබිය යුතු ය.
(ii) 1965 නොවැම්බර් මස 1 වැනි දිනට වයස අවුරුදු 45 ට නොවැඩිවිය යුතුය.

(iv) **අනියම් සේවකයෝ.**—1965 නොවැම්බර් මස 1 වැනි දිනට පෙරාතුව වූ අවුරුදු 5 තුළ අඩු ම ගණනේ මාස 6 ක් එක දිගට ම නොවූ වත්, සේවය කොට ඇති පහත සඳහන් (අ) සහ (ආ) වර්ගවලට අයත් නිලධාරීන්ට, 1965 නොවැම්බර් මස 1 වැනි දිනට වයස අවුරුදු 45 ට නොවැඩි නම් මෙම විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ :—

(අ) ස්ථිර යතුරු ලේඛකයන් පත් වීම හේතු කොට ගෙන 1965 ජූනි මස 30 වැනි දින හෝ ඉන් පසුව හෝ සේවය නවත්වන ලද, අනියම් යතුරු ලේඛකයෝ ;
(ආ) දනට සේවයෙහි නියුක්ත අනියම් යතුරු ලේඛකයෝ.

**8. අයදුම් පත් :**

(i) මේ විභාගය සඳහා වූ ආදර්ශ අයදුම්පත් පෝරමයක් මේ නිවේදනය අග පළ කර ඇත. අයදුම්කරුවන් විසින් තමන්ගේ අයදුම්පත් ඊට අනුව ෆුල්ස්කැප් ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කරගත යුතු ය.

(ii) අයදුම්පත් 1965 ඔක්තෝබර් මස 6 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන්, කොළඹ 2, මැලේ වීදිය, තැ.පෙ. 1503, විභාග කොමසාරිස් වෙත ලැබෙන පරිදි ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතු ය.

එම දිනට පසුව ලැබෙන ඕනෑම අයදුම්පතක් භාර ගනු නො ලැබේ. අයදුම් පත්‍රය බහා එවන ලියුම් කවරයේ, වම් පස ඉහළ කෙළවරේ විභාගයේ නම හා තමා විභාගයට පෙනී සිටීමට කැමැති මධ්‍යස්ථානය පැහැදිලි ව සඳහන් කළ යුතු ය. (විභාගය පවත්වනු ලබන මධ්‍යස්ථාන මෙහි 1 වැනි ඡෙදයෙහි දක්වෙයි).

(iii) නියමානුකූලව අවලංගු කළ රුපියල් 20 ක මුද්දර අයදුම්පතෙහි අලවා තිබිය යුතු ය.

(iv) ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල දනට සේවයෙහි යෙදී සිටින අපේක්ෂකයන් විසින් එවනු ලබන අයදුම් පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තු වල ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය. 6 වැනි ඡෙදය යටතේ සුදුසුකම් ලබන අපේක්ෂකයන් විසින් සිය අයදුම් පත් එවිය යුත්තේ ඔවුන් අන්තිමට සේවය කළ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ මාර්ගයෙනි. එසේ නොකරන කිසියම් අයදුම්කරුවෙකු වෙතොත් ඔහු විභාගයට නුසුදුස්සකු කොට සලකනු ලැබේ. 1965 ඔක්තෝබර් මස 6 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් හෝ විභාග කොමිසාරිස් වෙත ලැබෙන පරිදි යවන ලෙස ඉල්ලීමකුත් සමඟ ස්වකීය අයදුම් පත් තමන්ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් වෙත කල් ඇති ව ඉදිරිපත් කරන මෙන් අයදුම්කරුවන්ගෙන් ඉල්ලනු ලැබේ.

විභාග කොමසාරිස්ගේ හෝ අන්‍ය නිලධාරියෙකු ගේ පුද්ගලික ලිපිනයට අයදුම් පත් නො එවිය යුතු ය.

9. විභාගයට ඇතුළත් කර ගැනීම :

(i) ලැබී ඇති ඉල්ලුම් පත්‍ර සම්බන්ධයෙන් ඒ ඒ අපේක්ෂකයා වෙත විභාග කොමසාරිස් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තමන්ගේ ප්‍රවේශ පත්‍ර විභාග මධ්‍යස්ථානය භාර පරිපාලන නිලධාරිතැන වෙත ඉදිරිපත් කළ යුතු ය. එවැනි ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නො කරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නො ලැබේ.

ඉල්ලුම්කරුවන් තමන් සඳහා නියම කර තිබෙන විභාග ශාලාවෙහි ම විභාගයට පෙනී සිටිය යුතුය. තමාට නියමිත විභාග ශාලාව හැර අන්‍ය විභාග ශාලාවක දී කිසිම අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නො ලැබේ.

ප්‍රවේශ පත්‍රය සමඟ කාල සටහනෙහි පිටපතක් ද අපේක්ෂකයන් වෙත යවනු ලැබේ. විභාගයට පෙනී සිටින්නා වූ සෑම අපේක්ෂකයකු විසින්ම විභාගය පවත්වන දිනයෙහි ස්වකීය ප්‍රවේශ පත්‍රය විභාග පරිපාලක වෙත භාර දිය යුතු ය.

සියළු ම විභාග අපේක්ෂකයින් විසින් පිළිපැදිය යුතු ව්‍යවස්ථා මාලාවක් මේ නිවේදනය අග පළවේ. අපේක්ෂකයෝ මෙම ව්‍යවස්ථාවන් පිළිපැදීමට බැඳී සිටිති.

යම්කිසි ඉල්ලුම්කරුවකුට විභාගයට කලින් (යටත් පිරිසෙයින් සත් දවසකට කලින්) තමාගේ ප්‍රවේශ පත්‍රය නො ලැබුණොත් ඔහු විසින් ඒ බව වහාම—

"කොළඹ 2,
තැ. පෙ. 1503,
මැලේ වීදිය,
විභාග කොමසාරිස්."

යන ලිපිනයට දැනුම් දිය යුතු යි. (විදුලි පණිවුඩ යවන ලිපිනය—"විභාග" කොළඹ, කියා වේ.) ප්‍රවේශ පත්‍රය නො ලැබුණු බව විභාග කොමසාරිස්ට දැනුම් දෙන අතරම, පහත සඳහන් තොරතුරුද සැපයිය යුතු යි:—

(1) විභාගයේ නම ;
(2) සම්පූර්ණ නම ;
(3) සම්පූර්ණ ලිපිනය ;
(4) විභාග මධ්‍යස්ථානය ;
(5) තැපැල් කන්තෝරුව, ලියා පදිංචි කළ අංකය සහ අයදුම් පත තැපැල් කළ දිනය ;

(ii) විභාගයට ඇතුලත් කර ගැනීම ඊට සුදුසුකම් පිළිගැනීමක් හැටියට කල්පනා නොකළ යුතු යි.

විභාග කොමසාරිස්ට ස්වකීය අභිමතය පරිදි කිසියම් අපේක්ෂකයකුට තාවකාලිකව විභාගයට පෙනී සිටීම පිණිස තාවකාලිකව අවසර දිය හැකි ය. එසේ දෙනු ලබන අපේක්ෂකත්වය පසුව ස්ථිර කරනු ලැබේ. නැතහොත් අවලංගු කරනු ලැබේ.

10. හැඳින්වීමේ පත්‍ර :

විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයෙකු විසින් ම විභාග ශාලාවේ දී විභාග පරිපාලකගේ සතුටට හේතුවන පරිදි සෑම විෂයයක් පාසා ම ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතු යි. මේ සඳහා පහත සඳහන් ලියවිලිවලින් ඕනෑම එකක් භාර ගනු ලැබේ :—

(අ) පෝස්ට්මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරනු ලබන හැඳින්වීමේ පත් ;

(ආ) විභාග දිනයට අවුරුදු 3 කට නො වැඩි කාලයක් ඇතුළත නිකුත් කරන ලද වලංගු ගමන් අවසර පත්‍රයක් (පාස්පෝට් බලපත්‍රය) ;

(ඇ) විභාග දිනයට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුලත ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත සංවිධානයක හෝ අධිකාරිත්වය යටතේ නිකුත් කරන ලද, අයිතිකරුගේ ඡායාරූපයක් ද සහිත සහතිකයක් හෝ බලපත්‍රයක් හෝ අන්‍ය ලියවිල්ලක් ;

(ඈ) අත්සන් පත්‍රය සහතික කිරීමට සුදුසුකම් ලබා ඇති අයකු විසින් පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක පසු පිටේ දෙන ලද පහත සඳහන් සහතිකයක් දරණ ඡායාරූපයක්.

පසු පිටෙහි සඳහන් ඡායාරූපය මෙහි අත්සන් කර ඇති ........................................(අයදුම්කරුගේ සම්පූර්ණ නම) යන අයගේ බව මම සහතික කරමි.

............................................................
අයදුම්කරුගේ පුරුදු අත්සන.

............................................................
අයදුම්කරුගේ අත්සන සහතික කරන අයගේ අත්සන.

............................................................
(නම සහ තරාතිරම)

දිනය : ........................

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නො හැකි ඉල්ලුම්කරුවකු ගේ අපේක්ෂකත්වය තාවකාලික ය. එම අපේක්ෂකත්වය විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකි ය.

11. සුදුසුකම් පිළිබඳ ලියවිලි :

(i) අයදුම් පත සමග වෙන කිසිම ලිපි ලේඛනාදියක් නො එවිය යුතු යි. එහෙත් නියම කොට ඇති පරිදි අවශ්‍ය සියලු ම විස්තර අයදුම් පතෙහි සඳහන් කළයුතු ය. මෙසේ අවශ්‍ය වන සියළුම කරුණුවලින් සම්පූර්ණ නොවන ඉල්ලුම් පත්‍රයක් වුවහොත් එය එහි අන්තර්ගත කරුණු උඩ පමණක් සලකා බලා ප්‍රතික්ෂෙප කරන්නට ඉඩ තිබේ.

(ii) සුදුසුකම් ලද අපෙක්ෂකයන් විසින් තමන් ගේ යෝග්‍යතාව, ලියකියවිලිවලින් ඔප්පු කළ යුතු ය. එබඳු වූ අපේක්ෂකයන් එම ලියකියවිලි, සම්මුඛ පරීක්ෂණයක් පැවැත් වුවහොත් එම අවස්ථාවේ දී ඉදිරිපත් කිරීම හෝ නො එසේ නම් විභාග කොමසාරිස් විසින් ඉල්ලා සිටි කල්හි අප්‍රමාදව ලියා පදිංචි කළ තැපෑලෙන් යැවීම හෝ කළ යුතු ය.

(iii) පහත දක්වෙන ලියකියවිලි අවශ්‍ය විය හැකි ය :—

(අ) යහපත් චරිතය පිළිබඳ වග කිව යුතු පුද්ගලයකු විසින් අත්සන් කරන ලද සහතිකයක්.

සංලක්ෂ්‍යය.—අපේක්ෂකයා ආණ්ඩුවේ හෝ උපකෘත පාඨශාලාවක අධ්‍යාපනය ලබමින් හෝ ආණ්ඩුවේ හෝ උපකෘත පාඨශාලාවකින් ළඟදී අස් වී හෝ සිටී නම් චරිත සහතිකය ලබාගත යුත්තේ එම පාඨශාලාවේ ප්‍රධානාචාර්යවරයාගෙනි. නො එසේ වන කල්හි එම සහතිකය සමාදාන විනිශ්චයකාරයෙක්, අධිනීතිඥ කෙනෙක්, නීතිඥ කෙනෙක් හෝ නොතාරිස් කෙනෙක්, ප්‍රාදේශීය ආදායම් නිලධාරියෙක් හෝ රුපියල් 2,400ක් හෝ ඉන් වැඩි වාර්ෂික වැටුපක් ලබන ආණ්ඩුවේ ස්ථිර නිලධාරියෙක් හෝ සාමාන්‍යයෙන් ප්‍රකට ව දන්නා, කෙළින් ම තොරතුරු ලබාගත හැකි තැනැත්තෙක් යන මොවුන්ගෙන් කවරකු ගෙන් වුව ද ලබාගත හැකි වේ. සහතිකය දෙන තැනැත්තා ගේ පදවි නාමය, නම හා ලිපිනය ද එහි පැහැදිලි සේ සඳහන් ව තිබිය යුතු ය.

ආණ්ඩුවේ ස්ථිර තනතුරක් උසුලන අපේක්ෂකයින් විසින් යහපත් චරිතය පිළිබඳ සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

(ආ) අපේක්ෂකයාගේ උප්පැන්නය ලියා පදිංචිකිරීමේ සටහනෙහි සහතික කළ පිටපතක්, හෝ උප්පැන්නය ලියාපදිංචි නොකළ අපේක්ෂකයන් සම්බන්ධයෙන් වූ විට, රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකයක්; කිසියම් අපේක්ෂකයකු හට ඉදිරිපත්කළ හැක්කේ අනුමාන වයස් සහතිකයක් පමණක් නම් එම අපෙක්ෂකයාගේ උපන් දිනය වශයෙන් සලකනු ලබන්නේ සහතිකයේ සඳහන් වර්ෂයේ ජූලි මස 1 වැනි දිනට ය.

සංලක්ෂ්‍යය.—(i) පාඨශාලාවල භාවිතය සඳහා හෝ අධ්‍යාපනික කටයුතු උදෙසා හෝ නිකුත් කරන ලද විශේෂ උප්පැන්න සහතික හෝ උප්පැන්න ලියා පදිංචි කිරීමේ සටහනෙන් උපුටාගත් සහතික කළ උද්ධෘත හෝ භාරගනු නො ලැබේ :

(ii) උප්පැන්න සහතික පත්‍ර වෙනුවට දිවුරුම් සහතික පත්‍ර හෝ බවුතීස්ම පත්‍ර භාර ගනු නොලැබේ

(iii) උප්පැන්න සහතිකයෙහි දක්වෙන නම/නම් හා අපේක්ෂකයා සාමාන්‍යයෙන් භාවිතා කරන එසේම ඔහු විභාගයේ දී පෙනී සිටින නම/නම් හා අතර වෙනසක් වේ නම්, යථායෝග්‍ය පරිදි උප්පැන්න හා මරණ ලියා පදිංචි කිරීමේ ආඥාපනතේ (110 වැනි පරිච්ඡේදයේ) අංක 27 හෝ 28 හෝ දරණ නියමයන් අනුව ස්වකීය උප්පැන්නයෙන් දක්වෙන නම වෙනස් කරවා ගැනීමට වහා ම කටයුතු කළ යුතු ය.

1957 අගෝස්තු මස 18 වැනි දින නිකුත් කරන ලද අංක 394 දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛයේ ප්‍රකාර ස්වකීය නම් වෙනස් කළ දනට ආණ්ඩුවේ තනතුරු දරණ අපේක්ෂකයන් උප්පැන්න සහතිකයේ ද තමන්ගේ නම් වෙනස් කරවා ගැනීමට ක්‍රියා කිරීම අවශ්‍ය නොවේ.

(ඇ) ලංකාවේ පුරවැසියෙකු වශයෙන් ලියා පදිංචිවීමේ සහතික පත්‍රයක් හෝ පරම්පරාවෙන් හිමි වූ පුරවැසි බවක් ඇති බැව් ආණ්ඩුව මගින් පිළිගත් බව දක්වෙන සහතිකයක් (උචිත ව පරිදි);

(ඈ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික පත් හෝ එසේ සහතික පත් නිකුත් කොට නැතහොත් ඊට අදල වූ වෙනත් රාජකාරි ලියවිල්ලක් (උදහරණය—පෞද්ගලික අපේක්ෂකයන් වෙත නිකුත් කරන ලද ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයේ ප්‍රතිඵල පත්‍රිකාව හෝ අපේක්ෂකයාගේ පාඨශාලාවේ ප්‍රධානයාගෙන් ලබාගත් ලිපියක්.);

(ඉ) ජේවා පන්නයට අයත් නොවූ සේවකයකු වශයෙන් ලංකාවේ පිහිටි එක්සත් රාජධානියට අයත් සේව වන්හි කරන ලද සේවය පිළිබඳ මුල් සහතිකය හෝ යුද හමුදවේ සේවයෙහි යෙදී සිටි බවට ලබාගත් සහතිකය (මෙය අවශ්‍ය වන්නේ මෙහි 5 වැනි ඡේදයෙහි දක්වුණු අපේක්ෂකයන් කෙරෙහි ය.)

(ඊ) ආණ්ඩුවේ සේවය පිළිබඳව ලබාගත් සහතිකය (මෙය අවශ්‍ය වන්නේ මෙහි 6 වැනි ඡේදයෙහි දක්වුණු අපෙක්ෂකයන් සම්බන්ධයෙනි);

(උ) හැඳින්වීමේ පත්‍රය (සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වේ නම් ඒ සඳහා ද මෙය රැගෙන ආ යුතුය).

(iv) විභාගයට ඉල්ලුම් කරන අවස්ථාවේ දී වුවමනා සියළු ම ලියකියවිලි සූදනම් ව තබා ගන්නා ලෙස අපෙක්ෂකයන්ට අවවාද කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වේ නම් ඒ අවස්ථාවේ දී අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කරන්ට අපොහොසත් වන හෝ විභාග කොමසාරිස් විසින් ඉල්ලා සිටි කල්හි ඒවා ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන හෝ අපේක්ෂකයකු වෙතොත් ඔහු ගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

12. අසත්‍ය තොරතුරු සැපයීම ගැන දඬුවම් :

මෙම විභාගයේ රෙගුලාසි අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පැවැත්වෙද්දී හෝ ඉන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

අපේක්ෂකයෙකු විසින් ඔහු දැනුවත්ව ම අසත්‍ය තොරතුරක් සපයා ඇති බවක් හෝ කිසියම් වැදගත් කාරණයක් සිතා මතා ම යටපත් කළ බවක් හෝ එසේ නැතහොත්, ඔහු මෙම විභාගයට පෙනී සිටීමට නුසුදුස්සෙකුව සිටි බව ඔහුගේ සේවා කාලය තුළ කිසියම් අවස්ථාවක දී ඔප්පු වුවහොත් ඔහු වහා සේවයෙන් පහකිරීමට හේතුවනු ඇත.

13. මුදල් ආපසු ගෙවීම :

කිසිම කරුණක් නිසා හෝ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය වෙනුවෙන් ගෙවන ලද ගාස්තු වෙන කිසිම විභාගයක් සඳහා මාරු කළ හැකි නොවේ.

14. රජයේ නිලධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා නිවාඩු :

විභාග කොමසාරිස් විසින් අනුමත කරන ලද අයදුම් පත් ඇති, රජයේ නිලධාරීන්ට මෙම විභාගයට පෙනී සිටීමට සඳහා ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නිවාඩු (රාජකාරි නිවාඩු නොවේ) දිය යුතු ය.

15. විභාග පටිපාටිය :

විභාග සඳහා ඇති විෂයයන් සහ එක් එක් විෂයය වෙනුවෙන් නියමිත ලකුණු පහත දැක්වේ. නරක අකුරු සහ අක්ෂර වින්‍යාස දෝෂ වෙනුවෙන් ලකුණු අඩුකරනු ලැබේ. නොපැහැදිලි අකුරු ඇති අපෙක්ෂකයන් නුසුදුස්සන් ලෙස සැලකීමට ඉඩ තිබේ.

| | ලකුණු |
|---|---|
| (i) දෙමළ වාක්‍ය රචනය—පැය 1යි ... ... ... ... | 100 |
| (ii) දෙමළ යතුරු ලිවීම—අඩුම වේගය විනාඩියකට වචන 20 බැගින් ටයිප් ගැසීම, විනාඩි 20යි ... | 150 |
| (iii) සාමාන්‍ය හා ප්‍රාදේශීය දැනීම—විනාඩි 30යි ... ... ... | 50 |
| (iv) සාමාන්‍ය බුද්ධි පරීක්ෂණය—විනාඩි 30යි ... ... ... | 50 |

සැලකිය යුතුයි.—(i) පරීක්ෂණය පැවැත්වෙන දින දී ප්‍රයෝජනය සඳහා තමන් ගේම යතුරු ලියන යන්ත්‍ර රැගෙන ආ යුතුයි.

(ii) එසේ කළ නොහැකි අපෙක්ෂකයන්ට තම තමන් අනරේ එක යතුරු ලියන යන්ත්‍රයක් පාවිච්චි කිරීමට පිළියෙල කර ගැනීමට ඉඩ දෙනු ලැබේ. එක්දිනක දී එක යතුරු ලියන යන්ත්‍රයක් ප්‍රයෝජනයට ගැනීම සඳහා පිළියෙල කරගන්නා අපෙක්ෂකයන්ගේ ගණන හතරකට වැඩි විය යුතු නොවේ. එසේ කරන අපේක්ෂකයන් ඔවුන් අතුරෙන් පළමුවෙන් යතුරු ලිවීමේ පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුතු අපෙක්ෂකයාට නියම දිනයෙහි දී විභාගය පටන් ගැනීමට ප්‍රථම විභාග මධ්‍යස්ථානයේ පරිපාලක නිලධාරියා වෙත දැනුම් දිය යුතු ය. එක් එක් අපෙක්ෂකයාට නියම වී ඇති දිනය නොතකා එම අපෙක්ෂකයන් සියල්ල ම එක දිනයෙහි ම විභාග මධ්‍යස්ථානයේ පරිපාලන නිලධාරියා පරීක්ෂණය කරනවා ඇත. ඒ සම්බන්ධව යොදාගෙන ඇති වැඩ පිළිවෙල පිළිබඳ ව අපෙක්ෂකයන් විසින් අන් දැන්වීමක් දීම වුවමනා නොවේ.

(iii) මෙම විභාගය සඳහා පෙනී සිටින, 1965 නොවැම්බර් මස 12 වැනි දින වන විට සිය පත්වීම් ස්ථිර කර ඇති රජයේ සියළුම නිලධාරීන් තමන් ගේ විභාග ශාලාව වෙත කාර්යාලයීය යතුරු ලියන යන්ත්‍ර රැගෙන යාමට දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් අවසර දෙනු ලැබේ. එහෙත් මෙම අනුග්‍රහයෙන් ප්‍රයෝජනය ගන්නා සෑම නිලධාරියෙකුගෙන් ම යතුරු ලියන යන්ත්‍ර සුරක්ෂිතව ආපසු භාරදෙන බවටත් ඒවා පරිහරණය කිරීමේ දී සිදුවන අලාභ හානි ආදියක් වේ නම් ඒවාට වගකියන බවටත් ලිඛිත ප්‍රකාශයක් දෙපාර්තමේන්තු ප්‍රධානයා විසින් ලබාගත යුතුය.

(iv) ඉහත (ii) ඡේදය යටතේ දී ඇති අවසරය හැරුණු විට තමාගේ යතුරු ලිවීමේ පරීක්ෂණය සඳහා අපෙක්ෂකයකු හට දී තිබෙන දිනයෙහි වෙනසක් කර ගැනීම පිණිස කරනු ලබන ඉල්ලීමකට සාමාන්‍යයෙන් ඉඩ දෙනු නොලැබේ.

(v) විභාග කොමසාරිස් විසින් විභාග ශාලාවේ දී යතුරු ලියන යන්ත්‍ර සපයනු නොලැබේ.

(vi) ටයිප් ගසන ලද පත්‍රිකා හරි වැරදි බැලීමේ දී නියි ශෝභන පිළිවෙල, නිරවද්‍යතාව සහ වේගය ගණන් ගනු ලැබේ.

16. ප්‍රතිඵල ප්‍රසිද්ධ කිරීම සහ පත්වීම් දීම :

සමර්ථවන අපෙක්ෂකයන් ගේ නම් ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකර සුදුසු පුරප්පාඩු ඇති වූ විට ඔවුන්ට පත්වීම් දෙනවා ඇත.

17. වෛද්‍ය පරීක්ෂණය :

පත්වීම් දීම සඳහා තෝරා ගනු ලබන අපෙක්ෂකයන් විසින් ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත බවට වෛද්‍ය පරීක්ෂණයකින් ද සාමාර්ථය ලැබිය යුතු යි.

18. මෙ ව්‍යවස්ථා වලින් විස්තර නො කරන ලද මීට අදාල වූ වෙනත් යම් කරුණක් වේ නම් එය භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ගේ අභිමතය පරිදි තීරණය කෙරෙනු ඇත.

සී. ඒ. කුරේ,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1965 සැප්තැම්බර් මස 20 වැනිදා,
කොළඹ, මහා භාණ්ඩාගාරයේදී ය.

විභාග අංකය .........................
(කාර්‍යාලයීය පාවිච්චිය සඳහා පමණයි)

## යතුරු ලේඛක සේවයට බඳවා ගැනීමේ දෙමළ විභාගය – 1965 නොවැම්බර්

# අයදුම් පත

1. (අ) ඔබේ පුරුදු අත්සන ... ...

මුල් අකුරු සහිත ඔබේ නම (පැහැදිලි අකුරින්) ...

සියළුම නම් සම්පූර්ණයෙන් (මහත්මයා/මහත්මී/මෙනෙවිය යන වග සඳහන් කරන්න) ... ...

(ආ) සම්පූර්ණ ලිපිනය (ආණ්ඩුවේ සේවයේ සිටින අපේක්ෂකයන් විසින් සවකීය කාර්‍යාලයීය ලිපිනය සඳහන් කළ යුතුයි). ...

| | පළමුවන තේරීම | දෙවන තේරීම |
|---|---|---|
| 2. ඔබ විභාගයට පෙනී සිටීමට කැමති මධ්‍යස්ථානය (සාමාන්‍යයෙන් අපෙක්ෂකයා පදිංචි සථානයට කිට්ටුම සථානය) | | |

3. (අ) ඔබ ලංකාවේ පුරවැසියෙකු වන්නේ—

(i) පරම්පරාව නිසාද නැතහොත්,

(ii) ලියාපදිංචි කිරීම නිසාද යන වග ... ..........................................

(ආ) උපන් ස්ථානය—

(i) අපේක්ෂකයා ..............................

..............................................

(ii) අපේක්ෂකයාගේ පියා ....................

..............................................

(iii) අපේක්ෂකයාගේ පිය පක්ෂයේ ආතා

..............................................

(iv) අපේක්ෂකයාගේ පිය පක්ෂයේ මුත්තා

..............................................

සැලකිය යුතුයි.—අපේක්ෂකයා සහ ඔහුගේ පියා යන දෙදෙනාම උපන්නේ ලංකාවේ නම් (i) සහ (ii) පමණක් පිරවීම සෑහේ. අපේක්ෂකයා හෝ ඔහුගේ පියා උපන්නේ ලංකාවේ නොවේ නම්, (i) (ii) (iii) සහ (iv) යන සියල්ලම පිරවියයුතුයි.

| | අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|---|
| 4. (අ) ඔබ උපන් දිනය ... ... | ........................ | ........................ | ........................ |
| (ආ) 1965 නොවැම්බර් මස 1 වැනි දිනට ඔබේ වයස (අවුරුදු හා මාසවලින්) ... | ........................ | ........................ | ........................ |

| | ආයතනයේ නම | දැරූ පදවිය හෝ ධුරය | දින | | කාලය | | අස්කරනු ලැබීමට හේතු |
|---|---|---|---|---|---|---|---|
| | | | සිට | දක්වා | අවුරුදු | මාස | |
| 5. හේවා වසමට අයත් නොවන අයකු වශයෙන් ලංකාවේ පිහිටි එක්සත් රාජධානියේ සේවාවන්හි කරන ලද සේවය පිළිබඳ විස්තර දක්වන්න ... | | | | | | | |
| | | | | එකතුව ... | | | |

| | සේනාංකයේ නම | නිලය | දින | | කාලය | | සේවාවෙන් අස්වියාමට හේතු |
|---|---|---|---|---|---|---|---|
| | | | සිට | දක්වා | අවුරුදු | මාස | |
| 6. ඔබ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූවෙක් නම්, නිත්‍ය හට හමුදාවෙහි ඔබ විසින් කරන ලද සේවය පිළිබඳ විස්තර දක්වන්න ... | | | | | | | |
| | | | | එකතුව ... | | | |

| | දෙපාර්තමේන්තුව | දැරූ පදවිය | ස්ථිරවද නැතහොත් තාවකාලික වද යන වග | දින | | කාලය | | සේවාවෙන් අස්වියාමට හේතු |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | සිට | දක්වා | අවුරුදු | මාස | |
| 7. විභාගයට පෙනී සිටීමට අදහස් කරනුයේ නිවේදනයේ 6 වැනි ඡෙදය යටතේ දැක්වෙන පරිදි නිළධාරීන් සංඛ්‍යාව අඩුකිරීම සඳහා අස්කරන ලද ආණ්ඩුවේ සේවකයන්ට දෙනු ලබන විශේෂ අනුග්‍රහය යටතේ නම්, ආණ්ඩුව යටතේ ඔබ විසින් කරනලද සේවය පිළිබඳ සම්පූර්ණ විස්තරයක් මෙහි දක්වන්න | | | | | | | | |
| | | | | එකතුව ... | | | | |

8. විභාගයට පෙනී සිටීමට අදහස් කරනුයේ නිවේදනයේ 7 වැනි ඡෙදය යටතේ දැක්වෙන පරිදි ආණ්ඩුවේ ස්ථිර හෝ තාවකාලික තනතුරු දරන්නන්ට හෝ අනියම් යතුරු ලේඛකයන් ට දෙනු ලබන විශේෂ අනුග්‍රහ යටතේ නම් පහත දැක්වෙන කරුණු පිළිබඳ තොරතුරු දන්වන්න :—

(අ) ඔබ අයත් වන්නේ 7 වැනි ඡෙදයේ දැක්වෙන කොටස් අතුරෙන් කවර කොටසකටද ? ...

(ආ) දරණ තනතුර ... ...

(ඉ) එම තනතුර ස්ථිරද, තාවකාලිකද ? නැතහොත් අනියම් ද ? ... ... ...

(ඊ) දෙපාර්තමේන්තුවේ නම ... ...

(උ) සේවා කාලය (දින සහිතව) ... ... ............................................ වැනි දින සිට

............................................ වැනි දින දක්වා

(ඔබේ සේවා කාලය තාවකාලික හා ස්ථිර යන දෙවර්ගයට ම අයත් වන්නේ නම් ඒවා වෙන් වෙන් වශයෙන් දැක්විය යුතුයි.) ... ... කාලය: අවු........................ මාස ..........................දවස්....................

(ඌ) 1965 නොවැම්බර් මස 1 වැනි දිනට වයස ...

9. මේ විභාගයට ඇතුළත්වීමට සුදුසුකම් පිණිස අපේක්ෂකයා සමර්ථ වී ඇති විභාගවල තොරතුරු—

(අ) විභාගයේ නම, අවුරුද්ද සහ මාසය ...

(ආ) මධ්‍යස්ථානය ... ...

(ඉ) විභාග අංකය ... ...

(ඊ) පාඨශාලා කණිෂ්ඨ සහතික විභාගය හෝ ඊට සමාන විභාගය හෝ පවත්වන ලද්දේ පාඨශාලාවක් මගින් නම් පහත දක්වෙන විස්තර සපයන්න :—

(i) පාඨශාලාවේ නම ... ...

(ii) එහි ලිපිනය ... ...

(iii) එහි පාලනය ... ...

(5 වැනි පිටුවේ ඇති සහතිකය සම්පූර්ණ කළ යුතුයි)

---

10. ආණ්ඩුව යටතේ කළ රක්ෂා ද ඇතුළුව මීට කලින් තමන් විසින් කරන ලද රක්ෂාවන් ද, ඒ ඒ රක්ෂාවල යෙදී සිටි කාලය හා ඒ එක එකකින් අස්වී යාමට හේතු වූ කරුණු ද පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න :

(අ) වෙළඳ ආයතනයේ/සේවායාගේ/ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවේ නම ... ...

(ආ) රක්ෂාවේ ස්වභාවය ... ...

(ඉ) සේවා කාලය... ... ...

(ඊ) එම රක්ෂාවෙන් අස්වී යාමට හේතුවූ කරුණු ...

---

11. ඉදිරිපත් කෙරෙන චරිත සහතිකය ලබාගත් තැනැත්තාගේ නම, පදවිය (පදවියක් ඇත්නම්) සහ ලිපිනය ...

---

12. කිසියම් වරදකට ඔබ කවදා හෝ වරදකරු කරනු ලැබ තිබේ නම් හෝ චෝදනා කරනු ලැබ තිබේ නම් හෝ සිතාසි කරනු ලැබ තිබේ නම් හෝ ඒ බව සඳහන් කරන්න. එසේ නම්, ඒ දිනය ද, වරදේ ස්වභාව ද, උසාවියේ නම ද, නඩු නොම්මරය ද මෙහි දක්වන්න ... ...

9 (ඊ) කොටුවෙහි සඳහන් වූ සහතිකයේ ආකෘති පත්‍රය*

(i) ........................................................................................................................
(පාඨශාලාවේ ලිපිනය)

(ii) ........................................................................ (iii) ........................................................................
(පාලනය) (පාඨශාලාවේ නම)

පාඨශාලාවේ ප්‍රධානාචාර්‍ය (iv) ........................................................................................................වන
(ප්‍රධානාචාර්‍ය තැනගේ නම)

මම අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් අනුමත කරන ලද මෙම පාඨශාලාවේ ශිෂ්‍යයකු වූ/ශිෂ්‍යාවක වූ* (v) ..................................................

..........................................................................................................මෙම පාඨශාලාව මගින් පවත්වන ලද
(අයදුම්කරුගේ නම)

(vi) ..........................................................................................විභාගයෙන් සමර්ථ වූ බව සහතික කරමි. මෙම විභාගය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාඨශාලා කණිෂ්ඨ සහතික විභාගය හා සමානය.

........................................................
ප්‍රධානාචාර්‍ය තැනගේ අත්සන.

දිනය : 1965..................................................................මස...............වැනි දින.

---

අපේක්ෂකයා යම්කිසි තැනැත්තකු ඉදිරිපිට දී අත්සන් කරයි ද ඒ තැනැත්තාගේ සහතිකය

(මෙහි අග පෙනෙන සංලක්ෂ්‍යය බලන්න.)

..........................................................................සේවයේ නියුක්ත/පදිංචි ..................................................................

නමැති අය මා පෞද්ගලික වශයෙන් දන්නා අඳුණන බවත්, 1965..................................මස..........................................වැනි දින ඔහු මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

සහතික කරන අයගේ අත්සන : ..........................................

නම, පදවිය හා තරාතිරම : ..........................................

..........................................................................

ලිපිනය : ..........................................................................

..........................................................................

..........................................................................

---

*කාරණයට අදාල නොවේ නම් කපා දමන්න/අනවශ්‍ය වචන කපා දමන්න.

### දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

මේ අපේක්ෂකයා විසින් ස්වකීය සේවය සම්බන්ධව 7/8* වැනි කොටුවෙහි සඳහන් කර තිබෙන කරුණු පරීක්ෂාකර බලා එය නිවැරදි බව හෙළි වූ බවත්, ඔහුගේ/ඇගේ* වැඩ කටයුතු හා කල්ක්‍රියාව දිගටම සතුටුදායක/වූ* බවත් රෙගුලාසිවල හැටියට ඔහු/ඇය* මේ විභාගය ගැනීමට සුදුස්සකු බවත් මෙයින් සහතික කරමි.

*තවද, මීට කලින් ........................................................................................................................යන නමින් හඳුන්වනු ලැබූ මෙම අපේක්ෂකයා/අපේක්ෂකාව,* අංක 394 හා 1957 අගෝස්තු මස 18 වැනි දින දරණ භාණ්ඩාගාරයේ චක්‍ර ලේඛයෙන් සැලසී ඇති විධිවිධාන අනුව ස්වකීය නම ........................................................................................................................යන්නට දන් වෙනස් කර ඇති බැව් වැඩි දුරටත් සහතික කරමි.

*අපේක්ෂා කරන පදවියට ඔහු/ඇය* තෝරාගනු ලැබුවහොත් දනට ඔහු/ඇය* සිටින තනතුරෙන් ඔහු/ඇය* මුදලීමට පුළුවන.

..........................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

පදවිය : ..........................................................

දිනය : 1965 ................................. මස ............ ..................... වැනි දින.

---

මෙහි සඳහන් කරන ලද ප්‍රකාශයන් මගේ දැනීම පරිදි හා විශ්වාසය පරිදි සත්‍ය බවත් මෙයට අලවා ඇත්තේ නිර්ව්‍යාජ වූ ද, එසේම කලින් පාවිච්චි නොකරන ලද්ද වූ ද මුද්දර බවත් මෙයින් දිව්රා සහතික කරමි.

මේ විභාගය පිළිබඳ රෙගුලාසිවලට එකඟව ක්‍රියා කිරීමට ද බැදෙමි. එසේම මෙම විභාගය පිළිබඳ රෙගුලායිවලට අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත් මගේ අපේක්ෂකත්වය අවලංගු කරන ලද සේ සැලකීමට ඉඩ ඇති බව ද මැනවින් දනිමි.

| |
|---|
| විභාගාපේක්ෂකයා රුපියල් 20 ක් වටිනා මුද්දර මෙහි අලවා ඒ උඩ අත්සන් කළ යුතුයි |

..........................................................
අපේක්ෂකයාගේ අත්සන.

දිනය : 1965 ................................. මස ................................. වැනි දින.

(සංලක්ෂාස.—අපේක්ෂකයා, ස්ථිර හෝ තාවකාලික හෝ අනියම් වශයෙන්, ආණ්ඩුවේ කාර්‍යාලයක සේවයෙහි නියුක්ත වූවකු නම් ඔහු විසින් හැකි නම් අත්සන් කළ යුත්තේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා ඉදිරිපිට ය. අවශෙෂ අපේක්ෂකයන් විසින් අත්සන් කළ යුත්තේ සමාදාන විනිශ්චයකාරයකු හෝ ආදායම් පාලක නිලධාරියකු හෝ නීතිඥ කෙනෙකු හෝ නොතාරිස් කෙනෙකු හෝ රුපියල් 2,400 ක් හෝ ඊට ඉහළ වාර්ෂික වැටුපක් ලබන ආණ්ඩුවේ ස්ථිර සේවයෙහි නියුක්ත නිලධාරියකු හෝ යුද්ධ හමුදාවේ, නාවුක හමුදාවේ හෝ ගගන හමුදාවේ අධිකාරි නිලධාරියකු හෝ ඉදිරිපිටය.)

## ලංකාවේ විභාග දෙපාර්තමේන්තුව

### විභාගාපේක්‍ෂකයන් සඳහා නීති

සියලුම විභාගාපේක්ෂකයන් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි හෝ පමුණුවනු ලැබේ.

(i) මුළු විභාගයට ම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම.

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයට ම හෝ නුසුදුස්සකු කිරීම.

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිය යුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලිසියට බාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලිසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතර තුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපේක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියාකිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත්, රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේය.

### නීති

1. සියලුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාගශාලාධිපතීන්ට ද ඔහුගේ සහකාරයන්ට ද අනික් විභාගාපේක්ෂකයන්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්ත දාන්ත ව හැසිරිය යුතුයි. විභාග ශාලාවට ඇතුළුවන විටත් ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරුවිය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේත් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන් ගෙන පැය බාගයක් ගත වූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයකු විභාග ශාලාවට ඇතුළු කරගනු නො ලැබේ. විභාගය පටන්ගෙන පැය බාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටින අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටවී යාම ද තහනම් ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයකු ම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුයි. විභාගශාලාධිපතීන්ගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නො කළ යුතුයි. තමන්ට නියම නො කරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්‍ය මණ්ඩලයේ කෙනකු සමඟ හැර, විභාග ශාලාව ඇතුළත හෝ ඉන් පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන් ම තහනම් ය. යම්කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවකු සමග කතාබස් කිරීම් ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතීන්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයකුගේ උත්තර පත්‍රය අඳුනා ගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නො ලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනා ගත නො හැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදු වෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසියෙහි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නො ලිය යුතුයි. මේ නීතිය නො සැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියාකිරීමකැයි සැළකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකා මකා දැමීම හෝ නොකළ යුතුය. කටු වැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද කඩදාසි ඇතුළු පාවිච්චි කරනලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුයි. ඒවා උත්තර පත්‍රයෙහි ම කොටසක් විය යුතුයි. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි.) විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටතට ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයට පිළිතුරු දෙ තැනක ලියැවී තිබේනම් අනවශ්‍ය පිළිතුර පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැලකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාද හෝ ගණන් කොහෙත්ම නොසාද හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත්, චිත්‍ර කර්මයෙහිදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයකුගේ චිත්‍රයකට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමාන ව එසේ නැතිනම් බොහෝ සෙයින් කිට්ටුව තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතුවිය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටත ගෙන යාම තහනම් ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩ කිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතුවෙනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සසයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබැලිද, තමන්ගේ පාටපෙට්ටි හෝ ජ්‍යාමිති උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී, ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි, පෙට්ටි හා පාර්සල් ආදියද, ෆයිල් කවර, කාර්ඩ් බෝර්ඩ්, පෑඩ්, නැමු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදියද විභාග ශාලාව තුළ සිටින කිසිවිටක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තමා නො ගත යුතුය. මේ නීතිය කඩකිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියනලද කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන් තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීමද හොර උත්තර ලිවීමට යත්න දැරීම ද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීමද නොකළ යුතුය. වෙන අයදුම්කරුවකුට උදවු දීමෙන් ද වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් හෝ උදවු ලබාගැනීමෙන්ද සම්පූර්ණයෙන් ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණවූ සෑම කඩදාසියක් ම ලියමින් සිටින කඩදාසිය යට තබාගත යුතුයි. ලියන ලද කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත්, ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසි විභාගාපේක්ෂකයකුට ඉඩ දෙනු නො ලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයකුට ඉන් පිටත යන්නට වුවමනා වූවොත් විභාගශාලාධිපතීන්ගේ සහකාර නිලධාරියකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත්, නැවත විභාග ශාලාවට ඇතුළුවන විටත් ඔහු සෝදිසියකට භාජන විය යුතුයි.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියනවිට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල්ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුයි.

16. විභාගාපේක්ෂකයකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදවු දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

**විභාගාපෙක්‍ෂකයන් සඳහා උපදෙස් :**

විභාගාපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කටවත් කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරි හැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත් වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසු කම ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගාශාලාධිපතීන්ට ඒ බැව් සැලකර එම සැකය දුරුකර ගත යුතු යි. එලෙස ක්‍රියා නො කිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතුවිය හැකි ය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අනන්‍යතා පත්‍ර (හැඳින්වීමේ පත්‍ර) ඉදිරිපත් කළ යුතු අපේක්ෂකයන් සෑම විෂයයකට ම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නො කළහොත් ඔබේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්ට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සලසා ගත යුතු ය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම් :—ලියන කඩදසි, තීන්ත පොවන කඩදසි, ප්‍රස්තාර කඩදසි, ලැජර් කඩදසි, සාරාංශ ලියන කඩදසි ආදිය) සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණොත් ඒ බව නො පමාවම විභාගශාලාධිපතීන්ට දැන්විය යුතු ය. විභාග ශාලාවේ දී ඔබට ම දෙනු ලබන කඩදසි හැර වෙන මොනම කඩදසියක් වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නො කළ යුතුයි. ඉතිරි වන කඩදසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නො කර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝු ගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරෙස්සමෙන් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්ට හැරිය යුතුයි..

(v) විභාගපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන රබර් කැලි, අඩි කෝදු, ජ්‍යාමිති උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදසියක ම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නො පමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදසියේ දෙපැත්තේ ම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවාට පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන හැම දෙයක් ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නො හැකි ලෙස නො ලිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නො ලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයකට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමෙන් නිවැරදි ලෙස යෙදිය යුතුයි.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධ ව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමෙන් කියවා බැලිය යුතුයි. මෙය නො සලකා හැරීමෙන් බොහෝවිට පාඩු සිදු විය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගණ බැලීම් සහ කටුවැඩ ඒ ඒ ගණන සෑදීමේ කොටසක් වශයෙන්, අනු ක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුයි. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් සහ චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහනක් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමු කර විය යුතු අවස්ථාවලදී ඒ රූප සටහන නැවත නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදසි සියල්ලම ප්‍රශ්න වලට උත්තර ලියූ පිළිවෙළ අනුව එකතු කොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නො ගැලවී යන පරිදි එකට තබා අමුණා ගැට ගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නො ගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ සියතින් ම බාර දිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේ ම වාඩි වී සිටිය යුතු ය. මෙසේ නො කිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිව යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නො වූවකුසේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙන යම් සේවකයකුට හෝ බාර නො දිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ කථා කිරීම අවශ්‍ය වූ විට ද, කඩදසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නො නැගිට අත පමණක් එසවිය යුතු ය.

එච්. එල්. විමලසූරිය,
වැඩබලන විභාග කොමසාරිස්.

කොළඹ 2.
මැලේ වීදියේ,
විභාග දෙපාර්තමේන්තුවේ දීය,

9-1092—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය (1301 පිට බලන්න)

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 218 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1) පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන්හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| සේවයන් | ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය |
|---|---|
| (1) 1965.10.1 සිට 66.9.30 තෙක් කොට්ට පුළුන් සැපයීම | ... 1965.10.19 |
| (2) 1965.10.1 සිට 66.9.30 තෙක් කපුරෙදි කැලි සැපයීම | ... 1965.10.19 |
| (3) 1965.10.1 සිට 66.9.30 තෙක් ඉවත ලන කඩදසි මිලට ගැනීම | ... 1965.10.13 |
| (4) ගම් බූට්ස් සැපයීම | ... 1965.11.16 |

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාර්සන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරීතැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර්පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුය.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් මෙහි ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරී.

1965.9.24 දින කොළඹ දීය.

9-1082—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

## රාජකීය ලංකා ගුවන් හමුදාව

කොළඹ සෙනෝට් ගොඩනැගිල්ලේ ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් ලංකා යුද්ධ හමුදාව, රාජකීය ලංකා නාවික හමුදාව සහ රාජකීය ලංකා ගුවන් හමුදාවට 1965-66 මුදල් වර්ෂය සඳහා බෙහෙත් ඖෂධ වර්ග සැපයීම සඳහා 1965 ඔක්තෝබර් මස 22 වෙනි දින පෙරවරු 10 දක්වා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර ලබාගැනීම පිණිස, කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ගුවන් හමුදා මූලස්ථානයේ, සිවිල් පාලක හා ගණකාධිකාරිතුමා වෙත රුපියල් සියයක (රු. 100) මුදලක් තැන්පත් කර රිසිට් පතක් ලබාගත යුතුයි. වර්ෂ 1965 ඔක්තෝබර් මස 21 වෙනි දින දහවල් 12 වනතෙක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

3. සියළුම ටෙන්ඩර් අනු පිටපතක් සමග මුද්‍රා තබන ලද ලියුම් කවරයට බහා කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ "හමුදාවන්ට බෙහෙත් ඖෂධ වර්ග සැපයීම සඳහා ටෙන්ඩරය" යයි සඳහන් කර කොළඹ, සෙනෝට් ගොඩනැගිල්ලේ, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා වෙත එවිය යුතුය.

4. පළමුවෙනි ඡේදයේ සඳහන් කර ඇති වේලාවේදී ටෙන්ඩර් පත් විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට පෙනී සිටීමට ඉඩ දෙනවා ඇත.

5. වැඩි විස්තර කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ගුවන් හමුදා මූලස්ථානයෙන් දැන ගැනීමට හැක.

ඊ. ආර්. අමරසේකර,
එයාර් කොමඩෝර්,
ගුවන් හමුදාධිපති.

9-1033—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

### තෙල් බවුසරයක් සැපයීම

ඉහත සඳහන් සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවමින් 1965.9.3 දා අංක 14,495 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලකළ අංක 9-156 දරණ ගැසට් නිවේදනය සම්බන්ධව, ටෙන්ඩර් කැඳවීමේ අවසාන දිනය 1965.10.27 ද පෙ. ව. 9.30 දක්වා දීර්ඝ කරන ලද බව මෙයින් දන්වමි.

2. ටෙන්ඩර් ලියකියවිලි 1965.10.25 දා දහවල් 12 දක්වා නිකුත් කරනු ලැබේ.

ඇල්. ඇස්. ද සිල්වා,
වරාය කොමසාරිස් වෙනුවට.

1965 සැප්තැම්බර් 18 දින,
කොළඹ වරාය කොමිෂන් සභා කාර්යාලයේදීය.

9-1035—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## 1965–66 මුදල් වර්ෂය තුළ බන්ධනාගාර හා සිරසැල්වල සිටින සිරකරුවන්ටත් උසාවිවලට ඉදිරිපත් කරනු ලබන සිරකරුවන්ටත් පිසන ලද ආහාර සැපයීම

බන්ධනාගාර හා සිරසැල්වල සිටින සිරකරුවන්ටත් උසාවිවලට ඉදිරිපත් කරනු ලබන සිරකරුවන්ටත් 1965 නොවැම්බර් මස 1 ද සිට 1966 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා මුළු අවුරුදු කාලය තුළ පිසනු ලැබූ ආහාර සැපයීම සඳහා 1965.10.15 දින පෙරවරු 10 දක්වා ඒ ඒ බන්ධනාගාර අධිකාරීන් විසින් ටෙන්ඩර්, ලාංකිකයන්ගෙන් (ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමේ හෝ රටවැසියකු වූවෙකි). භාරගනු ලැබේ. එම දිනවල පෙරවරු 10.05 ට ටෙන්ඩර් විවෘත කරනු ලබනවා ඇත. ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී එහි පෙනී සිටීමට ටෙන්ඩර්කරුවනට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර්කරුවන් ආහාර සඳහා මිළ ගණන් ඉදිරිපත් කිරීමේ දී ඉලක්කමින් මෙන්ම වචනයෙන් ද ඒවා සඳහන් කළ යුතුව ඇත. ඉලක්කමින් සඳහන් මිළ ගණන් වචනයෙන් සඳහන් කිරීමේ දී අසමානත්වයක් ඇතිවී තිබුණහොත් හෝ මිළ ගණන් වචනයෙන් සඳහන් වී නැති නම් හෝ එබඳු ටෙන්ඩර් ප්‍රතික්ෂෙප වීමට ඉඩ ඇත්තේ ය.

3. ආහාර සැපයීම පිළිබඳ විස්තර පහත සඳහන් වේ :—

උදය ආහාරය—

(අ) ආප්ප හෝ ඉදිආප්ප (අවුන්ස 6කට නොඅඩු විය යුතුයි) ;

(ආ) හකුරු අවුන්ස එකක් හෝ සම්බෝල ;

(ඇ) සීනි දමන ලද තේ කෝප්පයක්.

දිවා නෝස්තරු භෝජනය—

(අ) හාල් අවුන්ස 8 ප්‍රමාණයේ තැම්බූ බත් පිඟානක් ;

(ආ) හරක් මස් හෝ මාලු හෝ කරවල අවුන්ස 2-යි ;

(ඇ) එළවළු ව්‍යංජන දෙකයි. එක ව්‍යංජනයක් අවුන්ස 2 ප්‍රමාණය විය යුතුයි.

සැ. යු.—(1) සලාක කිරීම නිසා නොහොත් වෙනත් ප්‍රමාණවත් හේතුවක් නිසා සම්පූර්ණ ආහාර ප්‍රමාණයක් හෝ ඉන් කොටසක් හෝ සැපයිය නොහැකි නම්, අධිකාරි තැනගේ අභිමතය පරිදි කොන්ත්‍රාත්තුවට බැඳී ඇති වෙළඳ මිළ ප්‍රමාණයට සෑහෙන සේ ආදේශක ආහාර සැපයීමට කොන්ත්‍රාත්කරුවනට පිළිවන.

(2) කොන්ත්‍රාත්කරුවන්ගෙන් උදය ආහාරය ලබාගනු ලබන්නේ ආයතනය මගින් එය අඩු මිලකට සපයා ගැනීමට නොහැකි වුවහොත් පමණකි.

4. සියළුම ටෙන්ඩර්පත්‍ර අනු පිටපතක් සහිතව ලියුම් කවරයක බහා සීල් තබා උපලේඛනයේ සඳහන් අධිකාරීතැන වෙත රෙජිස්ට්‍රර් තැපැලෙන් යැවිය යුතුයි. රෙජිස්ටර් තැපැලෙන් නොයවන ටෙන්ඩර්පත්‍ර එම අධිකාරිතැනට හෝ ඔහු විසින් පත් කරන ලද බලයලත් නියෝජිතයෙකු වේ නම් ඔහුට හෝ භාරදී එය භාර ගත් බවට ලියවිල්ලක් ලබා ගත යුතුයි.

5. ටෙන්ඩර්පත්‍ර බහා ලූ කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ "1965-66 වර්ෂය තුළ බන්ධනාගාර සහ සිරසැල්වල සිටින සිරකරුවන්ටත්, උසාවිවලට ඉදිරිපත් කරනු ලබන සිරකරුවන්ටත් පිසන ලද ආහාර සැපයීමේ ටෙන්ඩරය." යැයි ලියා උපලේඛනයෙහි සඳහන් දිනවල මෙහි 1 වැනි ඡේදයේ සඳහන් වේලාවට ප්‍රථම නියමිත අධිකාරිතැනට ලැබිය යුතු සේ එවිය යුතුයි.

6. ටෙන්ඩර් සඳහා නියමිත පෝර්ම ඒ ඒ ආයතන භාර අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. නියමිත පෝර්මයේ ලියා නැති ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

7. ටෙන්ඩර් භාර ගැනීම නතර කළ දින සිට සති 8ක් යනතුරු ටෙන්ඩර්කරුවන් තමන්ගේ ටෙන්ඩර්පත්‍ර සැළකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතුය.

8. ටෙන්ඩර්වල සියලුම වෙනස් කිරීම් හා මැකීම්වලට ටෙන්ඩර්කරුවන් විසින් තම කෙටි අත්සන යෙදිය යුතුයි.

9. මෙහි පහත උපලේඛනයෙහි සඳහන් පරිදි ටෙන්ඩර්පත්‍ර සඳහා තැන්පත් කළ යුතු මුදල් බන්ධනාගාර අධිකාරීන්ගේ කාර්යාලවල හෝ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ (කොළඹ කච්චේරිය හැර) වෙන ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැකිය.

යමෙකුට ඔහුගේ ටෙන්ඩරය පිළිගත් බවට ලියමනකින් දන්වනු ලැබීමෙන් දින 10ක් ඇතුළත දී අවශ්‍ය ඇප මුදල් ඉදිරිපත් කිරීම පුළුවන් නො විනි නම් හෝ එසේ කිරීමෙන් වැළකී සිටිනම් හෝ තැන්පත් කරන ලද මුදල් රාජසන්තක වෙනවා ඇත. ඉන්පසු රජය සම්බන්ධ කවර කොන්ත්‍රාත්තුවකට හෝ බැඳීමට නොහැකි වනසේ ඔහුගේ නම කොන්ත්‍රාත් කඩ කරන්නන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනවා ඇත. තවද, කොන්ත්‍රාත්තුව කඩ කිරීමේ අලාභ වශයෙන් ලංකාවේ වලංගු මුදලෙන්, ඒ ඒ කොන්ත්‍රාත්තුවට තබා ඇති ඇප මුදලට සමාන මුදලක් රජය වෙනුවෙන් බන්ධනාගාර කොමසාරිස්වරයාට ගෙවීමට, එම ටෙන්ඩර්කරුවනට සිදු වෙනවා ඇත. මෙම මුදල අලාභ වශයෙන් නීති මාර්ගයෙන් අයකර ගැනීමේ බලය බන්ධනාගාර කොමසාරිස්වරයා වෙත පැවරී ඇත.

ටෙන්ඩරය පිළිගත් බව දන්වන නිවේදනය ටෙන්ඩර්කරු විසින් දෙනු ලබන ලිපිනයට තැපෑලෙන් යවනු ලැබුවහොත් හෝ නො එසේව එහි ගෙන ගොස් භාරදුනහොත් හෝ එම නිවේදනය ටෙන්ඩර්කරුවා වෙත ලැබුණ ලෙස සලකනු ලැබේ. අන්‍ය සියලු තැන්පත් මුදල්, කොන්ත්‍රාත්තුවට අත්සන් තැබීමෙන් පසු ආපසු ගෙවනු ලැබේ.

10. ටෙන්ඩර් පිළිගැනීමෙන් පසු, එසේ පිළිගනු ලැබූ ටෙන්ඩර්කරුවෝ කොන්ත්‍රාත්තුව මනා අන්දමින් ඉටු කරන වගට ඇපකරුවන් වශයෙන් ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට කැමති වග කිවයුතු පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් ඉදිරිපත් කළ යුතුයි. කොන්ත්‍රාත්කරුවන් විසින් වැඩෙහි යෙදවිය යුත්තේ ලාංකිකයන් පමණකි.

11. සේවය නිසියාකාර ඉටු කිරීමේ දී දත යුතු සියලුම අවශ්‍ය කරුණු දැන ගැනීම සඳහා උපලේඛනයේ සඳහන් අධිකාරීවරුන් ගෙන් විමසනු මැනවි

12. ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින බන්ධනාගාර කොමසාරිස්වරයා සමඟ කොන්ත්‍රාත්තුවට අත්සන් තැබිය යුතුයි. එබඳු නිලධාරියෙකුගේ පදවි නාමයෙන් අදහස් කළ යුත්තේ ද ගිණිය යුත්තේ ද ලංකාණ්ඩුව යටතේ දැනට එම පදවිය දරන්නා වූ ද නිලධාරියා ද ඔහුට පසු එම පදවිය දරන්නා වූ නිලධාරියා ද වේ.

ඇෆ්. ඩී. ඇල්. රත්නායක,
බන්ධනාගාර කොමසාරිස්.

1965 සැප්තැම්බර් මස 20 වැනි දින,
බන්ධනාගාර මූලස්ථානයේ දී ය,
කොළඹ 9.

## උපලේඛනය

| ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | ඇප මුදල | ටෙන්ඩර් භාරගන්නා නිලධාරියා |
|---|---|---|---|
| | රු. | රු. | |
| 1. කුරුණෑගල සිරසැල හා උසාවිය ... ... ... | 50 ... | 200 ... | නුවර බන්ධනාගාර අධිකාරි |

9–1068—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## අරක්කු සහ වෙනත් බඩු එහා මෙහා ගෙනයාම—වව්නියා ගුදම

1965 ඔක්තෝබර් 1 වෙනිදා පටන් එක් අවුරුද්ද කාලසීමාවක් තුළ, වව්නියාවේ පිහිටි සුරා ගුදම සහ එහි දුම්රිය බඩු ගබඩාවත් අතර අරක්කු සහ වෙනත් බඩු එහා මෙහා ගෙනයාම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත් උතුරු කොට්ඨාශය භාර යාපනයේ සහකාර සුරාබදු කොමසාරිස්තුමා විසින් වෂී 1965 සැප්තැම්බර් මස 30 වෙනි දින දවල් 12 දක්වා භාරගනු ලැබේ.

මේ සඳහා රුපියල් 10 ක් තැන්පත් කිරීමෙන් ලබාගත් කච්චේරි කුවිතාන්සියක් එකී සහකාර සුරාබදු කොමසාරිස්තැන වෙත ඉදිරිපත් කළ විට ලබාගතහැකි ෆෝර්මවල ටැන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

මෙම කාරණයට අදාල වැඩි විස්තර එම සහකාර සුරාබදු කොමසාරිස් තැනගෙන් ලබාගත හැක.

අ. තිරුනාවුකරසු,
සුරාබදු කොමසාරිස් වෙනුවට.

1965 සැප්තැම්බර් මස 20 දින,
කොළඹ 6, සැවොයි ගොඩනැගිල්ලේ පිහිටි,
සුරාබදු කොමසාරිස් කාර්යාලයේ දීය.

9–1087—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### තිස්ස උප කොට්ඨාශය

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්ස උප කොට්ඨාශයේ කිරිදිඔය වම්ඉවුරු ව්‍යාපාරයට අයත් ඇල්ලෙගල අමුණේ වම්ඉවුරු ප්‍රධාන සොරොව්ව අළුත්වැඩියා කිරීම සඳහා ටෙන්ඩර් පත්, 1965 ඔක්තෝබර් මස 26 වෙනි අඟහරුවාදා පෙරවරු 10 දක්වා දකුණු කොට්ඨාශය භාර තංගල්ලේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම එහිදී සිදු කෙරේ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 18,000කට හෝ ඊට වැඩි ගණන කට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවනට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කළ හැක.

1965 ඔක්තෝබර් මස 21 වෙනි දින තෙක් එදිනද ඇතුළුව කාර්‍යාල වේලාවන් තුළදී, තිස්ස, හම්බන්තොට හා ගාල්ල යන වාරිමාර්ග ඉංජිනේරු කාර්‍යාලවලින් ලබාගත හැකි ටෙන්ඩර් ෆෝර්මවල අයදුම්පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් ෆෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් හා දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක්, ඔවුනට ටෙන්ඩර්කිරීමට ඉඩ දිය යුතුද? නැද්ද? යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරුතැන වෙත ඉදිරිපත් කළ යුතුයි. ෆෝර්ම නිකුත් කරනු ලැබීමට ප්‍රථම රු. 25ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කාර්‍යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත්කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

මෙම ටෙන්ඩරය ගැන සියළුම වැඩි විස්තර කාර්‍යාල වේලාවන් තුළදී තිස්ස වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කාර්‍යාලයෙන් ලබාගත හැක.

ඇන්. ගුරුසාමි,
තිස්ස උප කොටස භාර
වාරිමාර්ග ඉංජිනේරුතැන.

1965 සැප්තැම්බර් මස 15 වෙනි දින,
තිස්ස, වාරිමාර්ග කාර්යාලයේ දීය.

9–1007—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වව්නියාවේ උතුරු කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතැන විසින් 1965-66 මුදල් වර්ෂය තුළ මන්නාරම උප කොට්ඨාශයේ බඩු ගෙන යෑම සඳහා 1965 ඔක්තෝබර් මස 19 වන අඟහරුවාදා පෙරවරු 10ය දක්වා ටෙන්ඩර්පත්‍ර භාරගනු ලැබේ.

2. ටෙන්ඩර්පත්‍ර පිටපත් 2කින් යුක්තවිය යුතුය. මෙය පිළිබඳ වැඩි විස්තර හා ටෙන්ඩර් ෆෝර්මද, වව්නියාවේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතැනගෙන් හෝ වව්නියා උප කොට්ඨාශය, ජාපනය උප කොට්ඨාශය, මුලතිව් උප කොට්ඨාශය සහ මන්නාරම් උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරුවන්ගෙන් ලබාගත හැකිය.

3. ඉහත කී වාරිමාර්ග කාර්යාලවල හෝ කච්චේරියක හෝ රුපියල් 25ක් තැන්පත්කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කරන වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ට 1965 ඔක්තෝබර් මස 15 වන දින දක්වා ටෙන්ඩර් ෆෝර්ම ලබාගත හැකිය. රු. 10,000කට හෝ ඊට වැඩි මුදලකට ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති.

සී. පූබාලසිංහම්,
මන්නාරම උප කොට්ඨාසය භාර
වාරිමාර්ග ඉංජිනේරුතැන.

මුරුන්කන්,
16.9.65.

9–1008—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### යාපනය උප කොටස

යාපනය උප කොටසේ ආනෙයි තුඩංගු ස්ථානයෙහි ලුනු වතුර ඉවත් කිරීමේ ව්‍යාපාරයක් තැනීම සඳහා ටෙන්ඩර් පත්, වව්නියාවේ උතුරු කොටසෙහි ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතැන විසින්, 1965 ඔක්තෝබර මස 19 වෙනි අඟහරුවාදා පෙරවරු 10 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එහිදී එවේලේම සිදු කෙරේ.

2. මෙම කාර්යය සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 26,000කට හෝ ඊට වැඩි මුදලකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවෝ පමණක් සුදුස්සෝ වෙති.

3. 1965.9.30 වෙනි දින සිට 1965.10.15 වෙනි දින දක්වා කාර්යාල වේලාවන් තුළදී වවුනියාවේ උතුරු කොටසෙහි ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කාර්යාලයෙන් සහ අනෙක් උතුරු කොට්ඨාශවල වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගේ කාර්යාලවලින් ලබාගත හැකි ෆෝරමවල ටෙන්ඩර්පත් පිළියෙල කළ යුතුයි. ටෙන්ඩර් ෆෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඔවුන්හට ටෙන්ඩර් කිරීමට ඉඩ දිය යුතුද නැද්ද යන්න සලකා බැලීමට, ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි කළ පොත් හා දැනට දෙපාර්තමේන්තුවේ පවත්වා ගෙනයන වැඩ සහ ඒවායේ වටිනාකම් සම්බන්ධ ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කිරීමට පෙර රුපියල් 50ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ඉහත කී වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගේ කාර්යාල වලින් හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර, ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුයි.

4. මේ සඳහා වැඩි විස්තර කාර්යාලීය වේලාවන් තුළදී කිලිනොච්චියේ, යාපනය උප කොටසෙහි වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

සී. ජයසිං,
යාපනය උප කොටසේ
වාරිමාර්ග ඉංජිනේරුතැන.

1965.9.16 වෙනි දින,
කිලිනොච්චියේ,
වාරිමාර්ග කාර්යාලයේ දීය.

9–1009—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### වෙන්කලාඩි උප කොට්ඨාශය

උන්නිච්චිය ව්‍යාපාරයේ මුල්ලාමුනෙයි අමුණ ඉදි කිරීම සඳහා ටෙන්ඩර් පත් 1965 ඔක්තෝබර් මස 19 වෙනි අඟහරුවාදා පෙරවරු 10 දක්වා නැගෙනහිර කොට්ඨාසයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතැන විසින් භාර ගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එදින උදේ 10.30 ට එහිදී සිදු කෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 20,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවනට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයැදුම්පත් ඉදිරිපත් කළ හැක.

3. 1965 ඔක්තෝබර් මස 15 වෙනි සිකුරාදා දවල් 12 වන තෙක් (එදින ඇතුළුව) කාර්යාල වේලාවන් තුළදී මඩකලපුව, වෙන්කලාඩි, කල්මුනේ, අම්පාරේ වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි ෆෝර්මවල ටෙන්ඩර් අයැදුම්පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් ෆෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක්, ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරුතැන වෙත ඉදිරිපත් කළ යුතුය. ෆෝර්ම නිකුත් කිරීමට ප්‍රථම රුපියල් 25ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩරය ගැන සියළුම වැඩි විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැලසුම්, විශේෂ විස්තර යනාදිය කාර්යාලයීය වේලාවන් තුල දී වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

වාරිමාර්ග ඉංජිනේරු,
වෙන්කලාඩි උප කොට්ඨාශය.

වාරිමාර්ග කාර්යාලයය,
වෙන්කලාඩි,
1965.9.14.

9–1042—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### බතලගොඩ වී පර්යේෂණ ස්ථානයේ පොල් විකිණීම

පේරාදෙණියේ රාජකීය උද්‍යානයේ කෘෂිකර්ම පර්යේෂණ අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින්, බතලගොඩ වී පර්යේෂණ ස්ථානයේ තිබෙන 30,000 (තිස් දාහක) පමණ පොල් තොගය විකිණීම සඳහා සිල් තබන ලද ටෙන්ඩර්පත්‍ර පහත සඳහන් කොන්දේසි අනුව 1965 ඔක්තෝබර් මස 19 වැනි දින පස්වරු 2.30 වන තෙක් භාර ගනු ලැබේ.

පොල් විකිණීම සඳහා තෝරා ගනු ලබන ටෙන්ඩර්කරුට ඒ බව දන්වා සති දෙකක් ඇතුලත සම්පූර්ණ පොල් තොගයම එකවර මුදල් ගෙවා පොල් තොගය ගොවිපොලෙන් පිටත රැගෙන යාමට හැකි විය යුතුයි.

පොල් තොගය භාර ගැනීමේදී කිසිම පිළිවෙලක වර්ග කිරීමට ඉඩ නැත. එමෙන්ම කුණුවූ හෝ කුඩා වූ හෝ වශයෙන් වර්ග කිරීමට ද නොහැක.

2. පේරාදෙණියේ රාජකීය උද්‍යානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) කාර්යාලයෙන් ලබා ගන්නා ලද ෆෝර්මවල ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම දෙපිටපතකින් යුක්ත විය යුතු අතර නිසිලෙස අත්සන් කොට මුද්‍රා තැබූ කවරවල බහා "පේරාදෙණියේ රාජකීය උද්‍යානයේ කෘෂිකර්ම පර්යේෂණ අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති" නමට ඉදිරිපත් කළ යුතුයි. කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි "බතලගොඩ වී පර්යේෂණ ස්ථානයේ පොල් මිලදී ගැනීම" කියා සඳහන් කළ යුතුයි.

3. එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 25 ක් තැන්පත් කළ බවට රිසිට් පත් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් ෆෝර්ම ලබාගත හැක. 1965 ඔක්තෝබර් මස 19 වැනි දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. ඕනෑම දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති කාර්යාලයක හෝ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ මෙම ටෙන්ඩර් ගාස්තු තැන්පත් කළ හැක. ගිවිසුම්පත්‍ර අත්සන් කළ පසු මෙම මුදල ආපසු ගෙවනු ලැබේ. තෝරාගත් ටෙන්ඩර්කරු වෙත ටෙන්ඩරය භාර ගත් බව දන්වා දින 10 ක් ඇතුලත අවශ්‍ය ඇප තැන්පත් කිරීමට හෝ ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට හෝ නො හැකි විණි නම් ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් ගාස්තුව රාජසන්තක කරනවාත් හැර ඔහුගේ නම රජයේ කොන්ත්‍රාත්තු පැහැර හැරිය වුන්ගේ නාම ලේඛනයට ඇතුලත් කරනු ලැබේ. එහෙත් මේ නිසා ඔහුගෙන් රජයට අයවිය යුතු යම් මුදලක් වෙතොත් එය අයකර ගැනීමට බාධාවක් නොවේ.

4. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුයි. නැතහොත් මුද්‍රා තැබූ කවරවල බහාලන ලද ටෙන්ඩර් පත්‍ර "බතලගොඩ වී පර්යේෂණ ස්ථානයේ පොල් මිලදී ගැනීම" යනුවෙන් ද ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද කවරයේ සඳහන් කොට "පේරාදෙණියේ රාජකීය උද්‍යානයේ කෘෂිකර්ම පර්යේෂණ අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති මහතා" වෙත ටෙන්ඩර්කරු විසින්ම හෝ ඔහුගේ නියෝජිතයින් විසින් පුද්ගලිකව භාර දිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන දිනම, ලියාපදිංචි කළ තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර් කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුණි නම් ඒ බව පේරාදෙණියේ රාජකීය උද්‍යානයේ කෘෂිකර්ම පර්යේෂණ අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ඔහු විසින්ම වහාම දැන්විය යුතුයි.

5. කැමති නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවේ දී පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට අවසර ඇත. ටෙන්ඩර් පත්‍ර භාරගනු ලබන අවසාන දින එකී වේලාවට පේරාදෙණියේ රාජකීය උද්‍යානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) ගේ කාර්යාලයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

6. පිළිගත් ෆෝර්මයෙහි ඉදිරිපත් නොකරන ලද හෝ එහි සඳහන් කොන්දේසිවලට එකහෙළා අනුකූල නොවන කිසිම ටෙන්ඩර් පත්‍රයක් පිළිගනු නොලැබේ.

7. ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ලිපිනයන් ටෙන්ඩර් පත්‍රිකාවේ පැහැදිලි ලෙස සඳහන් කළ යුතුය.

8. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කොට සති තුනක් ගතවන තුරු ටෙන්ඩර් පත්‍රිකා පිළිගැනීම සඳහා ඉඩ ඇති බව ටෙන්ඩර්කරුවන් විසින් සැලකිය යුතුය.

9. කිසියම් ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ලම හෝ ප්‍රතික්ෂේප කිරීමෙන් කිසියම් ටෙන්ඩරයක කොටසක් පමණක් පිළිගැනීමේත් අයිතිය කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා සතුය.

10. ටෙන්ඩර් කරන ලද කාර්ය සපුරාලීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට තෝරාගත් ටෙන්ඩර්කරුට සිදුවනු ඇත. මෙහි දී "ලාංකික" යන වචනය, පෙලපතින් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසි භාවය අයිති යන අර්ථය ගෙන දේ.

11. පෞද්ගලිකව ටෙන්ඩර්කරු වෙත භාර දෙන ලද හෝ ටෙන්ඩර් පත්‍රයේ සඳහන් ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් යවන ලද හෝ ටෙන්ඩරයට අදාල සෑම දැන්වීමක්ම ටෙන්ඩර්කරු අතට පත් කළාසේ සලකනු ලැබේ.

12. 1934 වර්ෂයේ අංක 19 දරණ කම්කරු ආඥා පනතේ (117 වැනි අධිකාරිය) යටතේ සේවයෙහි යොදන ලද කම්කරුවෙකු විසින් හෝ කම්කරුවෙකු වෙනුවෙන් ඉල්වනු ලබන වන්දියකින් කොන්ත්‍රාත්කරු විසින් රජය නිදහස් කළ යුතුයි.

13. ටෙන්ඩර්කරු විසින් වැඩට ගන්නා යම් සේවකයෙකු සේවයේ යෙදවීම අහිතකර දෙයක් ලෙස සලකා ඊට විරෝධය දැක්වීමේත්, යම් කම්කරුවෙකු සේවයේ යෙදවීමට කලින් විරුද්ධ වීමේත් අයිතිය රජය සතු වන්නේය.

14. වැඩ පැහැර හරින කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ රජය මගින් තබා ඇති ලේඛනයේ තනි තනිව හෝ ලේඛනයේ නම් සඳහන් වෙනත් අයෙකුගේ නම සමග හෝ ඇතුළු වී සිටින යම් පුද්ගලයෙකු සමග හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂකවරයාට හැඟියන හේතු නිසා හෝ කොන්ත්‍රාත්තුව භාරදීම නුසුදුස්සකු ලෙස සලකා ඔහු විසින් විරෝධය දක්වන කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

15. මේ පිළිබඳ වැඩි විස්තර බතලගොඩ වී පර්යේෂණ ස්ථානයේ කළමනාකාර තැනගෙන් දැනගත හැකිය.

ඩී. සී. එල්. අමරසිංහ,
වැඩ බලන කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1965 සැප්තැම්බර් මස 17 වැනි දා,
පේරාදෙණියේ දී.

9–1043—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

කටු කම්බි සහ කම්බි ඇණ සැපයීම සඳහා දැනට ඇති තොගවලින් 1965 ඔක්තෝබර් මස 8 වෙනි සිකුරාදා සවස 2.00 දක්වා මිල ගණන් භාරගනු ලැබේ. කටු කම්බිවල වර්ගය හා ගේජ් එකද දැනට ඇති තොගයෙන් ඉක්මණින් සැපයිය හැකි ප්‍රමාණයන්, දුම්රිය ගාස්තු නොමැතිව කොළඹ මිළ, වෙළඳ ආයතන විසින් පැහැදිළි වශයෙන් සඳහන් කළ යුතුය.

2. ගේජ් 14 සහ 12½ සඳහ වෙන් වෙන් වශයෙන් විස්තර සැපයිය යුතුය.

3. මිල ගණන් බහාලන කවරයේ "කටුකම්බි සහ ඇණ සඳහා මිල ගණන්" යනුවෙන් සඳහන් කර, ලියාපදිංචි කළ තැපැලෙන් කොළඹ 7, එඩින්බරෝ චන්ද්‍රවංකයේ අංක 42, ගොවිජන සේවා කොමසාරිස් තැන වෙත එවීම හෝ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීම කළ හැක.

4. මිල ගණන් එවන විට එම කටුකම්බිවල අගල් 12ක පමණ සැම්පල් කැල්ලක් ද එවිය යුතුය.

5. අඩුම මිළ ගණනයන් හෝ වෙනත් මිල ගණනයන් හෝ සෑම මිල ගණනයන් පිළිගැනීම හෝ නොපිළිගැනීම පිළිබඳව ගොවිජන සේවා කොමසාරිස් තැනගේ තීරණය අවසාන තීරණයයි.

6. ගොවි ද්‍රව්‍ය නිපදවීමේ හා අලෙවි කිරීමේ සමූපකාර සමිති සහ විවිධ සේවා සමූපකාර සමිති කටු කම්බි ඉල්ලා ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ අවස්ථාවල පමණක් ඇණවුම් පත්‍ර ම විසින් එවන බැවින් ඇත්ත වශයෙන්ම අවශ්‍ය වන කටුකම්බි ප්‍රමාණය සඳහන් කළ නොහැක.

7. තවත් විස්තර අවශ්‍ය වන්නේ නම් එම විස්තර මේ කාර්යාලයෙන් ලබාගත හැක.

ම. ද. සි. විජේනායක,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
42, එඩින්බරෝ චන්ද්‍රවංක,
කොළඹ 7,
1965 සැප්තැම්බර් 18 වෙනි දින.

9–1006—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාතීමේන්තුව

### ත්‍රිකුණාමලයේ සහකාර ගොවිජන සේවා කොමසාරිස් කායාීලය අළුත්වැඩියා කිරීම

කොළඹ 7, එඩින්බරෝ චන්ද්‍රවංක, අංක 42 දරණ ස්ථානයෙහි පිහිටි ගොවිජන සේවා දෙපාතීමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1965 ඔක්තෝබර් මස 15 වෙනි සිකුරාදා අ. භා. 2.30 වනතෙක් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. කොළඹ 10, ඩීන්ස් පාරේ 336 දරණ ස්ථානයෙහි පිහිටි ගොවිජන සේවා දෙපාතීමේන්තුවෙන් රු. 50.00 (රුපියල් පනහක) මුදල් තැන්පත් කර ලබාගන්නා ලද මුදල් තැන්පත් කිරීමේ කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ලබාගන්නා ලද ෆෝර්ම දෙකකින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. මේ මුදල් තැන්පත් කිරීම කොළඹ 7, හෝර්ටන් පෙදෙස, අංක 60 දරණ ස්ථානයෙහි පිහිටි ගොවිජන සේවා දෙපාතීමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි වෙත හෝ කොළඹින් බැහැර පිහිටි කිනම් දිසාපති කායාීලයක වුවද තැන්පත් කළ හැක.

3. රු. 25,000.00 ට හෝ ඊට වැඩියෙන් රජයේ කොන්ත්‍රාත් කිරීමේ බලය ලත් කොන්ත්‍රාත්කරුවන්ට ඔවුන්ගේ "කොන්ත්‍රාත් වාතීා පොත" ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් ෆෝර්ම 1965 ඔක්තෝබර් මස 15 වෙනි දින දවල් 12 වනතෙක් නිකුත් කරනු ලැබේ. තැපැල් මගින් ටෙන්ඩර් පත් ඉල්ලුම් කරන්නන් කල් වේලා ඇතිව ඒවා ඉල්ලුම් කිරීමෙන් ටෙන්ඩර් කැඳවන අවසාන දිනට හෝ වේලාවට ප්‍රථමයෙන් ඉදිරිපත් කළ යුතුය.

කේ. සිත්තම්බලම්,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

ගොවිජන සේවා දෙපාතීමේන්තුව,
336, ඩීන්ස් පාර,
කොළඹ 10,
1965 සැප්තැම්බර් මස 24 වැනි දින.

9–1034—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### නියමිත මිල යෝජනා ක්‍රමය හා විකෙටීම

කොළඹ එඩින්බරෝ චන්ද්‍රවංක අංක 42 ස්ථානයෙහි ගොවිජන සේවා දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් මරදනේ පිහිටි පියුනිසියා ගබඩාවට හොඳ පරන බුසල් 2½ (දෙකහමාර) ගිස් ගෝනි 50,000 ක් සැපයීම සඳහා කැඳවනු ලබන ටෙන්ඩර් 1965 ඔක්තෝබර් 8 වැනි සිකුරාදා අ. භා. 2.30 තෙක් භාරගනු ලැබේ.

2. දිවයිනේ කච්චේරියකට හෝ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අංක 60, හෝර්ටන් පෙදෙස කාර්යාලයේ ගණකාධිකාරිතැනට රු. 200 ක තැන්පත් මුදලක් ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සියක් අංක 42, එඩින්බරෝ චන්ද්‍රවංක කාර්යාලයේ ටෙන්ඩර් අංශයට ඉදිරිපත්කොට 1965 ඔක්තෝබර් 8 වැනි දින දවල් 12 වන තෙක් නිකුත් කරනු ලබන ටෙන්ඩර්පත් ලබාගෙන අනුපිටපතක් ද සහිතව පුරවා එවිය යුතුයි.

3. වැඩි විස්තර පහත සඳහන් කාර්යාලයෙන් හෝ පියුනිසියා ගබඩාවේ සැපයීම් අංශයේ ගණකාධිකාරිතැනගෙන් විමසා දැනගත හැක.

කේ. සින්නම්බලම්,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1965 සැප්තැම්බර් 24 වැනි දින,
කොළඹ 7, තැ. පෙ. 537,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුව.

9–1067—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## සුළු වාරි කර්මාන්ත

මෙම කාර්යාලයේ, පලාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් ගොවි මංඩල, විවිධසේවා සමුපකාර සමිති, ග්‍රාමසංවර්ධන සමිති හා කම්කරු සමිතිවලින් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

### නිට්ටඹුව ප්‍රා.ආ.නි. කොට්ඨාශය

1. හිස්සැල්ල ගොවි මණ්ඩල ප්‍රදේශයේ බටදොඹගහ ජලදොර තැනීම.
2. සමන්බැද්ද ගොවි මණ්ඩල ප්‍රදේශයේ පිටිවෙල වෙල්යායේ ඇල සුද්ධකිරීම.
3. දෙකටන ගොවි මණ්ඩල ප්‍රදේශයේ ඇල ප්‍රතිසංස්කරණය කිරීම හා කඩාංඹු පිරවීම.
4. කලල්පිටිය ගොවි මණ්ඩල ප්‍රදේශයේ කනත්තේ කුඹුර ජල දොර තැනීම.
5. කලල්පිටිය ගොවි මණ්ඩල ප්‍රදේශයේ තොටුපල කුඹුර ජලදොර තැනීම.

### කඳාන ප්‍රා.ආ.නි. කොට්ඨාශය

1. වල්පොල ගොවි මණ්ඩල ප්‍රදේශයේ වැව්ගොඩ පිට ඇල සුද්ධ කිරීම.
2. වල්පොල ගොවි මණ්ඩල ප්‍රදේශයේ මැද්දේගොඩ පිට ඇල හා දෙපා ඇල සුද්ධකිරීම.
3. ගලහිටියාව ගොවි මණ්ඩල ප්‍රදේශයේ වෙළකුඹුර හා වැටකෙයාගහ කුඹුර හරහා පැන්නුම් 2 ක් තැනීම.
4. කිරිඳිවිට ගොවි මණ්ඩල ප්‍රදේශයේ පනාගොඩ ඔයේ පැති බැම්ම සෑදීම.

### කඳාන ප්‍රා.ආ.නි. කොට්ඨාශය

1. සියඹලාපේ ගොවි මණ්ඩල ප්‍රදේශයේ මාදරාව ඇල දෙපස පැති බැමි බැඳීම.
2. කැන්දලියැද්දපාලුව ගොවි මණ්ඩල ප්‍රදේශයේ මහරදෙනිය හබදෙනිය ඇල සුද්ධ කිරීම.

### නුගේගොඩ ප්‍රා.ආ.නි. කොට්ඨාශය

1. පමුණුව—දෙපානම ගොවි මණ්ඩල ප්‍රදේශයේ පැටිකිරියා කුඹුර මැද ඇල සුද්ධකිරීම.
2. බත්තරමුල්ල—කලපලුවාව ගොවි මණ්ඩල ප්‍රදේශයේ වල්පොල වෙල මැද ඇල අළුත්වැඩියා කිරීම.

### හේවාගම් කෝරළයේ නැගෙනහිර ප්‍රා.ආ.නි. කොට්ඨාශය

1. කඩුගොඩ ගොවි මණ්ඩල ප්‍රදේශයේ වෙරලුපිටිය අමුණ අළුත් වැඩියා කිරීම.
2. කොස්ගම ඉහල ගොවි මණ්ඩල ප්‍රදේශයේ කැලගහ අමුන තැනීම.
3. හංවැල්ල ගොවි මණ්ඩල ප්‍රදේශයේ උඩආදාදොල අමුන තැනීම.
4. හංවැල්ල ගොවි මණ්ඩල ප්‍රදේශයේ දොඹගහ කුඹුර අමුණ තැනීම.

### හේවාගම්කෝරළයේ බටහිර ප්‍රා.ආ.නි. කොට්ඨාශය

1. පනාගොඩ නැගෙනහිර ගොවි මණ්ඩල ප්‍රදේශයේ පයිප්ප බෝක්කු 2ක් තැනීම.

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසි වලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1965 ඔක්තෝබර් මස 20 දින දවල් 12 දක්වා කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ, රු. 10ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිල ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචන වලින් ද දැක්විය යුතුය. මිල ගණන් හෝ ප්‍රමාණයන් ගණිත කුලව ද නිවැරදි විය යුතු අතර දක්වන ලද ගණන් වල සංශෝධනය කර තිබේ නම්, ඒ සෑමෙකක්ම, ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කළයුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොදා, සිල් තබන ලද කවරවල බහා, කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ, වම් කෙළවරේ "සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් කළයුතුය. ටෙන්ඩර් පත්‍ර, 1965 ඔක්තෝබර් මස 23 දින දවල් 12 ට පෙර කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියා පදිංචිකල තැපැලෙන් එවිය යුතුය. නොඑසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති "ටෙන්ඩර් පෙට්ටියට" දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර් කරුට ඒ බව කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නා වූ නිලධාරිතැන විසින් හෝ ලිය විල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම්දීම නිකුත් කළ දින සිට, දශ දිනක් ඇතුලත දී එම ටෙන්ඩර්කරු විසින් කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුලත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට 10ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම, රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයට ඇතුලත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාකරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමග නම ඇතුළත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැගෙන හේතූන් උඩ කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමග හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුලදී සැලසුම් පරීක්ෂා කර බැලීමට කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුලත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුලදී කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන් ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක් දැයි හොඳින් වටහා ගතයුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අයයි.

12. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමග ගිවිසුමකට ඇතුළත් විය යුතුය. "ගොවිජන සේවා සහකාර කොමසාරිස්" යනුවෙන් හැඳින් වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු වියයුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින්, බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1965 ඔක්තෝබර් මස 25 දින පෙ. ව. 9.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර් කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළහැක.

14. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

ඇම්. ඩී. අමරසිංහ,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
කොළඹ දිස්ත්‍රික්කය.

කොළඹ දිස්ත්‍රික්කයේ
ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැනගේ කාර්යාලය,
326, ඩීන්ස් පාර, මරදාන,
1965 සැප්තැම්බර් මස 20 වැනි දින දීය.

9–1069—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### මහඉලුප්පල්ලම පාසැල් ගොවිපළට කෙසෙල්පැළ සැපයීම

අනුරාධපුර නව නගරයේ ගොවිපළපාලන හා නිෂ්පාදන කාර්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් පහත විස්තර දක්වා ඇති කෙසෙල්පැළ සැපයීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත්‍ර 1965 ඔක්තෝබර් මස 20 වැනි දින පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

2. සැපයීම් පිළිබඳ විස්තර :—

| | | |
|---|---|---|
| (1) ඇඹුල් කෙසෙල්පැළ | ... | 8,000 |
| (2) කෝලිකුට්ටුපැළ | ... | 10,000 |

(i) පැළ ඉගිල්ලිය යුත්තේ, මා විසින් නම් කරනු ලබන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු ඉදිරිපිට දීය. එසේම රෝග නොමැති හොඳට වැඩී ඇති පඳුරුවලින් ඉගිල්ලිය යුතුය. ඉල්ලා ඇති ප්‍රමාණයෙන් ඒ ඒ වර්ග අනුව කොටසක් සඳහා වුවද ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

(ii) කෙසෙල්පැළ ගලවා දීමට අදහස් කරන වතුවල ලෙඩ රෝග නැති බවට පළාතේ කෘෂිකර්ම උපදේශක මහතාගෙන් සහතිකයක් අවශ්‍යය.

(iii) ටෙන්ඩර්කරුවන් විසින් ළඟම මහා මාර්ගයට ප්‍රවාහනය කරදීමට හෝ මහඉලුප්පල්ලම පාසැල් ගොවිපළට ගෙනැවිත් භාර දෙන බව සඳහන් කර ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුතුයි. ළඟම ඇති මහා මාර්ගයෙහි (ලොරියක් ගෙනයා හැකි තැනකට) ප්‍රවාහනය කරන්නේ නම්, ඒ පැළ දෙපාර්තමේන්තුවේ ලොරිවලට පටවා දිය යුතුය.

(iv) කෙසෙල්පැළ ගලවා ගැනීමට පෙර අප වෙත දැන්විය යුතුයි. ඊට පසු එම ස්ථානයට නිලධාරියා පැමිණ කෙසෙල් පැළ ගැලවීම ගැන ඔහු පරීක්ෂාකර සහතිකයක් දෙනවා ඇත. එම සහතිකයත් සමග එම පැළ ප්‍රවාහනකරුට භාරදිය යුතුය.

(v) කෙසෙල්පැළ සියල්ලම මෝරා තිබිය යුතුයි. අඩු වශයෙන් මාස 3 කට වඩා වයස් ගතවිය යුතුය. අඩු ගණනේ අලයකට අඟල් හයකට වඩා (6") විෂ්කම්භයක් තිබිය යුතුයි. අලය මුදුනේ සිට කඳ අඟල් 18 කට උඩින් කපා සැපයිය යුතුයි. පැළවල මුල් කපා සුද්ධකර භාරදිය යුතුයි. වර්ග දෙකෙන්ම පැළ සපයන්නේ නම්, මේ පැළ දෙයාකාරයකට ලකුණු කර දිය යුතුය. වෙනත් හේතූන් නිසා වගා කිරීමට නුසුදුසු කෙසෙල් පැළ භාරගනු නොලැබේ.

(vi) එක් ටෙන්ඩර්කරුවෙකුගේ එක් වර්ගයකින් පැළ 500 කට වඩා අඩු ප්‍රමාණයකට ඉල්ලුම් පත් භාරගනු නොලැබේ.

(vii) සපයන පැළ ලෙඩ රෝගවලින් තොරවූ, වගා වැවිළිවලින් පමණක් සැපයිය යුතුයි. යම්කිසි විධියකින් වඳ පීදීමේ රෝගය ඇති පැළ හෝ වෙනත් පැළ වංචනිය අන්දමට භාරදීමට තැත් කළහොත් ඔහුගේ සියළුම පැළ භාර නොගෙන එම ටෙන්ඩර්කරුගේ ටෙන්ඩරය අවලංගු කරනු ලැබේ.

(viii) 1965 නොවැම්බර් මස 1 වැනි ද සිට 1966 ජනවාරි මාසය අන්තිම දක්වා කාලසීමාව තුළදී දන්වා එවන පරිදි, ඒ ඒ වකවානුවලදී නියමිත පැළ ප්‍රමාණයන් මහඉලුප්පල්ලම පාසැල් ගොවිපළට සැපයිය යුතුය.

3. අනුරාධපුර නව නගරයේ ගොවිපළ පාලන හා නිෂ්පාදන කාර්යාලයේ පරිපාලන නිලධාරි තැනගෙන් ආකෘතිපත්‍ර ලබාගෙන ටෙන්ඩර්පත්‍ර ඒවායේ එවිය යුතුය. සියළුම ටෙන්ඩර්පත්‍ර ලියුම් කවරයක බහා මුද්‍රා තබා, අනුරාධපුර නවනගරයේ ගොවිපළ පාලනය හා නිෂ්පාදන කාර්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති නමට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. ටෙන්ඩර්පත්‍රයක් අනුපිටපතකින් යුක්ත වියයුතු අතර, ටෙන්ඩර්පත්‍රය බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ "මහඉලුප්පල්ලම පාසැල් ගොවිපළට කෙසෙල් පැළ සැපයීම සඳහා ටෙන්ඩර්" යන්න සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් එවීමට නොහැකි නම්, ඒවා අනුරාධපුර ගොවිපළ පාලනය හා නිෂ්පාදන කාර්‍යාලයේ පරිපාලන නිලධාරිට අතින්ම භාරදිය යුතුයි.

4. මහඉලුප්පල්ලම පාසැල් ගොවිපළට කෙසෙල් පැළ සැපයීම සඳහා ටෙන්ඩර්පත්‍රයක් ඉදිරිපත් කිරීමට ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් විසිපහක් (රු. 25) දිවයිනේ ඕනෑම කච්චේරියක හෝ පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්‍යාලයේ හෝ තැන්පත් කර ඒ වෙනුවෙන් ලබාගන්නා රිසිට් පත අනුරාධපුර ගොවිපළ පාලන හා නිෂ්පාදන කාර්‍යාලයේ පරිපාලන නිලධාරිට ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් ආකෘතිපත්‍රයක් ලබාගත හැක. ටෙන්ඩර්පත්‍ර භාර ගැනීමට නියමිත අවසාන දින දහවල් 12 දක්වා ටෙන්ඩර්පත්‍ර නිකුත් කරනු ලැබේ.

5. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුවාට ටෙන්ඩර්පත්‍රයේ සඳහන් වටිනාකමෙන් සියයට දහයක ඇප මුදලක් තැන්පත් කරන ලෙස දන්වනු ලැබේ. මෙම තැන්පත් කිරීම කච්චේරියක හෝ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පේරාදෙණියේ, ප්‍රධාන කාර්‍යාලයේ හෝ කළ හැක. ඇප තැන්පත් කරන ලෙස දන්වන ලිපියේ සඳහන් දින සිට දින 10ක් ඇතුළත ඇප තැබීමට කොන්ත්‍රාත්කරුට නොහැකි වුවහොත් ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කරන අතර, ටෙන්ඩර්කරුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවටද ඇතුළත් වීමට ඉඩ ඇත.

6. ඇප තැන්පත් කළ පසු අනුරාධපුර ගොවිපළ පාලනය හා නිෂ්පාදන කාර්‍යාලයේ පරිපාලන නිලධාරි විසින් කෙසෙල් පැළ සැපයීම සඳහා දිනයක් දන්වනවා ඇත. එම නිලධාරිතැන විසින් දෙනු ලබන කාලය තුළදී කෙසෙල් පැළ සපයා අවසාන කළයුතු අතර, යම් හෙයකින් එසේ සැපයීම නොහැකි වුවහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක කිරීමට ඉඩ ඇත.

7. ටෙන්ඩර්පත්‍රයේ සඳහන් කරනු ලබන මිළ ගණන් යටත් පිරිසෙයින් සති තුනකටවත් වෙනස් නොවන ඒවා විය යුතුයි.

8. ටෙන්ඩර්පත්‍ර පැහැදිලිව ලියා තිබිය යුතු අතර, නියමිත ආකෘති පත්‍රයේ සඳහන් නොවන ටෙන්ඩර්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලිව තිබිය යුතුය. ඒවායේ යම් වෙනසක් කළහොත් ඒ තැන්වල කෙටි අත්සන තැබිය යුතුය.

9. ලියාපදිංචි කළ තැපැලෙන් එවන ලද ටෙන්ඩර්පත්‍ර ලැබුණ බව ටෙන්ඩර්පත්‍ර භාර ගැනීම අවසාන කිරීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත දන්වනු ලැබේ. පිළි නොගන්නා ලද ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල් නිදහස් කිරීමටද ඒ සමග කට යුතු කරනු ලැබේ.

10. පත්කරනු ලැබූ ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර්පත්‍රයේ සඳහන් වැඩ සඳහා ලාංකික කම්කරුවන් පමණක් යෙදවිය යුතුය.

11. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ එම ලැයිස්තුවේ නම සඳහන් වන කෙනෙකුගේ නම සමග නම සඳහන් වන හෝ ටෙන්ඩර් මණ්ඩලයට සැහේයයි පෙනීයන හේතු පිට ටෙන්ඩර් මණ්ඩලය විරුද්ධ වන කිසිවෙකුත් සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

12. යම්කිසි ටෙන්ඩර්පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර්පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේත් ටෙන්ඩර්පත්‍රයක කොටසක් පිළිගැනීමේත් සම්පූර්ණ බලය ටෙන්ඩර් මණ්ඩලය වෙත තබාගනු ලැබේ.

13. මේ පිළිබඳව වැඩි විස්තර අනුරාධපුර ගොවිපළ පාලනය හා නිෂ්පාදන කායඹාලයේ කෘෂිකම් නිලධාරිගෙන් විමසන්න.

ඩී. සී. ඇල්. අමරසිංහ,
කෘෂිකම් අධ්‍යක්ෂ.

1965 සැප්තැම්බර් 14 වැනි දින,
පේරාදෙණියේ, කෘෂිකම් දෙපාර්තමේන්තුවේ දීය.

9–906—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## හක්වටුනාඔය ඉඩම් සංවර්ධන ව්‍යාපාරයේ ඇති පරණ බඩු විකිණීම

කුරුණෑගල දිස්ත්‍රික්කයේ හක්වටුනාඔය ඉඩම් සංවර්ධන ව්‍යාපාරයේ ඇති පරණ ඉරාපු ලී, හිස් ටින් ආදී තවත් ද්‍රව්‍ය විකිණීම සඳහා ටෙන්ඩර් 1965 ඔක්තෝබර් මස 8 වෙනි දින දවල් 11 වන තෙක් කොළඹ එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ඉඩම් සංවර්ධන නිලධාරි විසින් භාර ගනු ලැබේ.

2. විකිණීම සඳහා ඇති බඩු වල ලැයිස්තුවක් ව්‍යාපාරය භාර නිලධාරීන්ගෙන් හෝ මගේ කාර්යාලයෙන් ඉල්ලුම් කිරීමෙන් ලබාගත හැකිය.

3. 1965 ඔක්තෝබර් මස 8 වෙනි දින පෙරවරු 10 වන තෙක් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මවල පිටපත් දෙක බැගින් ටෙන්ඩර් එවිය යුතුය. ටෙන්ඩර් පෝර්ම නිකුත් කිරීමට පෙර එම ව්‍යාපාරය වෙනුවෙන් රු. 25 ක මුදලක් කොළඹ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

4. සියළුම ටෙන්ඩර් කවරයක බහා සීල් තබා කවරයේ වම්පස උඩ කෙලවරේ "පරණ බඩු වලට ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කර කොළඹ එච්ලන් චතුරශ්‍රයේ, තැ. පෙ. 529, ඉඩම් සංවර්ධන නිලධාරි වෙත එවිය යුතුය. ටෙන්ඩර් කරුවාගේ නම සහ ලිපිනය කවරයේ වම්පස පහත කෙළවරේ සඳහන් කළ යුතුය. ටෙන්ඩර් එවිය යුත්තේ ලියා පදිංචි තැපැලෙනි. නැතහොත් කොළඹ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඒ වෙනුවෙන් තබා ඇති පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

5. 1965 ඔක්තෝබර් 8 වෙනි දින දවල් 11ට කොළඹ එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ දී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට වුවමනා නම් එවිට පෙනී සිටිය හැකියි. යම් ටෙන්ඩරයක් ප්‍රතික්ෂෙප කිරීම හෝ භාර ගැනීම අයිතිය ඉඩම් සංවර්ධන නිලධාරි සතුය.

6. ටෙන්ඩර් සාර්ථක වූ බව දන්වා දින 3 ක් ඇතුළතදී බඩු වලට සම්පූර්ණ මුදල් තැන්පත් කළ යුතු අතර, සතියක් ඇතුළත දී සියළුම බඩු ගෙන යා යුතුය. මෙසේ නොකළොත් ටෙන්ඩර් පෝර්ම වලට තැන්පත් කළ මුදල හෝ බඩු වලට තැන්පත් කළ මුදල හෝ රාජසන්තක කර බඩු වලට සුදුස්සක් ඉඩම් සංවර්ධන නිලධාරි විසින් කරනු ලැබේ.

7. ටෙන්ඩර් වල වෙනස් කළ තැන්වල ටෙන්ඩර් කරු විසින් කෙටි අත්සන තැබිය යුතුයි. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට පෙර විකිණීමට ඇති බඩු ටෙන්ඩර් කරුවන් විසින් පරීක්ෂා කර බලන ලෙස අවවාද කරනු ලැබේ. ව්‍යාපාරය භාර නිලධාරි හමුවී බඩු පරීක්ෂා කිරීමට වැඩ කරන දිනවල කටයුතු සලස්වා ගත යුතුය. තවදුරටත් විස්තර උවමනා නම් කොළඹ එච්ලන් චතුරශ්‍රයේ ප්‍රධාන කාර්යාලයේ ඉඩම් සංවර්ධන නිලධාරිගෙන් ලබාගත හැකිය.

ඒ. ඩබ්ලිව්. ගුණසිංහ,
ඉඩම් සංවර්ධන නිලධාරි,
ප්‍රධාන කාර්යාලය.

කොළඹ,
එච්ලන් චතුරශ්‍රයේ,
තැ. පෙ. 529,
ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ දීය.

9–996—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## ගම් 50 හේ විදුලි යෝජනා ක්‍රමයේ ගම් 41 ක ගෙවල් වයර් කිරීම (දළ වශයෙන් ඒකක 15,000 පමණ)

ඉහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1965 ක්වූ ඔක්තෝබර් මස 26 වන අඟහරුවාදා පූ. භා. 10 දක්වා ඉඩම්, වාරිමාර්ග සහ විදුලිය පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 500, කොළඹ) විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ මැකලම් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහි දී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100 ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන්ද රු. 5 ක මුදලක් ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන්ද, රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5 හේ මුදල ආපසු ගෙවනු නොලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් පෝර්ම වලයි. වර්ෂ 1965 ක්වූ ඔක්තෝබර් මස 22 වන දින අ. භා. 2 වන තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වර්ෂ 1965 ක්වූ ඔක්තෝබර් මස 26 වන අඟහරුවාදා පූ. භා. 10 ට ගාලු මුවදොර මහා ලේකම් කාර්යාලයේ නො. 355 හේ කාමරයේ පිහිටි ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවනට පෙනී සිටීමට අවසර ඇත.

ආර්. ඩබ්ලිව්. පීරිස්
වැ. බ. විදුලි කර්මාන්ත ප්‍රධාන කළමනාකාරතැන.

තැ. පෙ. 540,
කොළඹ 10,
1965 ක්වූ සැප්තැම්බර් මස 24 දින දීය.

9–956—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

7. ටෙන්ඩර් පත් විවෘත කිරීම.—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර් කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමග කලින් පිළියෙල කර ගත් දිනක මා විසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයකුගේ අනුමැතිය ඇතුව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකි ය.

8. ටෙන්ඩරයන්හි තීරණය.—ටෙන්ඩර් පත් තෝරා ගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් ෆෝරමයේ "බී" උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිල ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් ෆෝරමයෙහි "සී" උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිල ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිල ගණන හෝ එවකට වෙළඳ පොලේ පවතින මිල ගණන හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිලක් පවතී නම් එම පාලන මිල ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිල ගණන් කොතනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. තැන්පත් ඇපමුදල්.—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත සෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. බඩු බාහිරාදිය තබා ගැනීම.—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩා කර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නො ලැබේ.

12. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතු ද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුම් කොන්දේසි ද ටෙන්ඩර් කරුවන් විසින් සැලකිය යුතු ය.

වී. ඇ. පොන්සේකා,
සෞඛ්‍ය සේවා අධිකාරී, කුරුණෑගල.

සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලය,
කුරුණෑගල,
1965 සැප්තැම්බර් 18 දින දී ය.

## උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රුපියල් | (3) ඇප මුදල රුපියල් | (4) ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව | (5) ආහාර ප්‍රමාණය දළවශයෙන් — සේවකයන්ට: මාලු | මස් | කරවල | එළවළු | නොගෙවන රෝගීන්ට: මාලු | මස් | කරවල | එළවළු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අඹන්පොල මා. නි. | 100 | 300 | 1965.10.19 දින පෙ.ව. 10ට | 300 | 250 | 600 | 800 | 500 | — | 950 | 1,850 |

9-1004—65.9.21 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලීය "ටෙන්ඩර්" මණ්ඩලයේ සභාපති තැන විසින් කම්කරු නිවාස ජෝඩු දෙකක් (2) ත්‍රිකුණාමලේදී ඉදි කිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1965 ඔක්තෝබර් මස 22 වැනි සිකුරාදා පස්වරු 2.30 දක්වා බාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට එහි පැමිණිය හැකිය.

2. කොළඹ මැක්ලම් පාරේ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ මාර්ග හා වැඩ පිළිබඳ අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් (තැ. පෙ. 370) මේ සඳහා ෆෝර්ම කොළ ලබාගෙන සම්පූර්ණකොට, අනුපිටපතක් ද සමග එවිය යුතුයි. මේ සම්බන්ධයෙන් සියළු විස්තර මෙම නිලධාරි තැනගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලාගැනීමට පුළුවන.

3. 1965 ඔක්තෝබර් මස 8 වැනි සිකුරාදා පස්වරු 4 දක්වා රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ වැඩ සඳහා රුපියල් 40,000 කට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ හෝ මෙම මුදලට වඩා වටිනාකම් ඇති කොන්ත්‍රාත් වැඩක් දුම්රිය දෙපාර්තමේන්තුවට සතුටුදායක අන්දමින් අවසන් කර ඇති කොන්ත්‍රාත් කරුවනට පමණක් ඉහත සඳහන් ඉංජිනේරුතැන වෙත (අ) තමාගේ ලියා පදිංචි කිරීම පිළිබඳ ලියකියවිලිද (ආ) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල වන රුපියල් 50 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10 ක් ද තැන්පත් කර ලබාගත් රිසිට් පත්‍ර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම ලබා ගත හැකිය.

මෙම මුදල් තැන්පත් කළ යුත්තේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනගේ කාර්යාලයේදීය.

එන්. ඒ. වෛත්‍යලිංගම්,
ප්‍රධාන ඉංජිනේරු තැන,
ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව.

1965 සැප්තැම්බර් මස 20 දින,
කොළඹදීය,
(තැ. පෙ. 370).

9-1071—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ප්‍රවාහණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ "ටෙන්ඩර්" මණ්ඩලයේ සභාපති තැන විසින් 3 බී වර්ගයේ බංගලා 2ක් ත්‍රිකුණාමලයේ දී ඉදිකිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1965 ඔක්තෝබර් මස 20 වැනි බදාදා පෙරවරු 11 දක්වා බාර ගනු ලැබේ. එදිනම පස්වරු 2.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවනට එහි පැමිණිය හැක.

2. කොළඹ මැක්ලම් පාරේ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ මාර්ග හා වැඩ අංශයේ ප්‍රධාන ඉංජිනේරුතැනගෙන් (තැ. පෙ. 370) මේ සඳහා ෆෝර්ම කොළ ලබාගෙන සම්පූර්ණකොට, අනුපිටපතක් ද සමග එවිය යුතුයි, මේ සම්බන්ධයෙන් සියළු විස්තර මෙම නිලධාරි තැනගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලාගැනීමට පුළුවන.

3. 1965 ඔක්තෝබර් මස 6 වැනි බදාදා පස්වරු 4 දක්වා රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ වැඩ සඳහා රුපියල් 50,000 කට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ හෝ මෙම මුදලට වඩා වටිනාකම් ඇති කොන්ත්‍රාත් වැඩක් දුම්රිය දෙපාර්තමේන්තුවට සතුටුදායක අන්දමින් අවසන් කර ඇති කොන්ත්‍රාත් කරුවනට පමණක් ඉහත සඳහන් ඉංජිනේරුතැන වෙත (අ) තමාගේ ලියා පදිංචි කිරීම පිළිබඳ ලියකියවිලිද (ආ) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල වන රු. 100 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10 ක් ද තැන්පත් කර ලබාගත් රිසිට් පත්‍ර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම ලබා ගත හැකිය.

මෙම මුදල් තැන්පත් කළ යුත්තේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනගේ කාර්යාලයේදීය.

එන්. ඒ. වෛත්‍යලිංගම්,
ප්‍රධාන ඉංජිනේරු තැන,
ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව.

1965 සැප්තැම්බර් මස 20 දින,
කොළඹදීය,
(තැ. පෙ. අංක 370).

9-1072—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ප්‍රවාහණ කටයුතු වැඩ පිළිබඳ අමාත්‍යාංශයේ "ටෙන්ඩර්" මණ්ඩලයේ සභාපති තැන විසින් ත්‍රිකුණාමල දුම්රිය මාර්ගයේ සැ. 182 ද. 65 අසලදී කම්කරු නිවාස ජෝඩු 5ක් ඉදිකිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1965 ඔක්තෝබර් මස 20 වැනි බදාදා පෙරවරු 11 දක්වා බාර ගනු ලැබේ. එදිනම පස්වරු 2.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවනට එහි පැමිණිය හැක.

2. කොළඹ මැක්ලම් පාරේ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ මාගී හා වැඩ අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් (තැ. පෙ. 370) මේ සඳහා පෝර්ම කොළ ලබාගෙන සම්පූර්ණකොට, අනුපිටපතක් ද සමග එවිය යුතුයි. මේ සම්බන්ධයෙන් සියළු විස්තර මෙම නිලධාරි තැනගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කායතීලයේදී බලාගැනීමට පුළුවන.

3. 1965 ඔක්තෝබර් මස 6 වැනි බදාදා පස්වරු 4 දක්වා රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ වැඩ සඳහා රුපියල් 75,000 කට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ හෝ මෙම මුදලට වඩා වටිනාකම් ඇති කොන්ත්‍රාත් වැඩක් දුම්රිය දෙපාර්තමේන්තුවට සතුටුදායක අන්දමින් අවසන්කර ඇති කොන්ත්‍රාත්කරුවනට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැන වෙත (අ) තමාගේ ලියාපදිංචි කිරීම පිළිබඳ ලියකියවිලිද (ආ) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල වන රු. 100 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10 ක්ද තැන්පත්කර ලබාගත් රිසිට් පත්‍ර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැකිය.

මෙම මුදල් තැන්පත් කළ යුත්තේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනගේ කායතීලයේදීය.

එන්. ඒ. වෛත්‍යලිංගම්,
ප්‍රධාන ඉංජිනේරු තැන,
ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව.

1965 සැප්තැම්බර් මස 20 දින,
කොළඹදීය,
(තැ. පෙ. අංක 370).

9-1075—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාතීමේන්තුව

සිලිංකෝ මන්දිරයේ, ප්‍රවාහණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ "ටෙන්ඩර්" මණ්ඩලයේ සභාපතිතැන විසින් ත්‍රිකුණාමල දුම්රිය මාර්ගයේ සැ. 167 ද. 35 අසලදී කම්කරු නිවාස ජෝඩු 5ක් ඉදිකිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1965 ඔක්තෝබර් මස 20 වැනි බදාදා පෙරවරු 11 දක්වා බාර ගනු ලැබේ. එදිනම පස්වරු 2.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවනට එහි පැමිණිය හැක.

2. කොළඹ මැක්ලම් පාරේ පිහිටි දුම්රිය දෙපාතීමේන්තුවේ මාගී හා වැඩ අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් (තැ. පෙ. 370 මේ සඳහා පෝර්ම කොළ ලබාගෙන සම්පූර්ණකොට, අනුපිටපතක් ද සමග එවිය යුතුයි. මේ සම්බන්ධයෙන් සියළු විස්තර මෙම නිලධාරි තැනගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කායතීලයේදී බලාගැනීමට පුළුවන.

3. 1965 ඔක්තෝබර් මස 6 වැනි බදාදා පස්වරු 4 දක්වා රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ වැඩ සඳහා රුපියල් 75,000 කට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ හෝ මෙම මුදලට වඩා වටිනාකම් ඇති කොන්ත්‍රාත් වැඩක් දුම්රිය දෙපාතීමේන්තුවට සතුටුදායක අන්දමින් අවසන්කර ඇති කොන්ත්‍රාත්කරුවනට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැන වෙත (අ) තමාගේ ලියාපදිංචි කිරීම පිළිබඳ ලියකියවිලිද (ආ) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල වන රු. 100 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10 ක්ද තැන්පත්කර ලබාගත් රිසිට් පත්‍ර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැකිය.

මෙම මුදල් තැන්පත් කළ යුත්තේ දුම්රිය දෙපාතීමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනගේ කාර්යාලයේදීය.

එන්. ඒ. වෛත්‍යලිංගම්,
ප්‍රධාන ඉංජිනේරු තැන,
ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව.

1965 සැප්තැම්බර් මස 20 දින,
කොළඹදීය,
(තැ. පෙ. අංක 370).

9-1076—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාතීමේන්තුව

ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාතීමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු කායතීලීය "ටෙන්ඩර්" මණ්ඩලයේ සභාපති තැන විසින් අරුවකාඩ්ගි කොට්ඨාශයේ මාගී පෝර්මන් සඳහා IV වගීයේ බංගලාවක් ..... තලමේදී ඉදිකිරීම පිණිස ටෙන්ඩර් පත්‍ර 1965 ඔක්තෝබර් මස 22 වැනි සිකුරාදා පස්වරු 2.30 දක්වා බාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී ටෙන්ඩර්කරුවනට එහි පැමිණිය හැකිය.

2. කොළඹ මැක්ලම් පාරේ පිහිටි දුම්රිය දෙපාතීමේන්තුවේ මාගී හා වැඩ පිළිබඳ අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් (තැ. පෙ. 370) මේ සඳහා පෝර්ම කොළ ලබාගෙන සම්පූර්ණකොට, අනුපිටපතක් ද සමග එවිය යුතුයි. මේ සම්බන්ධයෙන් සියළු විස්තර මෙම නිලධාරි තැනගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කායතීලයේදී බලාගැනීමට පුළුවන.

3. 1965 ඔක්තෝබර් මස 8 වැනි සිකුරාදා පස්වරු 4 දක්වා රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ වැඩ සඳහා රුපියල් 25,000 කට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ හෝ මෙම මුදලට වඩා වටිනාකම් ඇති කොන්ත්‍රාත් වැඩක් දුම්රිය දෙපාතීමේන්තුවට සතුටුදායක අන්දමින් අවසන්කර ඇති කොන්ත්‍රාත්කරුවනට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැන වෙත (අ) තමාගේ ලියාපදිංචි කිරීම පිළිබඳ ලියකියවිලිද (ආ) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල වන රුපියල් 25 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10 ක්ද තැන්පත්කර ලබාගත් රිසිට් පත්‍ර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැකිය.

මෙම මුදල් තැන්පත් කළ යුත්තේ දුම්රිය දෙපාතීමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනගේ කාර්යාලයේදීය.

එන්. ඒ. වෛත්‍යලිංගම්,
ප්‍රධාන ඉංජිනේරු තැන,
ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව.

1965 සැප්තැම්බර් මස 20 දින,
කොළඹදීය,
(තැ. පෙ. 370).

9-1077—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාතීමේන්තුව

ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාතීමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු කායතීලීය "ටෙන්ඩර්" මණ්ඩලයේ සභාපති තැන විසින් ගාල්ලේ නව දුම්රිය ස්ථාන ගොඩනැගිල්ල සඳහා ගැල්වනයිස් කළ වානේ දොරවල් සහ ජනේල සාදා සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1965 ඔක්තෝබර් මස 22 වැනි සිකුරාදා පස්වරු 2.30 දක්වා බාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී ටෙන්ඩර්කරුවනට එහි පැමිණිය හැකිය.

2. කොළඹ මැක්ලම් පාරේ පිහිටි දුම්රිය දෙපාතීමේන්තුවේ මාගී හා වැඩ පිළිබඳ අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් (තැ. පෙ. 370) මේ සඳහා පෝර්ම කොළ ලබාගෙන සම්පූර්ණකොට, අනුපිටපතක් ද සමග එවිය යුතුයි. මේ සම්බන්ධයෙන් සියළු විස්තර මෙම නිලධාරි තැනගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කායතීලයේදී බලාගැනීමට පුළුවන.

3. 1965 ඔක්තෝබර් මස 8 වැනි සිකුරාදා පස්වරු 4 දක්වා රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ වැඩ සඳහා රුපියල් 20,000 කට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ හෝ මෙම මුදලට වඩා වටිනාකම් ඇති කොන්ත්‍රාත් වැඩක් දුම්රිය දෙපාතීමේන්තුවට සතුටුදායක අන්දමින් අවසන්කර ඇති කොන්ත්‍රාත්කරුවනට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැන වෙත (අ) තමාගේ ලියාපදිංචි කිරීම පිළිබඳ ලියකියවිලිද (ආ) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල වන රුපියල් 25 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10 ක්ද තැන්පත්කර ලබාගත් රිසිට් පත්‍ර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැකිය.

මෙම මුදල් තැන්පත් කළ යුත්තේ දුම්රිය දෙපාතීමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනගේ කාර්යාලයේදීය.

එන්. ඒ. වෛත්‍යලිංගම්,
ප්‍රධාන ඉංජිනේරු තැන,
ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව.

1965 සැප්තැම්බර් මස 20 දින,
කොළඹදීය,
(තැ. පෙ. 370).

9-1078—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය

පහත සඳහන් භාණ්ඩ විකිණීම සඳහා අනු පිටපතකින් යුත්, මුද්‍රා තබන ලද ටෙන්ඩර් 1965 ඔක්තෝබර් 5 වැනි දින ප. ව. 3 දක්වා මවිසින් බාරගනු ලැබේ.

(1) පාවිච්චි කරණ ලද ගැළුම් 45 හේ හිස් පීප්ප 6,000 ක් පමණ. (සුළු තොග සඳහා එවන ටෙන්ඩරද බාරගනු ලැබේ.)

(2) ගැළුම් 5—5½ ධාරිතාවයකින් යුත් හිස් ඇසිඩ් ජාර (විශාල බෝතල) 223 ක් පමණ. (සුළු තොග සඳහා ටෙන්ඩර්ද බාරගනු ලැබේ.)

මෙම භාණ්ඩ, කන්තලේ සීනි කම්හලේදී පරීක්‍ෂාකර බැලිය හැක. පීප්ප හා ඇසිඩ් ජාර මුළු තොගය සඳහාම හෝ එම තොගයේ කොටස් සඳහා ටෙන්ඩර් බාරගනු ලැබේ.

නැවත ආපසු ගෙවන රු. 200 ක මුදලක් ගෙවීමෙන් 1965 ඔක්තෝබර් මස 4 වැනි දින ප. ව. 3 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. මෙම මුදල ලංකා බැංකුවේ, කොළඹ යෝර්ක් වීථි ශාඛාවේ, අංක 33014 දරණ ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයේ ගිනුමට තැන්පත් කොට ලබා ගන්නා කුවිතාන්සිය ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර්පත් ලබාගත හැක.

මුද්‍රා තබන ලද ටෙන්ඩර, කොළඹ 4, ගාළුපාරේ අංක 746 දරණ ස්ථානයේ, කැල්ඩිකොට් ගොඩනැගිල්ලේ, ප්‍රථම මාලයේ පිහිටි ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයේ ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ යුතුය. නැතහොත් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයෙහි වම් කෙළවරේ උඩ කොටසේ "පීප්ප සහ වීදුරු ජාර මිළයට ගැනීම සඳහා ටෙන්ඩර" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු අතර ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුය. තවත් අවශ්‍ය විස්තර වේ නම්, ලේකම්තැනගෙන් ලබාගත හැක.

ආචාර්ය එරික් ඇල්. ෆොන්සේකා,
සභාපති.

ප්‍රථම මාලය,
කැල්ඩිකොට් ගොඩනැගිල්ල,
746, ගාලු පාර,
කොළඹ 4,
1965 සැප්තැම්බර් 16 දින.

9–1083—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## සමුපකාර තොග වෙළඳ සංස්ථාව

ස. තො. ස. ග්‍රෑන්ඩ්පාස් කුළු ගබඩාවේ ඇති තරමක් හානි වූ කුළු බඩු ද්‍රව්‍ය තොගයක් (මිරිස්, ඇටවගී, හිස්ගෝනි යනාදී) විකිණීම සඳහා මිල ගණන් 1965 සැප්තැම්බර් මස 30 දින සවස 2 දක්වා වැක්ෂෝල් වීදියේ අංක 21 දරන ස්ථානයේ පිහිටි ස. තො. ස. මූලස්ථානයේ සාමාන්‍යාධිකාරී තැන විසින් භාර ගනු ලැබේ.

ඉල්ලුම් පත්‍ර හා කොන්දේසි මැකලම් පාරේ අංක 109 දරණ ස්ථානයේ ස. තො. ස. කුළුබඩු දෙපාර්තමේන්තුවේ කළමනාකරු තැන වෙත රු. 150 ක් තැන්පත් කර 1965 සැප්තැම්බර් මස 29 දින දහවල් 12 වන තෙක් එම කාර්යාලයෙන් ලබා ගත හැකිය. මෙම බඩු ඉහත සඳහන් ගබඩාවේ භාරකරුගේ අවසර ඇතිව පරීක්‍ෂාකර බැලිය හැකිය.

කළමණාකාරතැන,
ස.තො.ස. කුළු බඩු දෙපාර්තමේන්තුව.

1965 සැප්තැම්බර් මස 14 දී,
ස. තො. ස. කුළුබඩු දෙපාර්තමේන්තුව,
අංක 109, මැකලම් පාර,
කොළඹ 10.

9–1028—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## සමුපකාර තොග වෙළඳ සංස්ථාව

### ත්‍රිකුණාමලයේ වරායේ සිට (චීන වරාය ඇතුළුව) ත්‍රිකුණාමලයේ ස.තො.ස. ගබඩාවලට හා දුම්රිය බඩු ගබඩාවලටත් කොළඹ ස.තො.ස. ගබඩාවලටත් සිමෙන්ති බෑම, පැටවීම සහ ප්‍රවාහනය කිරීම

ඉහත සඳහන් සේවාව සඳහා, 1965 සැප්තැම්බර් 29 වැනි බදාදා අ හා. 2 දක්වා කොළඹ 2, වොක්ෂෝල් වීදියේ අංක 21 දරණ ස්ථානයේ සතොස සාමාන්‍යාධිකාරී විසින් ටෙන්ඩර භාර ගනු ලැබේ.

අඩුම වශයෙන් ලොරි 10ක් අයිතිව තිබෙන සහ/හෝ ඕනෑම දිනයක කෙටි කාල දැන්වීමක් අනුව ඒවා සැපයිය හැකි, ප්‍රසිද්ධ ප්‍රවාහන කොන්ත්‍රාත්කරුවන්ගෙන් හෝ සමුපකාර සංවිධානවලින් පමණක් ටෙන්ඩර භාරගනු ලැබේ.

1965 සැප්තැම්බර් මස 29 වැනි බදාදා මධ්‍යහන 12ට හෝ ඊට පෙර, කොළඹ, මැකලම් පාරේ අංක 85 දරණ ස්ථානයේ සතොස ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කළමනාකරුගේ කාර්යාලයෙහි ටෙන්ඩර් ඇප මුදල වශයෙන් රු. 250 බැඳ, ඉල්ලුම් කිරීමෙන් ටෙන්ඩරය පිළිබඳ තුවත් විස්තර හා ටෙන්ඩර ෆෝර්මද ලබා ගත හැකිය.

සාමාන්‍යාධිකාරී,
සමුපකාර තොග වෙළඳ සංස්ථාව.

21, වොක්ෂෝල් වීදිය,
කොළඹ, 1965.9.16.

9–1029—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### කොළඹ වනාතමුල්ල අංක 1 දරණ නිවාස භූමියේ පස් පිරවීම සහ අතුරා තද කිරීම

වනාතමුල්ල අංක 1 දරණ නිවාස භූමියේ පස් පිරවීම සහ අතුරා තද කිරීම සඳහා ජාතික නිවාස ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින්, 1965 ඔක්තෝබර් 15 වැනි සිකුරාදා පෙරවරු 10 වනතුරු ටෙන්ඩර් බාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එදින එකී වේලාවට විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක.

පිටපත් දෙකකින් යුත්, ටෙන්ඩර් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ නිවාස කොමසාරිස් තැනගෙන් ලබාගත හැකිවා මෙන්ම, වැඩි විස්තරද ඔහුගෙන් ලබාගත හැක.

රජයේ ඕනෑම දෙපාර්තමේන්තුවක වැඩ සඳහා රු. 1,50,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි කරන ලද හා මෙවැනි පස් පිරවීමේ කාර්යයන් පිළිබඳ පළ පුරුද්දක්ද, අවශ්‍ය කාර්මික උපකරණද ඇති කොන්ත්‍රාත් කරුවෝ පමණක් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති. එම ලියාපදිංචි කරණ ලද සහතිකයත්, පළපුරුදු බවත් සහ ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත රු. 250 ක් තැන්පත් මුදලක් තැබූ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරණ අයවලුන්ට, 1965 ඔක්තෝබර් මස 12 වෙනි අඟහරුවාදා දවල් 12 වන තුරු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

ඊ. අයි. මුණසිංහ,
ජාතික නිවාස කොමසාරිස් වෙනුවට.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැපැල් පෙට්ටිය නො. 544,
කොළඹ 2,
1965 සැප්තැම්බර් 8 වෙනි දින.

9–924—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### කොළඹ වනාතමුල්ල අංක 3 දරණ නිවාස භූමියේ පස් පිරවීම සහ අතුරා තද කිරීම

වනාතමුල්ල අංක 3 දරණ නිවාස භූමියේ පස් පිරවීම සහ අතුරා තද කිරීම සඳහා ජාතික නිවාස ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1965 ඔක්තෝබර් 15 වැනි සිකුරාදා පෙරවරු 10 වනතුරු ටෙන්ඩර් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එදින එකී වේලාවට විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක.

පිටපත් දෙකකින් යුත්, ටෙන්ඩර් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ නිවාස කොමසාරිස් තැනගෙන් ලබාගත හැකිවා මෙන්ම, වැඩි විස්තරද ඔහුගෙන් ලබාගත හැක.

රජයේ ඕනෑම දෙපාර්තමේන්තුවක වැඩ සඳහා රු. 1,50,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි කරණ ලද හා මෙවැනි පස් පිරවීමේ කාර්‍යයන් පිළිබඳ පළපුරුද්දක් ද අවශ්‍ය කාර්මික උපකරණද ඇති කොන්ත්‍රාත් කරුවෝ පමණක් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති. එම ලියාපදිංචි කරණ ලද සහතිකයත්, පළපුරුදු බවත් සහ, ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත රු. 250 ක තැන්පත් මුදලක් තැබූ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරණ අයවලුන්ට 1965 ඔක්තෝබර් 12 වෙනි අඟහරුවාදා දවල් 12 වන තුරු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරණු ලැබේ.

ඊ. අයි. මුණසිංහ,
ජාතික නිවාස කොමසාරිස් තැන.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැපැල් පෙට්ටිය නො. 544,
කොළඹ 2.
1965 සැප්තැම්බර් 8 වෙනි දින.

9-925—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## රාජගිරියේ, කෝට්ටේ පළාත් ආණ්ඩු සහා ක්‍රීඩා භූමියේ නිවාස ක්‍රමයේ පාරක් සඳහා පස් පිරවීම

කෝට්ටේ, පළාත් ආණ්ඩු සහා ක්‍රීඩා නිවාස භූමියේ පාරක් සඳහා පස් පිරවීමට ජාතික නිවාස ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1965 ඔක්තෝබර් මස 15 වෙනි සිකුරාදා පෙරවරු 10 වනතුරු ටෙන්ඩර් බාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එදින එකී වේලාවට විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක.

පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවා මෙන්ම වැඩි විස්තර ද ඔහුගෙන් ලබා ගත හැක.

ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හා වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ වැඩ සඳහා රු. 15,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි කරන ලද කොන්ත්‍රාත් කරුවෝ පමණක් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති. එම ලියා පදිංචි කරන ලද සහතිකය සහ මෙම දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත රු. 25 ක තැන්පත් මුදලක් තැබූ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයවලුන්ට 1965 ඔක්තෝබර් මස 12 වෙනි අඟහරුවාදා දවල් 12 වන තුරු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

ඊ. අයි. මුණසිංහ,
ජාතික නිවාස කොමසාරිස් වෙනුවට.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැපැල් පෙට්ටිය නො. 544,
කොළඹ 2,
1965 සැප්තැම්බර් මස 9 වැනි දින.

9-964—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව

### යක්කල ලෝහ භාණ්ඩ කර්මාන්තශාලාවේ කැන්ටීම

ගම්පහ යක්කල පිහිටි ලෝහ භාණ්ඩ කර්මාන්තශාලාවේ සේවක යන්ගේ ප්‍රයෝජනය සඳහා කැන්ටීමක් පවත්වාගෙන යෑම පිණිස ලාංකිකයන්ගෙන් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

අවශ්‍ය ගොඩනැගිල්ල සහ උපකරණ සංස්ථාවෙන් සපයනු ඇත. තෝරාගනු ලබන ටෙන්ඩර්කරු ශ්‍රවණය කළහැකි කරමිණ වට යටත් පිරිසෙයින් අවුරුද්දක් වත් සේවය පවත්වාගෙන යා යුතුය.

සපයනු ලබන කෑම බීම ආදියේ මිළ ගණන් හා විස්තර ඇතුළත් ටෙන්ඩර්, සහතික ද සමග 1965 ඔක්තෝබර් මස 7 වැනි දින පෙරවරු 9.30 ට හෝ ඊට ප්‍රථම කොළඹ 5, හැව්ලොක් පාරේ 242, දරණ ස්ථානයේ, ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුය. සියළු විස්තර හා ටෙන්ඩර් කොන්දේසි පහත අත්සන් කරන්නාගෙන් ලබා ගත හැකිය.

ලේකම්.

242, හැව්ලොක් පාර,
කොළඹ 5.
1965 සැප්තැම්බර් 18.

9-1060/1—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

රත්නපුර පරණ රෝහල අ යුර්වේද රෝහලකට පරිවර්තනය කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1965 ඔක්තෝබර් මස 27 වෙනි බදාදා පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ.

2. රත්නපුරයේ ර. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1965 ඔක්තෝබර් මස 8 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 83,000 ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළවිට මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළහැකිය.

ටී. ගුණරත්නම්,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 1965. 9. 20.

9-1079/1—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

ත්‍රිකුණාමලයේ උසාවි ගොඩනැගිල්ලට එකතු කිරීම් සහ වැඩිදියුණු කිරීම් සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1965 ඔක්තෝබර් මස 27 වෙනි බදාදා පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ.

2. ත්‍රිකුණාමලයේ ර. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1965 ඔක්තෝබර් මස 8 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 90,000 ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළවිට මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළහැකිය.

ඒ. සී. වික්‍රමසිංහ,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 1965. 9. 20.

7-1079/2—65.9.24 දින අංක 14513 දරන ගැසට් පත්‍රය

### රජයේ වැඩ දෙපාර්තමේන්තුව

මොරටුව රෝහලේ නව පාලන ගොඩනැගිල්ල සහ සුලු සේවක නිවාස තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1965 ඔක්තෝබර් මස 27 වෙනි බදාදා පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ.

2. කොළඹ 7, වොරිංටන් චතුරශ්‍රයේ දකුණු කොළඹ ර. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලාගැනීමට පුළුවන.

3. වර්ෂ 1965 ඔක්තෝබර් මස 8 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 3,20,000 ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 250 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළවිට මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළහැකිය.

වී. ගුණරත්නම්,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදිය, 1965. 9. 20.

9-1079/3—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## බඩු බාහිරාදිය විකිණීම

### වසු පැටවුන් විකිණීම

බෝපත්තලාවේ සහ අඹේවෙල රජයේ ගොවිපල්වලින්, අයේෂියර් සහ ෆ්‍රිසියන් වර්ගවල ශුමුහුන් වසු පැටවුන් විකිණීමට ඇත. මිළදී ගැනීම සඳහා, පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, සත්ව පාලන නිලධාරිගෙන් ඉල්ලුම් කළ යුතුය.

ඩී. සී. එල්. අමරසිංහ,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
ඩියුක් වීදිය, කොළඹ 1,
1965.9.18.

9-1059—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

### වෙන්දේසියේ විකිණීමයි

ගුවන් විදුලි හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, මොරටුව, වෙලෝනාවෙහි පිහිටි රජයේ චිත්‍රපට ආයතනය

කම්මල් බඩු හා වෙනත් කාර්යාලයීය ද්‍රව්‍ය ඇතුලත් පාවිච්චි කළ නොහැකි ද්‍රව්‍ය රාශියක් මොරටුවේ, වෙලෝනාවේ පිහිටි රජයේ චිත්‍රපට ආයතනයේදී 1965 ඔක්තෝබර් මස 12 වෙනි දින ප. ව. 1.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. සාර්ථකවූ ඉල්ලුම්කරුවන් බඩුවල සම්පූර්ණ වටිනාකම ගෙවා එදිනට ප. ව. 4.30 ට ප්‍රථම ඒවා ඉවත් කරගත යුතුයි. මෙම ද්‍රව්‍ය වෙන්දේසිය පවත්වන දිනයේ පෙ. ව. 9.30 සිට ප. ව. 1.30 දක්වා, මොරටුවේ, වෙලෝනාවේ පිහිටි, රජයේ චිත්‍රපට ආයතනයේදී පරීක්ෂා කර බැලිය හැක.

වින්සන්ට් පණ්ඩිත,
ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්.

ගුවන් විදුලි කාර්යාලය,
කොළඹ 7.

9-907—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

### දැන්වීමයි

ගබඩාකොට තුබූ සම්භාණ්ඩයන් තොගයක් ඔක්තෝබර් මස 2 වැනිදා පස්වරු 1.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. මේවා අපගේ වැනරිශාලාවේදී පරීක්ෂා කළ හැකි අතර 4776 හා 3937 ටැලිෆෝන් කිරීමෙන් විස්තරද ලබාගත හැක.

කළමනාකාරතැන.

ලංකා සම්භාණ්ඩ සංස්ථා මණ්ඩලය,
115/1, කැළණිගඟ පාර,
කොළඹ 15.

9-1045—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

### කැලෑ දෙපාර්තමේන්තුව

#### දැව වෙන්දේසියේ විකිණීම

පුත්තලම අඩවියේ, ඇති බුරුත, පානක්කා, රුණි, පලු, මිල්ල, හල්මිල්ල හා කැළඹ කඳන් 207 කින් සමන්විත ඝණ අඩි 1,932.3ක් 1965 ඔක්තෝබර් 7 වන දින උදය 10ට පුත්තලම අඩවි කැලෑ කාර්යාලයේදී වයඹ දිසා වන නිලධාරි විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දැව වෙන්දේසියට පෙර ඉල්ලුම්කරුවන්ට පරීක්ෂා කර බැලිය හැක.

වැඩි විස්තර සඳහා පුත්තලම අඩවි කැලෑ නිලධාරි හෝ වයඹ දිසා කැලෑ නිලධාරි විමසන්න.

ස. මුත්තයියා,
වයඹ දිසාභාර කැලෑනිලධාරි.

තැ. පෙ. අංක 10,
දිසා කැලෑ කාර්යාලය,
කුරුණෑගල.
65.9.16

9-1016—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

### කැලෑ දෙපාර්තමේන්තුව

#### දැව වෙන්දේසියේ විකිණීමයි

බුරුත, හල්මිල්ල, පලු, රානෝ, හුලන්හික් යන වර්ගයෙන් කඳන් 132 කින් සමන්විත ඝන අඩි 1,320.4 ගොඩවල් 27 කින් යුත් දැව තොගයක් 1965 ඔක්තෝබර් මස 21 වෙනි බ්‍රහස්පතින්දා උදේ 10 ට කල්මුනේ මධ්‍යම දැව ගබඩාවේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉල්ලුම්කරුවන්ට දැව වෙන්දේසිකිරීමට පෙර පරීක්ෂාකර බැලිය හැක.

වැඩි විස්තර සඳහා පහත අත්සන් කරන මාගෙන් හෝ කල්මුනේ මධ්‍යම දැව ගබඩාකරුගෙන් හෝ විමසන්න.

කෙ. අරුල්වේල්වම්,
නැගෙනහිර දිසාවේ දිසා වන නිලධාරි.

1965.9.11 දින,
මඩකලපුව,
දිසා වන කායාලයේදිය.

9-1015—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## මඩකලපු දිස්ත්‍රික්කයේ තොටුපල රේන්ද විකිණීම—1965/66

1965 ඔක්තෝබර් 1 සිට 1966 සැප්තැම්බර් 30 දක්වා ඇති කාල පරිච්ඡේදය තුළ තොටුපල රේන්ද විකිණීම පිළිබඳ කොන්දේසිවලට යටත්ව, මඩකලපු දිස්ත්‍රික්කයේ මෙහි පහත සඳහන් තොටුපල ගෙවිය යුතු රේන්ද ලබා ගැනීමේ සහ අය කිරීමේ තනි අයිතිය මිල දී ගැනීම සඳහා ටෙන්ඩර් පත් මෙයින් කැඳවනු ලැබේ.

2. එක් එක් ටෙන්ඩර් පත්‍රය සඳහා රු. 100ක තැන්පත් මුදලක් ඕනෑම කච්චේරියක තැන්පත් කර ලබා ගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පත්‍රයට ඇමිනිය යුතුය. ඒ ඒ ටෙන්ඩර් පත්‍රය සම්බන්ධයෙන් රු. 100යේ මුදල තැන්පත් කළ බවට කුවිතාන්සිය මඩකලපු කච්චේරියේ දී ඉදිරිපත් කර ලබා ගත් පෝර්මවල ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම, සීල් තබන ලද ලියුම් කවරයක බහා, එම ලියුම් කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරේ ''මඩකලපු දිස්ත්‍රික්කයේ (තොටුපලේ නම) කිරාන් තොටුපළ රේන්දය සඳහා ටෙන්ඩර් '' යනුවෙන් සඳහන් කර, ටෙන්ඩර් පත් භාර ගැනීම අවසාන කිරීම නියම කර ඇති වේලාවට පෙර මඩකලපුවේ දිසාපති තැන වෙත ඉදිරිපත් කළ යුතුය.

4. 1965 ඔක්තෝබර් 11, සඳුද මෙහි පහත සඳහන් වේලාවල දී ටෙන්ඩර් පත් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසාන කරන වේලාවේ දී ටෙන්ඩර් පත් කරුවන් මෙම කච්චේරියට පැමිණ සිටිය යුතුය. සෑම ටෙන්ඩර් පත් කරුවෙකු විසින් ම ටෙන්ඩර් පත්‍රය ඉදිරිපත් කරනු ලබන කොන්ත්‍රාත්තුව කරගෙන යෑම සඳහා ධන ශක්තිය තිබෙන බවට සහතිකයක්, තම ප්‍රදේශයේ ආණ්ඩුවේ දිසාපති තැනගෙන් හෝ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගෙන් ලබාගෙන, ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේ දී ඉදිරිපත් කළ යුතුය. විවිධ සේවා සමුපකාර සමිති මගින් ඉදිරිපත් කෙරෙන ටෙන්ඩර් සඳහා එම සමිතියට මෙම කොන්ත්‍රාත්තුව නිසියාකාර ගෙන යෑමට මුදල් තත්ත්වය අතින් හැකියාවක් ඇති බවටත්, පහත ඡේදයේ සඳහන් ප්‍රකාර ටෙන්ඩර් පෝර්මයක් සමගම නියමිත ඇප මුදල සම්පූර්ණයෙන් ම තැන්පත් කිරීමට ශක්තියක් ඇදී බවටත්, තම ප්‍රදේශයේ සමුපකාර සංවර්ධන උප කොමසාරිස් තැනගෙන් ලබාගත් සහතිකයක් ද ඉදිරිපත් කළ යුතුය.

5. අයිතිය මිල දී ගත් බව ප්‍රකාශ කළ වහාම තෝරාගනු ලැබූ ටෙන්ඩර් පත්කරු විසින් තොටුපළ රේන්ද විකිණීම පිළිබඳ කොන්දේසි අත්සන් කර ඇප තැන්පත් මුදල වශයෙන්, මිල දී ගත් මුදලෙන් තුනෙන් පංගුවකට සමාන මුදලක් මඩකලපුවේ දිසාපති තැනට ගෙවිය යුතුය.

6. අයිතිය මිල දී ගත් තැනැත්තා වශයෙන් ප්‍රකාශ කරනු ලැබූ යම්කිසි ටෙන්ඩර් පත් කරුවෙක් කොන්දේසි අත්සන් කිරීමට ප්‍රතික්ෂෙප කළහොත් හෝ අවශ්‍ය ඇපය තැන්පත් කිරීමට අසමර්ථ වුවහොත් හෝ ඇප ඔප්පුව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මුදල තැන්පත් කිරීමට අසමර්ථ වුවහොත්, ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල අහිමිකරමින් ඉදිරියේ දී ආණ්ඩුවේ කිසිම කොන්ත්‍රාත්තුවක් කිරීමට නොහැකි ලෙස ප්‍රකාශ කරනු ලැබේ. මෙම කොන්දේසියට යටත්ව, තෝරාගත් ටෙන්ඩර් පත් කරු හෝ ටෙන්ඩර් පත් කරුවන් විසින් ඉහත සඳහන් පරිදි තොටුපල රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් කර ඇප මුදල තැන්පත් කළ පසු, ටෙන්ඩර් පත් කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු දෙනු ලැබේ.

7. කිසිම හේතුවක් සඳහන් නොකර ටෙන්ඩර් පත්‍රයක් හෝ ටෙන්ඩර් පත්‍ර සියල්ල ම හෝ ප්‍රතික්ෂෙප කිරීමේ බලය දිසාපති තැන වෙත පැවරී තිබේ.

8. දනට බෝට්ටු වැඩ කරන තොටුපලවලට බෝට්ටු සපයනු ලැබේ. ලබාගත හැකි අවස්ථාවල දී කුඩා බෝට්ටු (වල්ලම්) සපයනු ලැබේ. රජයෙන් සැපයීමට කුඩා බෝට්ටු නැති අවස්ථාවල දී, තොටුපලේ සාර්ථක ලෙස වැඩ කිරීම සඳහා, තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුවන් විසින්ම කුඩා බෝට්ටු සපයාගත යුතුය.

9. තොටුපළ රේන්ද කොන්දේසි අනුව, තැපැල් ගෙනයාම තැපැල් පණිවුඩකරුවන්, තොටුපළ කුලී ගෙවිය යුතු නැත. තෝරාගත් ටෙන්ඩර් පත් කරු, තැපැල් පණිවුඩකරුවන්ගෙන් තොටුපළ කුලී අයකළ නොයුතුයි.

10. අවශ්‍ය වැඩි විස්තර මඩකලපුවේ කච්චේරියෙන් ලබාගත හැක.

එස්. වේලුම්මයිලුම්,
මඩකලපු දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1965 සැප්තැම්බර්, 18 දින,
මඩකලපු කච්චේරියේදීය.

| කොටුපලේ නම | තොටුපල පිහිටි ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය | ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන වේලාව |
|---|---|---|
| කිරාන් ... | කෝරලේ පත්තු ... | පස්වරු 11.00 |

9–1003—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## ප්‍රසිද්ධ ඉඩම් වෙන්දේසියක්

මාතර දිස්ත්‍රික් උසාවියේ දීය

දෙවුන්දර ලයිට්හවුස් පාරේ පදිංචි මිගෙල්රත්න කොඩිප්පිලි ආරච්චිගේ ලැන්ටි නොහොත් ලැන්ටි මිගෙල්රත්න ............. ................................................ පෙත්සම්කරු.

නො. එක්ස්ටේල් 138 එදිරිව

කැලණියේ ස්ටේෂන් පාරේ පදිංචි මිගෙල්රත්න කොඩිප්පිලි ආරච්චිගේ ඩේවිඩ් හැන්ඩි නොහොත් හැන්රි මිගෙල්රත්න සහ තවත් ............................................ වගඋත්තරකරුවෝ.

ඉහත කී නඩුවෙන් මට ලැබී තිබෙන බලය පරිදි මෙහි පහත සඳහන් දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ මහජනයා අතරේ වර්ෂ 1965 ක් වූ ඔක්තෝබර් 2 පස්වරු 3.30 ට සහ 4 ට එම ස්ථානයේ දී විකුණනු ලැබේ.

එනම් :—දකුණු පලාතේ මාතර දිස්ත්‍රික්කේ වැල්ලබඩ පත්තුවේ දෙවිනුවර ලයිට්හවුස් පාරේ පිහිටි ජී. අමරසේන අවසරලත් මිනින්දෝරු මහත්මයා විසින් සහතික කරන ලද නො. 2302 දරණ 8. 12. 1964 දාතමින් යුත් ප්ලෑන කඩදාසියේ සඳහන් බණම්ඩුව වත්තේ නො. 1 දරණ කැබැල්ලට මායිම් උතුරට එම ඉඩමේ නො. 2 දරණ කැබැල්ලද, නැගෙනහිරට එම ඉඩමේ නො. 4 දරණ කැබැල්ල ද, දකුණට ඇහැලගහකොරටුව ද, බස්නාහිරට ලයිට්හවුස් පාර ද යන මායිම් තුල පර්චස් දෙකක් විශාල වූ ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිල්ල ද වේ.

**තක්සේරු මුදල රුපියල් 8,000**

2. ඉහත කී දෙවිනුවර ලයිට් හවුස් පාරේ පිහිටි එකී ප්ලෑන කඩදාසියේ සඳහන් බණම්ඩුව වත්තේ නො. 2 දරණ කැබැල්ලට මායිම් උතුරට එම ඉඩමේ නො. 3 දරණ කැබැල්ල ද, නැගෙනහිරට එම ඉඩමේ නො. 4 දරන කැබැල්ල ද, දකුණට නො. 1 දරණ කැබැල්ල ද, බස්නාහිරට ලයිට් හවුස් පාරද යන මායිම් තුල පර්චස් දෙකයි දශම එකයි බිංදුවක් විශාල ඉඩම සහ එහි තිබෙන ගොඩනැගිල්ල ද වේ.

**තක්සේරු මුදල රුපියල් 8,000 යි. මුළු මුදල රුපියල් 16,000 යි.**

විකිණීමේ කියවා දෙන කොන්දේසි පරිදි වෙන්දේසි උනි නම් තමන් ගන්නා ලද මුදලින් 1/4 පංගුවත් සමග කොමසාරිස් තැනගේ සියලුම ගාස්තු ගෙවිය යුතුයි. තවද කොන්දේසි ඔප්පු සහතික කිරීමේ මුද්දර ගාස්තුව සහ නීතිඥ මහතුන්ගේ ගාස්තුව ද එවෙලේ ගෙවිය යුතුයි. ඉතිරි මුදල විකිණීමේ දින සිට දින 30 ඇතුලත උසාවියට ගෙවිය යුතුයි. මේ සම්බන්ධ වැඩි විස්තර නීතිඥ මහින්ද සිරිවර්ධන මහතාගෙන් හෝ මගෙන් විමසන්න.

ජාන් ද සිල්වා සපුකොටන,
උසාවියේ කොමසාරිස් තැන සහ
ප්‍රසිද්ධ වෙන්දේසි කැර තැන.

හිත්තටිය, මාතර.

9–797—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

**සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිඩ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුද පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දයක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දයක මුදල් භාරගනු නොලැබේ.**

ර/E 3/65

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය සම්බන්ධයි

## ආධුනික සහකාර පොලිස් අධිකාරීන් ලෙස පත් කරනු ලැබීම සඳහා අපේක්ෂකයින් තේරීම — 1965

### නිවේදනය

1. (අ) ආධුනික සහකාර පොලිස් අධිකාරීවරුන් තෝරාගැනීම සඳහා 1966 ජනවාරි මාසයේ පමණ ලිඛිත යෝග්‍යතා පරීක්ෂණයක් පවත්වනු ලැබේ. මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගනු ලබන අපේක්ෂකයින් තුන් අවුරුදු ආධුනික කාලයක් ගතකළ යුතුවේ.

(ආ) පත්වීම් දීම සඳහා ගණන් බලා ඇති ඇබෑර්තු ගණන තුනකි. මෙම ඇබෑර්තු අතරින් එකක් හෝ ඒ සියල්ලම වුවද මහජන යහපත උදෙසා පිරවිය යුතු නොවේයයි රාජ්‍ය සේවා කොමිෂන් සභාව කල්පනා කරන්නේ නම් එම ඇබෑර්තුවට/හෝ ඇබෑර්තුවලට පත්වීම් නොකරනු ඇත.

2. ඉහතකී ලිඛිත යෝග්‍යතා පරීක්ෂණය 1966 ජනවාරි මාසයේ පමණ කොළඹදී පැවැත්වේ. ඒ පිළිබඳ නියම දිනය අපේක්ෂකයන් වෙත පසුව දැනුම් දෙනු ලැබේ.

3. **ඉල්ලුම්පත් ඉදිරිපත් කරන ක්‍රමය :**—(අ) අවශ්‍ය සුදුසුකම් සහිත අපේක්ෂකයින් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාගෙන් ඉල්ලා සිටින පරිදි ඔවුන් වෙත මෙම පරීක්ෂණය පිළිබඳ රෙගුලාසි සහ ඉල්ලුම්පත් එවනු ලැබේ. එසේ ලබාගත් ඉල්ලුම්පත් ඉල්ලුම්කරු විසින් තම අත් අකුරින්ම පුරවා 1965 ඔක්තෝබර් මස 22 වන දින හෝ එදිනට පෙර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත ලැබෙන පරිදි කොළඹ, තැ. පෙ. අංක 500 යනුවෙන් ලිපිනයකර එවිය යුතුය. එදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් සලකා බලනු නොලැබේ.

(ආ) ඉහතකී අන්දමින් සපයන ලද ඉල්ලුම් පතෙහි අපේක්ෂකයා විසින් තම වෘත්තිය සහ සුදුසුකම් පිළිබඳ සියලු විස්තර පිරවිය යුතුය. ඔහු විසින් මෙම ඉල්ලුම් පතෙහි තම චරිතය සහ හැකියාව පිළිබඳ පුද්ගලික දැනීමක් ඇති දෙදෙනෙකු නම් කළ යුතුය. ඔහු විසින් සුදුසුකම් ලත් වෛද්‍යවරයෙකු ගෙන් තම උස, පපුවෙහි ප්‍රමාණය සහ අඩුම ඇස් පෙනීම පිළිබඳ විස්තර දැක්වෙන වෛද්‍ය සහතිකයක් ද ලබාගත යුතුය. ශාරීරික වර්ධනය පිළිබඳ වෙනත් විශේෂ කරුණු ඇතොත් ඒ පිළිබඳ විස්තර ඉල්ලුම් පතෙහි ඊට නියම ස්ථානයේ සඳහන් කළ යුතුය.

ඉල්ලුම්පත සම්පූර්ණ කොට මතු දැක්වෙන ලියකියවිලි ද (පිටපත් සමග) රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙහි ලේකම්වරයා වෙත එවිය යුතුය—

(i) උප්පැන්න සහතිකය (උපකෘත පාඨශාලා සම්බන්ධ නීති සංග්‍රහය උදෙසා නිකුත් කරන ලද උප්පැන්න සහතික පිළිගනු නොලැබේ.)

(ii) පහත දැක්වෙන 5 (iii) වැනි වගන්තිවලින් අපේක්ෂා කරන අධ්‍යාපන සහතිකය.

(iii) පාසැල්වලින් ලබාගත් ඒවාද ඇතුළුව සහතිකපත් සතරකට නොවැඩි ගණනක්, එම සහතික අතුරින් අඩු වශයෙන් එකක්වත් තම අධ්‍යයන උපදේශකවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් ලබාගත් ඒවා විය යුතුය.

ඉහත කී ලියවිලිවල පිටපත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ කාර්යාලයේ තබාගෙන එම ලියවිලි ආපසු එවනු ලැබේ.

4. මෙම දැන්වීමෙහි ප්‍රකාර සුදුසුකම් ලබා ඇති දනට රජයේ සේවයේ නියුක්ත රජයේ නිලධාරීන් විසින් එවනු ලබන ඉල්ලුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මඟින් ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනයට පෙර මෙම කාර්යාලයට ලැබෙන ලෙස එවිය යුතුය.

5. උචිතතාව පිළිබඳ කොන්දේසි :—

(i) මෙම පරීක්ෂණය සඳහා ඉල්ලුම්පත් එවන අපේක්ෂකයන් පිරිමින් සහ ලාංකිකයන් විය යුතුය. මෙම පරීක්ෂණය සඳහා ලාංකික යනුවෙන් අදහස් කරන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියකු වීමය.

(ii) අපේක්ෂකයින් වයස අවුරුදු 22 සම්පූර්ණකර සිටිය යුතු අතර, 1965 අගෝස්තු මස 1 වැනි දිනට වයස අවුරුදු 26 සම්පූර්ණ කර නොසිටිය යුතුය.

(iii) ඔහු පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයකු විය යුතුය.

(iv) ඔහු යහපත් චරිතයක් ඇත්තෙකු විය යුතුය.

(v) ඔහු අවිවාහකයකු විය යුතුය.

(vi) ඔහු මනා සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතු අතර, දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීම සඳහා සුදුසු තත්ත්වයක ද සිටිය යුතුයි.

(vii) ඔහුගේ ඇස් පෙනීම 6/6 සහ 6/12 අතර විය යුතු අතර, වර්ණ පෙනීම සාමාන්‍ය තත්ත්වයෙන් පැවතිය යුතුය. උපැස් පාවිච්චිය අවශ්‍යවන අපේක්ෂකයින් මෙම පරීක්ෂණ සඳහා පෙනී සිටීම සුදුසු නොවේ.

6. **ලිඛිත යෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවසර :**—අපේක්ෂකයින් විසින් ලිඛිත යෝග්‍යතා පරීක්ෂණය සඳහා පෙනී සිටීම පිණිස රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ලිඛිත නාමයෝජනා පත්‍ර ලබාගැනීම අවශ්‍ය වේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මේ සඳහා විශේෂයෙන් පත් කරනු ලබන මණ්ඩලයක් විසින් ඉහතකී නාම යෝජනා පත්‍ර භාරදීම සම්බන්ධයෙන් කොමිෂන් සභාවට උපදෙස් දෙනු ඇත. අවශ්‍ය වුවහොත් මණ්ඩලය ඉදිරියේ පෙනී සිටීම පිණිස ඕනෑම අපේක්ෂකයකු කැඳවනු ඇත. එසේම නාම යෝජනා පත්‍ර භාරදීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙහි පරම අභිමතය අනුව කෙරෙන්නකි. එවැනි තීරණයක් සම්බන්ධයෙන් මොනයම් හෝ ඉල්ලීමක් උඩ හේතු දැක්වීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව සූදානම් නැත.

7. **පරීක්ෂණ පරිපාටිය** :—ලිඛිත යෝග්‍යතා පරීක්ෂණය සඳහා වූ විෂයයන් සහ ඒ ඒ විෂයයන් සඳහා වෙන් කරන ලද ලකුණු ප්‍රමාණය මෙසේය :—

| | | ලකුණු |
|---|---|---|
| (1) | වාක්‍ය රචනය සහ සාරාංශය ලිවීම ... ... | 150 |
| (2) | සාමාන්‍ය ඥානය ... ... ... | 150 |
| (3) | ලංකාවේ සමාජ දේශපාලන සහ ආර්ථික සංවර්ධනය ... | 150 |

අපේක්ෂකයන්ගේ කැමැත්ත පරිදි මෙම ප්‍රශ්න පත්‍රවලට සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි හෝ යන කැමැති භාෂා මාධ්‍යකින් වුවද පිළිතුරු සැපයීමට ඉඩ දෙනු ලැබේ. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයට පසු සඳහන් කර ඇති භාෂා මාධ්‍යයේ වෙනසක් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

සෑම ලිඛිත ප්‍රශ්න පත්‍රයක් සඳහාම පැය දෙකක කාලයක් දෙන අතර, ඒ පිළිබඳ නිර්දේශ මතු දැක්වේ :—

**වාක්‍ය රචනය සහ සාරාංශය ලිවීම.**—දෙන ලද මාතෘකාවක් අතරින් තෝරාගත් එක් මාතෘකාවක් ගැන වාක්‍ය රචනයක් ලිවීම සහ ගද්‍ය කොටස් එකක් හෝ ඊට වැඩි ගණනක් අපේක්ෂකයාගේම වචනවලින් එහෙත් ඉතා කෙටියෙන් ප්‍රකාශ කිරීම, වාක්‍ය රචනය පිළිබඳව තීරණයකට එළඹෙන්නේ එහි භාෂාව, සම්ප්‍රදාය සහ කරුණු දක්වන පිළිවෙල අනුව මෙන්ම අපේක්ෂකයා විසින් තමන් තෝරාගත් මාතෘකාවට විෂයවූ කරුණු සම්බන්ධයෙන් දක්වන අදහස් සහ උත්පාදන ශක්තියද යන කරුණු සැලකීමෙනි.

**සාමාන්‍ය ඥානය.**—අපේක්ෂකයාගේ සාමාන්‍ය ඥානය පිරික්සීම පිණිස පිළියෙල කරන ලද ප්‍රශ්න පත්‍රයකි. විශේෂ නිර්දේශ පත්‍රයක් නියම කොට නොමැත.

**ලංකාවේ සමාජ, දේශපාලන සහ ආර්ථික සංවර්ධනය.**—වර්තමාන ලංකාව පිළිබඳව විශේෂයෙන් සැලකිලිමත්ව සමාජ, දේශපාලන සහ ආර්ථික සංවර්ධනය පිළිබඳව මෙම ප්‍රශ්න පත්‍රය අදාල වනු ඇත. විශේෂ නිර්දේශ පත්‍රයක් නියම කොට නොමැත.

8. ලිඛිත යෝග්‍යතා පරීක්ෂණයෙන් අනතුරුව :—

(අ) ප්‍රාථමික සම්මුඛ පරීක්ෂණයක්, සහ

(ආ) අවසාන සම්මුඛ පරීක්ෂණයක් ද පැවැත්වේ.

(i) ලිඛිත යෝග්‍යතා පරීක්ෂණයේදී නියමිත තත්ත්වයකට (රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කෙරෙන) පැමිණෙන අපේක්ෂකයෝ ප්‍රාථමික සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබත්.

(ii) අපේක්ෂකයන් විසින් ප්‍රාථමික සම්මුඛ පරීක්ෂණයේදී ලබන ප්‍රතිඵල හා ඔවුන්ගේ වාර්තාද අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඔවුහු අවසාන සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබත්.

(iii) අවසන් විශිෂ්ටත්ව පිළිවෙල පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අවසාන සම්මුඛ පරීක්ෂණයේදී තීරණය කරනු ඇත. තේරීම සිදු කිරීමේ දී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අපේක්ෂකයාගේ වාර්තාව, බුද්ධිය, චරිතය, පුද්ගලික යෝග්‍යතාවය, සාමාන්‍ය අධ්‍යාපනය, පුහුණුව සහ පළපුරුද්දක් ඇතොත් එයද පොලිස් සේවයට බඳවා ගැනීමට ඇති යෝග්‍යතාවය ද යන කරුණු සැළකිල්ලට ගනු ලැබේ.

කොමිෂන් සභිකයින් විසින් තම අභිමතය පරිදි තීරණයකට එළඹීම සඳහා අවශ්‍යයයි සලකතොත්, තමන් ඉදිරියෙහි දෙවැනි වරටත් පෙනී සිටින ලෙස අපේක්ෂකයකුගෙන් ඉල්ලා සිටිය හැක.

9. **ගාස්තු** :—ලිඛිත යෝග්‍යතා පරීක්ෂණය සඳහා ගාස්තුව රු. 40 කි. එම පරීක්ෂණ ගාස්තුව ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනයට ප්‍රථම කිට්ටුම ඇති කච්චේරියෙහි හෝ කොළඹ මහා භාණ්ඩාගාරයෙහි තැන්පත් කළ යුතුය. එය 6 වැනි වැය ශීර්ෂයේ 3 වැනි උප ශීර්ෂයේ 4 වැනි විෂයට බැර කළ යුතුය. කච්චේරියේ හෝ භාණ්ඩාගාරයෙන් ලබාගත් රිසිට් පත් ඉල්ලුම්පතට ඇමිණිය යුතුය.

ලිඛිත නාම යෝජනා භාරදීමෙන් පසු කිනම් වේලාවක හෝ මොනයම් හේතුවක් උඩ හෝ තම ඉල්ලුම්පත ඉල්ලා අස්කර ගන්නා හෝ ලිඛිත යෝග්‍යතා පරීක්ෂණයට පෙනී නොසිටින්නාවූ හෝ අපේක්ෂකයෙකු ගෙවන ලද පරීක්ෂණ ගාස්තුව සම්පූර්ණ වශයෙන් හෝ එයින් කොටසක් හෝ ආපසු ලැබීමට හිමිකම් නොලබයි. පරීක්ෂණයට පෙනී සිටීම සඳහා නාම යෝජනා නොදෙනු ලබන අපේක්ෂකයනට සම්පූර්ණ පරීක්ෂණ ගාස්තු ආපසු ගෙවනු ලැබේ.

10. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවද අයථා අනුග්‍රහයන් ලබා ගැනීමකට හෝ බලපෑමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වන්නේය.

11. **වෛද්‍ය පරීක්ෂණය** :—තෝරාගනු ලබන අපේක්ෂකයන් විසින් දිවයිනේ ඕනෑම පළාතක පොලිස් නිලධාරියකු ලෙස සේවය කිරීම සඳහා ඔවුන් සතුව ඇති ශාරීරික යෝග්‍යතාවය පිළිබඳ වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් නොවන කිසිම අපේක්ෂකයකු පත් කරනු නොලැබේ.

12. ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ 1 වැනි කොටසෙහි (ii) වැනි ඡේදයේ මුලින්ම පළව ඇති රාජ්‍ය සේවාවෙහි තනතුරුවලට අදාල පත්වීම පිළිබඳ පොදු කොන්දේසිවලට ද සැළකිල්ල යොමු කරමි.

**ඩී. ආර්. එල්. බාලසූරිය**
**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.**

1965 සැප්තැම්බර් මස 17 වන දින,
කොළඹ, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.

සැලකිය යුතුයි.— ඉල්ලුම් පත්‍රයේ ආකෘතිය ඉංග්‍රීසි දැන්වීම කෙළවරේ පළ වී ඇත.

ලංකාවේ වැලව්වේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි